# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையம

# National Library & Documentation Centr



## ජාතික පුස්තකාල සතිය - සමරු කලාපය

## தேசிய நூலக வாரம் - ஞாபகார்த்த மலர

## National Library Week - Commemorative Volum

2009.05.12 - 15

2nd floor.

ජාතික පුස්තකාල සතිය

2009 මැයි 12 - 15

# සමරු කලාපය

## ජාතික පුස්තකාල සතිය

## 2009 මැයි 12 - 15

# සමරු කලාපය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ජාතික පුස්තකාල සතිය 2009 සමරු කලාපය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
ප්‍රථම මුද්‍රණය - 2009
ISBN 978-955-8383-50-6

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ජාතික පුස්තකාල සතිය 2009 : සමරු කලාපය.- කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2009.- පි. 163 : රූපසටහන් ; සෙමී 21.

ISBN 978-955-8383-50-6 මිල: රු.200.00

අක්ෂර සංයෝජනය : අසෝකා දමයන්ති
පිටකවර නිර්මාණය : රුචිනි දිල්රුක්ෂි
මුද්‍රණය : සමයවර්ධන මුද්‍රණාලය, අංක 53, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත, මරදාන, කොළඹ 10.
ප්‍රකාශනය : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අංක 14, නිදහස් මාවත, කොළඹ 07.

# පෙරවදන

ජාතික පුස්තකාල සතිය වැඩ සටහන නිමිත්තෙන් සම්පාදනය කරන සමරු කලාපය සඳහා පෙරවදනක් සැපයීමට ලැබීම සතුටට කරුණකි. ජාතික පුස්තකාල සතිය වැඩ සටහන තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු ගණනාවකි. ජාතික පුස්තකාල සේවාවන් ජනතාව අතර ප්‍රචලිත කිරීම, විවිධ වැඩසටහන් තුළින් ජනතාව ගේ දැනුම වර්ධනය කිරීම, පුස්තකාල සංවර්ධනය, පුස්තකාලයාධිපතීන්, ලේඛකයන් ආදී ග්‍රන්ථ ක්ෂේත්‍රයේ විද්වතුන් ඇගයීමට ලක්කිරීම, කියවීම ප්‍රවර්ධනය මෙහි ප්‍රධාන අරමුණු වේ. මේ සඳහා පුස්තකාල හා අනෙකුත් සම්බන්ධිත ආයතන සම්බන්ධ කර ගැනීම තුළින් පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රබෝධයක් ඇති කිරීමට ද මේ තුළින් අපේක්ෂා කෙරේ.

ජාතික පුස්තකාල සතිය නිමිත්තෙන් පළ කරන සමරු කලාපය විවිධ විද්වතුන් රචනා කරන ලද අගනා ලිපිවලින් සමන්විත වේ. පුස්තකාල ක්ෂේත්‍රයේ මෙන් ම ලේඛන සංරක්ෂණ ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ මෙන් ම ජාතික පුස්තකාල පාඨක අදහස් ඇතුළත් ලිපි ද මෙහි අන්තර්ගත වේ. පුස්තකාල සංවර්ධනය, ජාතික පුස්තකාල සේවා, ග්‍රන්ථ විඥාපන සේවා, ලේඛන කළමනාකරණය, ග්‍රන්ථ සංරක්ෂණය, ජාත්‍යන්තර සහයෝගීතාව, ග්‍රන්ථ සංවර්ධනය ආදී පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ විවිධ පැති අළලා සම්පාදනය කරන ලද ලිපි මෙහි ඇතුළත් වේ. මෙම ග්‍රන්ථය පුස්තකාලයාධිපතීන්ටත් පුස්තකාල විද්‍යාව හදාරන සිසුන්ටත්, සාමාන්‍ය පාඨකයින්ටත් ප්‍රයෝජනවත් වේ යැයි අපේක්ෂා කරමි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් දක්වනු ලබන සහයෝගය මෙම අවස්ථාවේ දී කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙම සමරු කලාපය සඳහා ලිපි සපයන ලද විද්වතුන්ටත් එහි සම්පාදක මණ්ඩලයටත්, ජාතික පුස්තකාල සතිය වැඩසටහන සාර්ථක කර ගැනීමෙහිලා සහාය වූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.කේ. එම්.එම්. කේ. වීරසිංහ මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනමමි.

ඊ.ඒ. සමරසිංහ
සභාපති

# හැඳින්වීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන ජාතික පුස්තකාල සතිය නිමිති කරගෙන සමරු කලාපයක් නිකුත් කිරීමට හැකිවීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි. ඉතා දීර්ඝ කාලීන උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස 1990 අප්‍රේල් 27 දින විවෘත වූ මෙරට ජාතික පුස්තකාලය පසුගිය දශක දෙකකට ආසන්න කාලය තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. එසේ වුව ද නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ජාතික පුස්තකාලය වෙත තවදුරටත් පාඨක ප්‍රජාව ළංකර ගැනීමට කටයුතු කිරීම යුගයේ අත්‍යවශ්‍ය කාරණයක් බවට පත්ව ඇත.

පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ප්‍රවීන විචාරකයන්ට අනුව ලෝකයේ සෑම ජාතික පුස්තකාලයක් ම පාහේ දැඩි අර්බුදයකට ලක්ව ඇති අතර මෙරට ජාතික පුස්තකාලයට ද එය පොදු ධර්මතාවක් බවට පත්ව ඇත. කුමන බාධක මාධ්‍යයේ වුව ද මෙරට ජාතික පුස්තකාලය පාඨක ප්‍රජාවගේ බුද්ධිමය නිම්වලලු පුළුල් කිරීමේ කාර්ය උදෙසා කරනු ලබන්නේ ප්‍රශස්ත සේවයකි. මෙම සේවාව පිළිබඳව ජනතා අවධානය වර්ධනය කරලීමේ අරමුණින් සංවිධානය කර ඇති ජාතික පුස්තකාල සතිය 2009 මැයි මස 12 සිට 15 දක්වා කාලය තුළ ජාතික පුස්තකාල පරිශ්‍රයේ දී පැවැත්වීමට නියමිත ය.

ජාතික පුස්තකාල සතිය නිමිත්තෙන් සම්පාදනය කරන ලද මෙම සමරු කලාපය කාලෝචිත ලිපි රැසකින් සමන්විත වේ. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ මෙරට ප්‍රවීනයෝ රැසක් ඒ සඳහා දායකත්වය ලබා දී ඇත.

ජාතික පුස්තකාල කාර්යයන්, ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධනය, ජාතික පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය, ජාතික පුස්තකාලයේ අනාගත සංවර්ධනය, ජාත්‍යන්තර සහයෝගිතාව ප්‍රවර්ධනය, ලේඛන සංරක්ෂණය, ග්‍රන්ථ විඥාපන පාලනය ආදී පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩ නියෝජනය වන ආකාරයට ලිපි ඉදිරිපත් කර ඇත. සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන් ම ලිපි ඇතුළත් කර තිබීම මෙහි අගය තවදුරටත් වැඩි කිරීමට හේතු වී ඇත. ලිපි සම්පාදනය කළ විද්වතුන්ටත් සමරු කලාපය සම්පාදනය කළ සම්පාදක මණ්ඩලයටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

ඩබ්.කේ.එම්.එම්.කේ. වීරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පටුන


| | පිටු |
|---|---|
| පෙරවදන | i - ii |
| හැඳින්වීම | iii - iv |
| 1. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ඉදිරි ගමන් මග<br>ඩබ්.කේ.එම්.එම්.කේ. වීරසිංහ | 1 - 11 |
| 2. Role of National Library and Documentation Centre in the Bibliographic Control in Sri Lanka<br>Prof. Jyasiri Lankage | 12 - 33 |
| 3. පුස්තකාල සංවර්ධනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ඉටු කෙරෙන සේවාවන් - නාලිනී මල්ලවආරච්චි | 34 - 48 |
| 4. මණ්ඩලයීය ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මගින් මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා ලබා දී තිබෙන දායකත්වය - ඩබ්ලිව්. සුනිල් | 49 - 62 |
| 5. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලේඛන කළමනාකරණයේදී හා සංරක්ෂණයේදී මුහුණදෙන අභියෝග<br>කේ.ඩී.ජී. විමලරත්න | 49 - 62 |

6. ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා
ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය
කිරීමෙහිලා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන 74 - 81
සේවා මණ්ඩලයේ කාර්යභාරය - ජී.ඩී. අමරසිරි

7. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ
කාර්ය භාරය පිළිබඳ හැඳින්වීමක් 82 - 97
විජය ප්‍රේමදර්ශන

8. இலங்கை தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபையும் அதன் 98 -113
செயற்பாடுகளும் - Mrs. T. Sritharan

9. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය හා ජාතික
එකතුවක් ගොඩ නැගීම 114 -125
සේනානි දීපිකා බණ්ඩාර

10. දේශීය දැනුම (Indigenous Knowledge)
සුරැකීමෙහිලා - ජාතික පුස්තකාලයේ ජනශ්‍රැති 125 - 146
එකතුවෙහි දායකත්වය - චන්ද්‍රිමා වාදසිංහ

11. ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය කිරීමට
ගතයුතු නව ක්‍රියාමාර්ග - උදය ප්‍රසාද් කබ්රාල් 147 - 156

12. ප්‍රඥාවේ මහා මන්දිරය : ශ්‍රී ලංකා ජාතික
පුස්තකාලය - නුවරඑළියේ හේමපාල 157 - 159

ලේඛක එකතොන 160 - 161

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ඉදිරි ගමන් මග

**ඩබ්.කේ.එම්.එම්. කේ. වීරසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජාතික පුස්තකාල පිළිබඳ අදහස ලොවට උරුම වූයේ 16 වන ශතවර්ෂයේ දී වුවත් 21 වන ශතවර්ෂය ආරම්භ වන විට එය ජාත්‍යන්තර තොරතුරු ප්‍රවාහයේ මුඛ්‍යතම ආයතනයක් බවට පත්ව අවසානය. දියුණු මෙන් ම දියුණු වෙමින් පවතින සෑම රටක් ම පාහේ සිය ජාතික පුස්තකාල උදෙසා සුවිශේෂී අවධානයක් යොමුකර ඇත්තේ සිය ජාතියේ අනන්‍යතාව මතු පරපුර උදෙසා සංරක්ෂණය කරලීමේ දැවැන්ත ව්‍යායාමය ජාතික පුස්තකාලයන් හි එක් මුඛ්‍ය පරමාර්ථයක් වී ඇති නිසාය. සාම්ප්‍රදායික පුස්තකාල සංකල්පය අභිබවා ගිය ජාතික පුස්තකාලය පර්යේෂණ මධ්‍යස්ථානයක් සේම සිය උරුමය ලොවට හඬගා කියන සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස ද උත්කෘෂ්ඨ සේවාවක් ඉටු කරනු ලබයි. ලෝකය දිනෙන් දින දියුණුව කරා පා නගන්නේ නව පර්යේෂණයන්හි ප්‍රතිඵලවල මහිමය නිසාමය. පර්යේෂණයක් ජීවමාන වනතාක් කල් ලෝකය ආපසු ගමන් කරන්නේ ද නැත. පර්යේෂණ දිරිමත් වන තරමට ඕනෑම රටක සංවර්ධනය වේගවත් වන බව අමුතුවෙන් කිවයුතු නැත. අවශ්‍ය වෙලාවට අවශ්‍ය පුද්ගලයාට අවශ්‍ය තොරතුරු ලබා දීමට සෑම රටකම පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සමත් විය යුතුය. සංවර්ධනයේ ප්‍රවේගී බව රදා පවත්නා සාධකයක් ලෙස විධිමත් තොරතුරු කළමනාකරණය දැක්විය හැකිය.

සෑම ජාතියක ම මහා ඥාන කෝෂ්ඨාගාරය ලෙස ජාතික පුස්තකාලය සිය රටේ සංවර්ධන ක්‍රියාවලියේ දී අනුපමේය දායකත්වයක් ලබාදිය යුතුය. විශේෂයෙන් පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු ප්‍රතිග්‍රහණය කර ගනිමින් නව විශ්ව ඥානය උදෙසා ඔවුනට ප්‍රවිශ්ඨ වීමට

මඟ පෙන්වීම් ජාතික පුස්තකාලයකින් මුලින් ම සිදුවිය යුතුය. මේ කාර්ය විධිමත් ලෙස කළහැකි වන්නේ පරිපූර්ණ ජාතික එකතුන් ජාතික පුස්තකාලයන්හි ස්ථානගතවී තිබුණහොත් පමණි. ලොව බොහෝ ඉසුරුමත් රාජ්‍යයන්හි ජාතික පුස්තකාලයන් පිරි ගොස් ඇත්තේ මෙවන් ජාතික එකතුන්ගෙනි. ලොව විශාලතම ජාතික පුස්තකාලය වන කොංග්‍රස් පුස්තකාලයේ මුලු එකතුව මිලියන 130 ක් පමණ වන අතර බ්‍රිතාන්‍ය පුස්තකාලයේ එකතුව මිලියන 150 ක් පමණ වේ. මේ සෑම පුස්තකාලයක් ම පාහේ ජාතික එකතුන් ගොඩනංවා ඇති අතර එම රටවල පර්යේෂකයන් ට ඒවා ක්ෂේම භූමි බවට පත් ව ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය 1990 දී විවෘත වූයේ දීර්ඝ කාලීන උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසිනි. ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාලයන් හා සසඳා බලද්දී මෙරට ජාතික පුස්තකාලයට හිමි වී ඇත්තේ ඉතා කෙටි ඉතිහාසයකි. වෙනත් ජාතික පුස්තකාලයන් මෙන් ඓතිහාසික ග්‍රන්ථ එකතුවකට මෙන්ම ජාතික එකතුන්ට ද මෙරට ජාතික පුස්තකාලය හිමිකම් නොකියන්නේ මෙම ළදරු ඉතිහාසය නිසාමය. යුරෝපයේ ජාතික පුස්තකාල පද්ධතීන්ගෙන් බොහෝ ජාතික පුස්තකාලවල ජාතික මෙන්ම ඓතිහාසික එකතුන් ද දැකිය හැකි වන්නේ එම ජාතික පුස්තකාල පරිණාමය වී තිබෙන්නේ එම රටවල රාජකීය පුස්තකාල තුළින් නිසාය.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය 1990 වසරේ බිහි වුව ද නව සැලසුම් ඔස්සේ ඉදිරියට යෑමේ ප්‍රවණතාව පසුගිය කාලය මුළුල්ලේ ම දැකිය නො හැකිය. ලෝකයේ අන් ජාතික පුස්තකාල සිය, දැක්ම, මෙහෙවර කාලෝචිතව වෙනස් වෙමින් නව ව්‍යාපෘති සැලසුම් සකස් කරමින් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඉදිරියට යමින් සිටී. ඒ අනුව මෙරට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ද නව සැලසුම් ඔස්සේ ඉදිරියට පා නැඟිය යුතු කාලය එළැඹ ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය උදෙසා යෝජිත සැලසුම් පහත දක්වා ඇත.

## 01. සංස්කෘතික ජාතික පුස්තකාලයක් ඇති කිරීම
## Establishment of a Cultural National Library

ජාතික පුස්තකාලයක් යනු ජාතියේ සංස්කෘතික මධ්‍යස්ථානයකි. සෑම රටකම විවිධ ජාතීන් සතු සංස්කෘතික හරයන් මතු පරපුර උදෙසා සංරක්ෂණය කරලීම ජාතික පුස්තකාලයේ වගකීමකි. සෑම රටක් ම පාහේ විවිධ ජන කොට්ඨාසවලින් සමන්විත වේ. එමෙන් සුවිශේෂිත වූ ජන කොට්ඨාසයන්ගේ සංස්කෘතික ලක්ෂණ සුරක්ෂිත කිරීම අරමුණු කරගත් සංස්කෘතික ජාතික පුස්තකාල, ලෝකයේ අනෙක රටවල බිහිවී තිබේ. මෙයට හොඳම උදාහරණයක් ලෙස එංගලන්තයේ වේල්සයේ ජාතික පුස්තකාලය දැක්විය හැකිය. එහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ වේල්සයේ ජීවත් වන ජනතාවගේ සංස්කෘතික හරයන් මතු පරපුර උදෙසා සංරක්ෂණය කර ලීමය. දීර්ඝකාලීන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිමවෙමින් පවතින මෙවන් වකවානුවක සංස්කෘතික ජාතික පුස්තකාලය මෙරට උතුරු නැගෙනහිර ප්‍රදේශ උදෙසා බිහිකිරීම අතිශයින් කාලෝචිතය. මෙරට ජනගහනයෙන් 18% ක් පමණ වූ ද්‍රවිඩ ජනතාවගේ සංස්කෘතිය හර පද්ධතිය සංරක්ෂණය කරලීම උදෙසා සංස්කෘතික ජාතික පුස්තකාලයක් මෙරට බිහිකළ යුතුය. ඒ සඳහා හොඳම ස්ථානය ලෙස යාපනයේ මහජන පුස්තකාලය නම් කළ හැකි ය. මේ කාර්ය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අවශ්‍ය උපදෙස් සැපයිය යුතුය.

## 02. නව තැන්පතු පුස්තකාලයක් ඇති කිරීම
## Creation of a New Deposit Library

මෙරට මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතට අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව නීතිමය තැන්පතු පුස්තකාලය බවට නම් කර ඇත. ඊට අමතර ව තැන්පතු පුස්තකාල ලෙස ජාතික කෞතුකාගාර පුස්තකාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය

පුස්තකාලය, ජාතික පුස්තකාලය සහ බ්‍රිතාන්‍ය පුස්තකාලය නම් සාප ඇත. වර්ෂ 1990 පමණ සිට බ්‍රිතාන්‍ය පුස්තකාලය වෙත යවනු ලබන තැන්පතු පිටපත ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව රඳවා ගෙන ඇත. මේ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය හැරුණු විට තැන්පතු පිටපත් 04 ක් ම ස්ථානගත වී ඇත්තේ අගනුවර වර්ග කිලෝමීටරයක් තුළය. විශේෂයෙන් දිවයිනේ උතුරු නැගෙනහිර පළාත්වල පාඨක ප්‍රජාව උදෙසා එවැනි තැන්පතු පුස්තකාලයක් පිහිටුවා නොමැත. එබැවින් අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු කාර්ය වන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් වී ඇති තැන්පතු පිටපත් 2 න් එකක් උතුරු නැගෙනහිර පළාත්වල පාඨක ප්‍රජාවගේ ප්‍රයෝජනය උදෙසා, යෝජිත සංස්කෘතික ජාතික පුස්තකාලය වෙත යැවීමට කටයුතු කිරීමය. මේ සඳහා අවශ්‍ය උපදෙස් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සැපයිය යුතු ය.

## 03. ජාතික උරුම සංරක්ෂණ විද්‍යාගාරයක් පිහිටුවීම
## Establishment of a National Heritage Preservation Laboratory

මෙරට විසිර පවතින සංස්කෘතිකමය වටිනාකමක් සහිත ලේඛන සංරක්ෂණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළයුතු අතර ඒ සඳහා උචිත විද්‍යාගාරයක් ජාතික පුස්තකාල භූමිය තුළ ඉදි කළයුතුය. මෙම විද්‍යාගාරය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාරය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යන ආයතන ත්‍රිත්වයේ ම සහයෝගීතා ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් විය යුතු අතර එම ආයතන තුන ම මේ සඳහා අරමුදල් සැපයිය යුතුය.

# 04. ජාතික කෞතුකාගාර පුස්තකාල එකතුව ජාතික පුස්තකාල ග්‍රන්ථ එකතුව ට ඒකාබද්ධ කිරීම

## Amalgamation of Library Collection of the National Museum

මෙරට ඇති විශාලතම ග්‍රන්ථ එකතුවට හිමිකම් කියනු ලබන්නේ 1877 පිහිටුවන ලද ජාතික කෞතුකාගාර පුස්තකාලයයි. 1877 සිට 1990 දක්වා කාලය තුළ මෙරට කෞතුකාගාර පුස්තකාලය ජාතික පුස්තකාලය මගින් ඉටුකළ යුතු ඇතැම් කාර්යයන් සපුරාලන ලදී. විශේෂයෙන් ම ජාතික වශයෙන් වැදගත් වූ එකතුන් රැසකට ජාතික කෞතුකාගාර පුස්තකාලය හිමිකම් කියනු ලබයි. සැබවින්ම මෙම එකතුන් සතුවිය යුත්තේ ජාතික පුස්තකාලයටය. මෙයට සමාන තත්ත්වයන් බ්‍රිතාන්‍යයේ ද දැකිය හැකි විය. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය බිහිවීමට පෙර එහි කාර්යන් ඉටු කරන ලද්දේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර ය මගිනි. 1973 බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය විවෘත වුයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයට එකතු කිරීමත් සමඟය. ඉන්දියානු ජාතික පුස්තකාලයේ පදනම වූයේ ඉපැරණි ග්‍රන්ථ එකතුන් ගෙන් සමන්විත වූ ඉන්දියානු ඉම්පිරියල් පුස්තකාලයයි. ඉන්දුනීසියානු ජාතික පුස්තකාලය බිහි වූයේ ඉන්දුනීසියානු කෞතුකාගාර පුස්තකාලය පදනම ලෙස යොදා ගනිමිනි. යුරෝපයේ බොහෝ ජාතික පුස්තකාල බිහිවූයේ එම රටවල රාජකීය පුස්තකාලවල එකතුන් ඒවායේ පදනම ලෙස යොදා ගනිමිනි. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ද මෙරට කෞතුකාගාර පුස්තකාලය අනුබද්ධ කරගත යුතු කාලය එළඹ ඇත.

## 05. ශ්‍රී ලංකාවේ මතකය - සංඛ්‍යාකරණ වැඩසටහන Memory of Sri Lanka

වසර 2500 කට වඩා වැඩි ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලාංකිකයන්ට ඇත්තේ අද්විතීය සංස්කෘතියකි. විශේෂයෙන් විවිධ යුගවලදී බිහිවූ තොරතුරු මූලාශ්‍ර අප සතුව පවතී. විශේෂයෙන් ආගමික ස්ථාන, කෞතුකාගාර, පුස්තකාල, ලේඛනාගාර ආශ්‍රිතව මෙම ලේඛන ස්ථානගතව ඇත. මෙරට සංස්කෘතික උරුමය ආරක්ෂා කරලීමටත් ඒ පිළිබඳව ලෝකයා දැනුවත් කරලීමටත්, අවශ්‍ය වෙලාවට අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර අවශ්‍ය පාඨකයාට ලබා දීමටත් කටයුතු කිරීම ජාතික පුස්තකාලය සතු මූලික වගකීමකි. එම වගකීම මැනවින් ඉටුකළ හැකි ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ මතකය වැඩසටහන දැක්විය හැකිය. මෙහි දි කරනු ලබන්නේ ඓතිහාසිකමය අගයකින් යුත් ලේඛන සංඛ්‍යාංකරණය තුළින් ඒ සඳහා ප්‍රවේශ වීමට අවස්ථාවන් ලෝකයේ සිව් දෙස සිටින පාඨක ප්‍රජාවට ලබා දීමය. දැනටමත් ලෝකයේ විවිධ ජාතික පුස්තකාල මෙවන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. උදාහරණයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ කොංග්‍රස් පුස්තකාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන American Memory හා නෙදර්ලන්තයේ ජාතික පුස්තකාල මගින් ක්‍රියාත්මක කරනු ලබන Memory of the Netherlands දැක්විය හැකිය.

## 06. ක්‍රමෝපාය සැලසුම්කරණය Stratesgic plan

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය බිහි වී වසර 19 ක් පමණ ගත වී ඇතත් ක්‍රමෝපාය සැලැස්මක් එහි වර්ධනය උදෙසා ඉදිරිපත් වී නො මැත. ඒ වෙනුවට දැකිය හැක්කේ සාම්ප්‍රදායික වාර්ෂික සැලසුම් පමණි. එබැවින් විධිමත් ක්‍රමෝපාය සැලැස්මක් තුළින් ජාතික පුස්තකාල වැඩ කටයුතු විධිමත් කිරීම.

## 07. ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම Dissaster Management

ජාතික පුස්තකාලය ජාතියේ දැනුම මතු පරපුර උදෙසා සුරකින මධ්‍යස්ථානයක් ලෙස හැඳින්වීම නිවැරදිය. විශේෂයෙන් ආපදා කළමනාකරණ සැලැස්මක් මෙරට ජාතික පුස්තකාලය සතු විය යුතුය. ත්‍රස්තවාදීන්ගෙන් රාජ්‍ය ආයතනවලට තර්ජනයක්ව පවතින මෙවන් සමයක මෙහි ඇති වැදගත්කම ඉතා වැඩිය. එහෙයින් මෙරට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය උදෙසා ආපදා සැලැස්මක් පිළියෙල කළ යුතුය.

## 08. ඇගයීම් දර්ශනයන් හැඳින්වීම Performance Indicators

ජාතික පුස්තකාලයේ අභිමත අරමුණු ඉටු කර ගැනීමේ කාර්යයේ දී ඇගයීම් දර්ශනයන් හඳුන්වාදීම තුළින් සිදුවන්නේ සුවිශේෂී මෙහෙයකි. මෙම දර්ශකය හඳුන්වාදීමේ මූලික අරමුණ ජාතික පුස්තකාලයේ කාර්යක්ෂමතාව හා මෙහෙය ඇගයීමට ලක් කිරීමය.

## 09. පුස්කොළ පොත් සඳහා මධ්‍යස්ථානයක් ඇති කිරීම Centre for Palm Leaf

අතීත හෙළයාගේ ලේඛන කෞශල්‍ය විදහාපාන ඓතිහාසික සම්පතක් ලෙස පුස්කොළ ලේඛන කලාව නම් කළ හැකිය. දැනට දිවයිනේ පුස්තකාල ඉතා සීමිත ප්‍රමාණයක පමණක් මෙම පුස්කොළ පොත් ස්ථානගත වී ඇත. මෙයට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි ආගමික ස්ථාන හා පෞද්ගලික ස්ථානවල විශාල පුස්කොළ ප්‍රමාණයක් විසිර පවතී. මෙම ග්‍රන්ථ එකතුවේ අසංගුව ඇත්තේ දේශීය

ඥානයයි. එබැවින් මෙම එකතුන් සංරක්ෂණය කර පර්යේෂකයන්ගේ ප්‍රයෝජනය උදෙසා තැබීමට සුදුසු මධ්‍යස්ථානයක් ජාතික පුස්තකාලයට අනුබද්ධිතව පිහිටුවිය යුතු අතර එහි ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ දේශීය ඥානය සංරක්ෂණය කර ලීමය.

## 10. ගැමි සාහිත්‍යය එකතුවක් නිර්මාණය කිරීම
## Collection of folk Literature

ලෝකයේ අන්රටවල් හා සසඳාබලන විට ශ්‍රී ලංකාව සතුව ඉතා උසස් ගැමි සාහිත්‍යයක් පවතී. විවිධ ස්වරූපයෙන් බිහිවී තිබෙන මෙම ගැමි සාහිත්‍යය එකතු කර සංවිධානය කර සංරක්ෂණය කරලීමේ ව්‍යාපෘතියක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මඟින් ආරම්භ කළ යුතුය.

## 11. විද්‍යුත් විමර්ශන කවුළුවක් නිර්මාණය කිරීම
## Virtual Reference Desk

විද්‍යුත් විමර්ශන සේවය ජාතික පුස්තකාලයේ එක් ප්‍රධානතම සේවාවක් බවට පත් කළ යුතු අතර නව තාක්ෂණය මේ සඳහා ඉවහල් කරගත යුතුය. විශේෂයෙන් ලෝකයේ බොහෝ ජාතික පුස්තකාලවල මෙන් මෙරට ජාතික පුස්තකාලයේ ද විද්‍යුත් ක්‍රම තුළින් පාඨකයාට සේවය සැලසිය හැකි විමර්ශන කවුළුවක් ආරම්භ කළ යුතුය.

## 12. ආබාධිතයන් සඳහා අංශයක් පිහිටුවීම
## Section for Handicapped

නිදහසේ තොරතුරු වෙත පිවිසීම වත්මන් සමාජයේ සෑම පුද්ගලයෙකුගේම මූලික මිනිස් අයිතිවාසිකමක් බවට පත්ව ඇත. විශේෂයෙන සමාජයේ ආබාධිත පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම ද පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සතු මූලික

වගකීමකි. මෙම වගකීම නිසැකයෙන්ම පැවරී ඇති ආයතනයක් වන්නේ ජාතික පුස්තකාලයයි. මෙරට ජනගහනයේ ආබාධිතයන්ගේ සංඛ්‍යාව ඉතා ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින්නේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතු කරගෙනය. එබැවින් ජාතික පුස්තකාලයේ ආබාධිතයන් උදෙසා සුවිශේෂී වූ අංශයක් පිහිටු විය යුතු අතර එම අංශය අදාළ තොරතුරු මූලාශ්‍ර වලින් සමන්විත විය යුතුය.

## 13. ලිඛිත ග්‍රන්ථ ප්‍රතිග්‍රහන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම Written version of collection Development Policy

ජාතික පුස්තකාලය සතු එක් මූලික වගකීමක් වන්නේ විවිධ විෂයන් උදෙසා ජාතික එකතුන් බිහි කිරීමය. ලෝකයේ බොහෝ ජාතික පුස්තකාලයන්හි සුවිශේෂී එකතුන් ජාතික වශයෙන් සංවිධානය කර ඇති අතර ඒවා පර්යේෂකයන්ගේ ක්ෂේම භූමි බවට පත්ව ඇත. මේ කාර්ය විධිමත්ව කළ හැකි වන්නේ සවිස්තරාත්මක ලිඛිත ග්‍රන්ථ ප්‍රතිග්‍රහන ප්‍රතිපත්තියක් ජාතික පුස්තකාලය සතු වුවහොත් පමණි. එබැවින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය තුළ සමතුලිත වූ ජාතික එකතුවක් ගොඩනැංවීමේ කාර්ය උදෙසා සවිස්තරාත්මක ලිඛිත ග්‍රන්ථ ප්‍රතිග්‍රහන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

## 14. ජාතික පුස්තකාල අධි ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීම National Library Fellowship

. ජාතික පුස්තකාලය වූ කලී අත්‍යවශ්‍යයෙන් ම පර්යේෂණ ආයතනයකි. සිය එකතුන් පාදක කරගත් පර්යේෂණ දිරිමත් කිරීමට කටයුතු කිරීම එය සතු මූලික වගකීමකි. ශ්‍රී ලංකාවේ අද්විතීය විමර්ශන පුස්තකාලය බවට පත්ව ඇති මෙම ජාතික පුස්තකාලයේ ඉතා දුර්ලභ එකතුන් රැසක් මෙන් ම විශාල ප්‍රමාණයේ පුස්කොළ පොත් එකතුවක්

ද දැකිය හැකිය. මෙම එකතුන් පරිශීලනය කිරීමත් ඒවායේ ඇතුළත් තොරතුරු පාඨක ප්‍රජාව වෙත විවෘත කරලීමත් උදෙසා විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීම අත්‍යවශ්‍යය. මේ සඳහා ඇති ඉතා සාර්ථක ක්‍රමයක් ලෙස නම් කළ හැක්කේ ජාතික පුස්තකාලයේ එකතුන් පරිශීලනය උදෙසා පර්යේෂකයෝ දිරිමත් කිරීමේ අරමුණින් අධිශිෂ්‍යත්වයක් නිර්මාණය කිරීමය. මේ සඳහා ජාත්‍යන්තර ආයතනයන්හි සහය ලබාගත යුතුය.

## 15. ජාතික පුස්තකාල ප්‍රදර්ශන ඒකකයක් නිර්මාණය කිරීම Exhibition corridor

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රදර්ශන අංශයක් තිබීම අත්‍යවශ්‍යය. විශේෂයෙන් පුස්තකාල හා ලේඛන කලාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන අංශයක් මෙහි විවෘත කළ යුතුය. මෙයට අමතරව ජාතික පුස්තකාල එකතුවේ ඇති සුවිශේෂිත වූ ග්‍රන්ථ හා අත්පිටපත් මෙම ප්‍රදර්ශන ඒකකයට ඇතුළත් විය යුතු අතර මෙහි මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ වෘත්තිකයන් මෙන් ම පොදු ජනතාව ද අවධියෙන් තැබීමය.

මෙවන් යෝජනා විධිමත්ව ක්‍රියාත්මක කිරීම උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ හා මධ්‍යස්ථානයේ ව්‍යුහය ප්‍රතිව්‍යුහගත විය යුතුය. විශේෂයෙන් මෙරට ජාතික පුස්තකාලය අමතක කර දමා තිබූ අදහසක් වන පුස්තකාල සහයෝගීතාවය නැවත අවධි කළයුතු අතර ඒ සඳහා වෙන ම අංශයක් ජාතික පුස්තකාලය තුළ ස්ථාපිත විය යුතුය. මෙයට අමතරව පර්යේෂණ, ක්‍රමෝපාය සැලැසුම්කරණය වැනි කටයුතු සඳහා ජාතික පුස්තකාලය තුළ වෙන ම අංශ ස්ථාපිත විය යුතුය.

ආරම්භයේ සිට ම මෙරට ජාතික පුස්තකාලය ක්‍රියාත්මක කරනු ලබන්නේ නායකත්ව භූමිකාවකි. එය සහයෝගිතා භූමිකාවකට පරිවර්තනය කළ යුතුය. මෙරට සෑම වර්ගයකම පුස්තකාල සමඟ සහයෝගිතා වැඩසටහන් ආරම්භ කළයුතු අතර ජාත්‍යන්තරව ද ක්‍රියාකාරී සහයෝගිතා වැඩසටහන් සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය අවතීර්ණ විය යුතුය.

# Role of National Library and Documentation Centre in the Bibliographic Control in Sri Lanka

**Prof. Jayasiri Lankage**
Former Librarian, University of Kelaniya

## Introduction

The object of this paper is to review the role and functions of the National Library and Documentation Centre in Bibliographic control in Sri Lanka. An overview of the historical background to the setting up of the National library is therefore necessary for understanding its development in the field of bibliographic activities.

Sri Lanka had a very rich library heritage going as far back as the 3rd century B.C. During the first century B.C. Buddhist religious texts and commentaries were written down and monasteries were repositories of learning and depositories for religious texts. Ancient kings encouraged the development of literature by providing royal patronage. Some of the kings were Scholars of repute themselves. Buddhist temples were seats of learning and libraries ' potgul' contained religious and secular texts .In the course of history many of these libraries have been destroyed due to invasions and conquests and internal turmoil that took place.

The system of libraries now prevailing in the country can be traced back to the British period of administration at the turn of the 18th century. Before the establishment of the National Library of the country the major libraries ie Colombo Public Library established in 1813. National Museum Library established in 1877,Royal Asiatic Society Library established in 1845, Department of National Archives, University of Ceylon library established in 1942 performed some of the traditional functions of a National Library.

## Background of the present National Library

The public interest in establishing the National Library goes as far back as 1950.Special Committee on Antiquities (1959) in its final report recommended starting national library service constituting the collections of Museum Library, Royal Asiatic Society Library, library of the Archaeological Department, library section of the Government Archivist. The Salaries and Cadres Commission Report (1961) has also recommended establishment of National Library beginning with Museum as a nucleus collection. UNESCO expert H.V, Bonny (1960) reported that the establishment of National Library is an urgent necessity. At the Meeting of Experts on National Planning of Library Services in Asia held in Colombo ,in 1967 discussed a plan for the development of library and documentation services in Sri Lanka. As a result of all these recommendations and deliberations the National Library Services Board Act came into existence as Act No17 of 1970.The objective of this legislation has been described as an Act to provide for the establishment of Ceylon National Library Services Board and for matters connected with or incidental thereto. This act had no definition of the National Library and the relationship it has with the National Library Services Board. A decision was also taken to

establish the 'National Library and Documentation Centre and the compilation of Ceylon National Bibliography was taken over from the Department of National Archives from 1973.' Though the Ceylon National Library Services Board Act No.17 of 1970 provided the legal base for the National Library at its initial period it was evident that this was an inadequate legislation for this purpose.

Therefore, the National Library and Documentation Services Board (NLDSB) Act No: 51 of 1998 was enacted to succeed the Sri Lanka National Library Services Board Act No 17 of 1970.This legislation remedied some of the short comings of the previous legislation. The main functions of the Board and National Library and Documentation Centre have been specifically incorporated in this Act.

The functions of the National Library and Documentation Services Board are:

(a) to assess the need for library and documentation services among all sectors of the community and to promote the development of library and documentation services;

(b) to administer, manage and control the affairs of the National Library and Documentation Centre ;

(c) to advise the Minister regarding plans, programmes and activities for the development of library and documentation services in Sri Lanka :

(d) to provide co-ordination for, and promote co-operation in library and documentation services in Sri Lanka ;

(e) to provide professional advice, training and facilitate the provision of technical, material and financial assistance including the provision of furniture, equipment and library and documentation materials to libraries in Sri Lanka ;

(f) to promote the development of the library and documentation profession in Sri Lanka;

(g) to initiate, promote, conduct and co-ordinate research, surveys and investigations in relation to all aspects of library and documentation services;

(h) to formulate and promulgate national standards with regard to all aspects of library and documentation services;

(i) to promote the reading habit through the production of publications, the provision of advice and assistance to other agencies for the production of publications and through exhibitions, displays and other promotional activities;

(j) to organize meetings, training courses, exhibitions and other activities in connection with any aspect of its work;

(k) to initiate and finance competitions. prizes and awards in connection with any aspects of its activities

(l) to do all which in the opinion of the Board are necessary for or conducive or incidental to the attainment of its functions.

## The National Library and Documentation Centre (NLDC)

The National Library and Documentation Centre established in 1990 intend to provide library and information resources to all Sri Lankans through the National Library and Documentation Centre and network of libraries and resource centres.

The functions of the National Library and Documentation Services Board (NLDSB) as laid down in this Act are:

(a) to make available for the use of all sections of the community .a national collection of library and documentation resources appropriate to their needs:

(b) to preserve the national and cultural heritage of Sri Lanka through the establishment .development and maintenance of a national collection of library and documentation materials. published in or relating to Sri Lanka :

(c) to receive copies of Sri Lankan publications deposited in the Department of National Archives under the Printers and Publishers Ordinance(Chapter 179) ;

(d) to acquire ,by purchase or otherwise ,copies of publications published in or relating to, Sri Lanka or of foreign publications relevant to the needs of Sri Lanka;

(e) to provide bibliographic services , including National Bibliographic Services and to compile a Union Catalogue of library materials of libraries in Sri Lanka ;

(f) to establish and create a national bibliographic database of documents and publications, published in ,or relating to, Sri Lanka ;

(g) to publish National Bibliography of Sri Lanka ;

(h) to provide reference, information, referral, reprographic and documentary research services to all sections of Sri Lanka :

(i) to facilitate access to library and documentation resources which are . or may in future become. available in or outside Sri Lanka to all members of the community in Sri Lanka :

j) to promote , advise and assist in . the stablishment, development and maintenance of. library and documentation networks , including networks of public, school, academic. government and other libraries and documentation centres serving all sections of the community in Sri Lanka ;

(k) to promote and facilitate co-operation and resource sharing among libraries and documentation , at national and international levels, including exchanges of library materials, library lending and document copying , and the exchange of staff ;

(l) to promote the introduction and efficient application of new information technologies in libraries and documentation centres in Sri Lanka through the application of such technologies in the work of the Centre and to provide advice, assistance and training to other bodies regarding the introduction of such technologies . or promotional activities ; and

(m) to undertake such projects, and provide such facilities and services, in pursuance of the functions of the Board as the Board may from time to time require.

In order to fulfill all these functions NLDC has constituted six divisions namely;

1. Acquisition

2. Reader Services

3. National Bibliographic Services

4. Documentation Services

5. Information Technology Services

6. Conservation and Preservation.

## Acquisition Policy for collection development

A distinguishing feature of a national library is its responsibility for acquiring and preserving the country's publications in terms of legal deposit. Printers and Publishers Ordinance No.1 of 1885 was the first legal instrument which paved the way for collection development in the country. Amendment introduced to this Ordinance by Act no 28 of 1951 ensured that publishers delivered four copies of each book published in Sri Lanka to Office of the Registrar. The next Amendment introduced by Printers and Publishers (Amendment) Law, No6 of 1976 National Library Services Board was included as a recipient one of the copies to be deposited with the Registrar of Books and Newspapers of the Department of Government Archives.

This legal enactment had a significant effect on library collection development of the National Library and acted as the first milestone towards the acquisition of material published in the country in a systematic manner. The majority of local publications are received under this legal deposit system.

The acquisition policy of the national library of Sri Lanka is to obtain copies of all publications published in the country, material on Sri Lanka published in foreign countries. material published by Sri Lankans in foreign countries. basic reference materials and library and information science publications.

Three copies each from every publication pertaining to Sri Lanka are purchased. Local publications are also acquired through various publication assistance projects of the NLDSB including the ISBN project. The library material exchange programme with a number of national libraries is also an important source of acquiring material.

## Reader Services

The National Library collection consists of the following collections: Main Reference Collection, Newspaper Collection (from 1976), Periodicals Collection, Micro Form Collection., Sri Lankan Collection, Legal Deposit Collection, Government Publications, Gazette Collection (from 1888), Map Collection, Palm Leaf Manuscript and Rare Book Collections, Audio-Visual Collection, Theses Collection. UNESCO Collection, Library and Information Science Collection, Special Collections and Martin Wickramasinghe Collection

The Reader Services Division consists of three main reading rooms. Facilities for 320 readers are available at the Reader Services Division.

## Bibliographic Services

Bibliographic Division is responsible for preparation of Sri Lanka National Bibliography and select bibliographies.

The Sri Lanka National Bibliography (SLNB) published monthly contains bibliographic details of recent Sri Lankan publications. The Ceylon National Bibliography started at the Department of National Archives in 1962 was transferred to the SLNLSB in 1976.

This division has now undertaken the responsibility of compiling following .The Periodical Article Index, a quarterly publication, provides detailed information on periodicals published in the country and bibliographic details of each article indexed.

The Retrospective National Bibliography covers those publications printed prior to the commencement of the National Bibliography in 1963. Following periods have been covered up to now.

1737- 1884 (Sinhala, Tamil and English)

1885-1900 (Sinhala, Tamil and English)

1901-1910 (Sinhala and English)

1911-1920 (Sinhala and English)

1921-1930 (English)

1962 - (Sinhala, English and Tamil)

The Children's Bibliography, an annual publication, provides details of all children's books published in the country.

There are also a number of other bibliographies covering various fields including Sinhalese novels of the last 100 years, translations of the past 50 years and various special topics.

## Authority files

Compilation of authority files has been undertaken by the Bibliographic Services Division. As first part of the project, Name authority file (Sinhala) (from Anuradhapura Period to mid of the 20th Century) has been completed in 2005.

Compilation of Title authority file (Sinhala) has been completed and Name authority file (Tamil) is under preparation.

## Documentation Services

### National Union Catalogue

National Union Catalogue is a long standing need for research. The compilation of the National Union Catalogue is a unique project providing bibliographic details of the holdings of 54 major libraries in Sri Lanka. Users of the National Library can check for required library material from the union catalogue and obtain them to the National Library for reference purposes through inter library loan facilities.

### National Union Catalogue of Manuscript Collections

Another important program that National Library and Documentation Centre should undertake in the near future is a National Union Catalogue of Manuscript Collections. This could promote bibliographic access to the nation's archival and manuscript collections held by repositories in the country

## Newspaper Article Index

Compilation of the newspaper article index and conference index, directories of government publications, social scientists in Sri Lanka, libraries documentation centres and publishers are also published and regularly updated.

The National Library is the national centre for International Standard Book Number (ISBN), International Standard Serial Number (ISSN) and International Standard Music Number (ISMN) projects. These numbers are provided to respective publishers free of charge.

## Library Networks

The Documentation Division also coordinates and assists activities of library networks in the library and information field in Sri Lanka. Presently a number of library networks are in operation in the fields of science and technology, agriculture, health, education, culture and social science. Natnet Lanka newsletter carries news on new projects, services and other information pertaining to these networks.

## Conservation and Preservation

The Conservation Division of the National Library takes steps to conserve and preserve library materials. The National Library collection is stored in an enclosed and air-conditioned area with humidity control facilities and is cleaned and inspected regularly for dust and insects. Newly acquired old book collections are fumigated before they are deposited using both thymol and pospene fumigation methods. Books are bound at the bindery as a precautionary measure. De-acidification and paper restoring

facilities are also available at the conservation centre. A part of the newspaper collection has been microfilmed. The National Library assists other libraries in the country by providing technical assistance, advice, training and material in the conservation field.

### Information Technology Activities

The Information Technology Division of the National Library is active in a number of projects in the information technology field. It helps to maintain and regularly update the National Library web site. National Library catalogue and part of the union catalogue are computerised. Readers are provided assistance for surfing the Internet and using CD-ROMs and the computerised catalogue.

## Suggestions for Future Action

The above is a short description of the services rendered by the National Library and Documentation Centre of Sri Lanka. The need to become more effective, and contribute more to society and the country at large is very important. When we look at the global situation we find that most of the countries have appointed National Review Committees from time to time to review the functions of the National Libraries and make recommendations based on the findings.

National libraries have special responsibilities, often defined in law, within a nation's library and information system. Though the basic role and functions played by National Libraries are similar some of these responsibilities vary from country to country governed by various factors such as the social and economic conditions in the country. Therefore it is advisable to revise the law when it is found

inadequate to perform those responsibilities effectively. Following documents are useful for improving and revision of legislation.

IFLA Section of National Libraries and Guidelines

The role and functions of National Libraries has been the subject of debate in the professional literature in recent years. There is already an extensive literature on traditional national libraries and, various fairly recent guidelines are already in existence for national libraries.

*Guidelines for legislation for national library services prepared by Peter Johan Lor for the General Information Programme and UNISIST -Paris : UNESCO, 1996* follows the three previous UNESCO documents dealing with national libraries ie.: Guy Sylvestre's *Guidelines for national libraries* (PGI-87/WS/17), Maurice Line's *National library and information needs: alternative means of fulfilment, with special reference to the role of national libraries* (PGI-89/WS/9), and Graham P. Cornish's *The role of national libraries in the new information environment* (PGI-91/WS/4).

The document prepared by Peter J. Lor with the assistance of Mrs Elizebeth A.S. Sonnekus under contract with the International Federation of Library Associations and Institutions (IFLA) has built upon the foundations laid by the previous documents by providing concrete guidelines for those engaged in the drafting or revision of legislation for national library services.

At the IFLA/UNESCO Pre-session Seminar on the Role and Objectives of National Libraries in the New Information Environment, that was held in Moscow in August 1991. Ms Irina

Bagrova requested that guidelines be prepared for developing and improving the legal basis for the activities of the national library. She also suggested that such guidelines would "help individual national libraries to work out their models relating to conditions in their countries" (Bagrova 1992).

IFLA Section of National libraries is very active in this area and issues Guidelines for National Library Services. The section also work closely with the Conference of Directors of National Libraries (CDNL) It is advisable to review the existing role and functions rendered by the National Library based on these guidelines, conference deliberations and build upon the bibliographic role and functions of the National Library in terms of IFLA's programmes of Universal Bibliographic Control (UBC), Universal Availability of Publications (UAP) and in the new information environment.

Maurice B. Line in his report (PGI-89/WS/9) with special reference to the role of national libraries identified "the following types of library and information need:

1. Collection and preservation of documents of national interest and importance.
2. Bibliographic needs: creation of and access to records of publications.
3. Document provision: the national resource.
4. Access to publications.
5. Exchange of publications.

6. Access to information.

7. Services to libraries and information units. The most prominent of these is cataloguing. Other services may include preservation and conservation.

8. Leadership and advice to libraries and information units to help them carry out their functions more effectively.

9. Planning and coordination, which implies a greater degree of control than the provision of leadership and advice.

10. Education and training for library and information work.

11. Research and development. "

He has also divided the functions into three categories:

(a) those that might be centralised on the national library;

(b) those that might be centralised but not carried out by the national library;

(c) those that might be decentralised.

Detailed statement of NL/NLS functions given as annex A to the IFLA Section of National Libraries. Guidelines for Legislation for National Library Services would also be useful in this regard. The following suggestions and ideas given below require a broad discussion of specialists and the general public before implementation

It is advisable to find out periodically whether NLDC has played its anticipated role, identify constraints and recommend future action. It is true that the National Library cannot play the role of Bibliographic Control and Services alone very effectively. The present bibliographic scene is afflicted with the problem of institutions working in isolation. Each institution caters to its users in its own way. National Library must develop linkages with public libraries, academic libraries; special libraries, research institutions, documentation centres and special libraries having large collections in the country through various networking systems as envisaged.

## National Collection Development Policy

National library is funded by the state and responsible for collecting the documentary heritage emanating from or relating to the country, bibliographically recording, preserving and making available for use to all sections of community. National Library should take the lead role in planning acquisition of selected foreign materials required by the country. Although provision has been made for NLDC to acquire "foreign publications relevant to the needs of Sri Lanka" this has become one of the difficult tasks. Resources are limited and there is no cooperative acquisition policy.

## Collection through Cultural Exchange Programmes

Collection through Cultural Exchange Programmes is of great benefit for building the library collection. National Library of India presently maintains cultural exchange programmes with 205 institutions in 85 countries. National Library of Sri Lanka should explore the possibility of acquisition of material under the Cultural Exchange Programmes of the Government with partner countries.

Generally this type of publications cannot be acquired by the usual channels of book trade

Microform/Digital Collection

A National Collection comprises of (a) publications, not only conventional printed publications such as books, serials, newspapers, maps, music, posters, and pamphlets but also grey literature and (b) unpublished documents such as manuscripts and audio and visual recordings. National library has started collecting and documenting the published output of country. Traditionally, this has meant collecting a comprehensive collection of the nation's publications. describing, and preserving for future generations at least one copy of every item. Since the National Library is a recent creation in Sri Lanka, the national library collection prior to that period are scattered in a number of older libraries in the country such as the National Museum Library, National Archives, Royal Asiatic Society Library and the Library of University of Peradeniya. As large number of those titles may not be available in printed form any more; efforts should be made to acquire microform or digital copies of the same and build a Microform/Digital Collection. In the case of those printed materials published outside concerning the country and if not available within the country in print form, National library should acquire microform records of such materials.

Book Production Statistics

A distinguishing feature of a national library is its responsibility for acquiring and preserving the country's publications in terms of legal deposit. It is difficult to trace and collect all the published material in the country. It is known that books received under the legal deposit fall short of the number of books published

annually. Therefore, the National library should take concerted effort to trace and obtain all that is published in the country and also collect reliable statistics. For example National Library of India has set up a Monitoring Cell for National Book Production Statistics. The National Library of India 'through resource persons and institutions in the different States collect reliable and representative statistics of books for the production of the Indian National Bibliography'.

Comprehensive National Union Catalogue of Sri Lanka

To perform the function of the National Bibliographic Centre of Sri Lanka it is necessary to be aware of what is being published and where they are available. Now the NLDC has started compilation of the National Union Catalogue providing bibliographic details of the holdings of 54 major libraries in Sri Lanka.

Compilation of a Comprehensive National Union Catalogue could also help in resource sharing and by avoiding duplication of purchases and planning of acquisition of foreign materials by the country.As some of the functions which normally devolve on a National Library have been assigned to other official organizations it is necessary to work in conjunction with those government institutions. Therefore proper linkages will have to be maintained with them to ensure effective coordination of programmes and avoid duplication.

Use of modern Information Technology

Digitisation and the Internet could be used to provide access to rare and fragile documents without endangering them. Electronic

access can be provided not only to users living near the national library but also to those living in distant areas.

Research and development

This is an area that National Library should embark upon. Development is linked to research. There is a national need for conducting and funding of research in the field of bibliographical studies. The National Library of Singapore has been empowered by legislation to establish a National Library Board Endowment Fund and the resources are utilized to subsidize projects and research that determine the strategic directions of the library policies of the country.

National Policy for Library and Information Services

Policy and Planning is one of the facets of infrastructure development. There is provision in the Act for the Board 'to advise the Minister regarding plans, programmes and activities for the development of Library and documentation services in Sri Lanka' The National Library Services Board should formulate the National Policy on Library and Information Services for the consideration and approval of the government.

## Selected References

Bagrova. I.Y. 1992. The IFLA/Unesco Pre-session seminar on the role and objectives of national libraries the new information environment. 12-16 August 1991, Moscow. USSR. *IFLA journal* 18(3):274-280.

Bonny, H.V.1960 Library Services for Ceylon. Colombo: Department of Cultural Affairs

Cornish, G.P. 1991. *The role of national libraries in the new information environment*. Paris: UNESCO. (PGI-90/WS/4.)

Dasgupta, Kalpana 1992.Thr Role of National Library as a Bibliographic Centre in a Multi-lingual Situation: Indian Context. Calcutta: National Library, Calcutta.

De Silva. G. P.S.HY.1975. National Archives of Sri Lanka, In Libraries and people, ed by I. Corea, Colombo: Colombo Municipal Council

Karunanayake, C.I.1980.The National Museum Library of Sri Lanka, In Roads to wisdom ed. by I.Corea, Colombo : Colombo Municipal Council

Line, M.B. 1989. *National library and information needs: alternative means of fulfilment, with special reference to the role of national libraries*. Paris: UNESCO. (PGI-89/WS/9).

*Lor, Peter Johan 1996.Guidelines for legislation for national library services : provisional version / prepared by Peter Johan Lor [for the] General Information Programme and UNISIST -Paris : UNESCO.* (ww unesco.org/webworld/ [illegible] guidelines1_h.htm)

Ramachandran.R 1999 The "national" role of the National Library board of Singapore,65th IFLA Council and General Conference Bangkok, Thailand. August 20- August 28.1999.(www.ifla.org/ IV/ifla65/ papers/135- 111e.htm)

Sylvestre, G. 1987. *Guidelines for national libraries*. Paris : UNESCO. (PGI-87/WS/17).

# පුස්තකාල සංවර්ධනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ඉටු කෙරෙන සේවාවන්

**නාලිනි මල්ලවආරච්චි**
අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## හැඳින්වීම

රටක සංවර්ධන ක්‍රියාවලියේ දී ජනතාවගේ දැනුම වර්ධනය කිරීම අතිශයින් වැදගත් කාර්යයක් වේ. මන්ද සියලු ම සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහාත් ඒවා ඵලදායීව භාවිත කිරීම සඳහාත් ජනතාව දැනුවත් වී සිටිය යුතු බැවිනි. වර්තමාන ලෝකයේ දැනුම පාදක කරගත් සංවර්ධන ක්‍රියාවලියක් පැනනැගී ඇති බැවින් සමාජයේ සියලු ජන කොටස්වලට ඉක්මනින් තොරතුරු ලබාදීම පුස්තකාල සේවාවන්හි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී. 1998 අංක 51දරණ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත මගින් එහි කර්තව්‍යයන් කාලානුරූපව සංශෝධනයට ලක් විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වනුයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමයි. එමෙන් ම දිවයිනේ සියලු පුස්තකාලවල සංවර්ධන කටයුතු සැලසුම් කිරීම ද ඊට අයත් කාර්යයකි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය දිවයිනේ අනෙකුත් පුස්තකාලවලට නායකත්වය සපයන ආයතනය වේ. ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු

මෙහෙයවීම, සියලු පුස්තකාල සඳහා අවශ්‍ය උපදේශක සේවා සැපයීම, සම්පත් හීන පුස්තකාලවලට ආධාර ලබාදීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ ව්‍යාපෘති දියත් කිරීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, පුස්තකාල කාර්යමණ්ඩල පුහුණු කිරීම හා ග්‍රන්ථ ප්‍රකාශනය වැඩිදියුණු කිරීම වැනි කටයුතු රාශියක් ද එමගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කාර්යභාභාරය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1990 අප්‍රේල් 27 දින එවකට ගරු ජනාධිපති වූ ආර් ප්‍රේමදාස මැතිතුමා අතින් විවෘත විය. එතැන් සිට ජාතික පුස්තකාල එකතු ඇසුරින් රටේ ජනතාවට විධිමත් අයුරින් පාඨක සේවා සැපයීම ආරම්භ විය. අප රටේ පුස්තකාල සේවාවන් ශක්තිමත් කරලීම සඳහා එමගින් පහත සඳහන් ව්‍යාපෘති තුළින් සුවිශාල මෙහෙවරක් ඉටු කරනු ලැබේ.

* ශ්‍රී ලංකාවේ ප්‍රකාශනවල පුළුල් සහ මධ්‍ය එකතුවක් පවත්වාගෙන යාම, නීත්‍යානුකූල තැන්පතු එකතුව ආරක්ෂා කිරීම හා දේශීය අවශ්‍යතාවන්ට ගැලපෙන මුද්‍රිත හා වෙනත් මාධ්‍යවලින් පළවන කෘති එක්රැස් කිරීම.

* ජාතික පුස්තකාලයේ සම්පත් හා එකතුන් මතු පරපුර උදෙසා සංරක්ෂණය කිරීම හා වෙනත් පුස්තකාලවල සංරක්ෂණ කටයුතු මෙහෙයවීම.

* ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය විධිමත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය නායකත්වය, අධීක්ෂණය හා මාර්ගෝපදේශ සැපයීම.

* ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.

* පර්යේෂකයන්ට හා ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවට පුස්තකාල හා තොරතුරු පහසුකම් සැලසීම.

* නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේද භාවිත කරමින් ජාතික පුස්තකාල කටයුතු දියුණු කිරීම හා තොරතුරු ජාල සම්බන්ධීකරණය.

* දේශීය පුස්තකාල කටයුතු හා සේවා පිළිබඳ ප්‍රමිතීන් සකස් කිරීම.

* පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු කටයුතු පවත්වාගෙන යාම.

* මහජන, පාසල් හා වෙනත් පුස්තකාල සංවර්ධනය සඳහා අධාර උපකාර කිරීම.

* කියවීමේ රුචිය වර්ධනය කරලීම සඳහා සුදුසු වැඩසටහන් දියත් කිරීම.

## සේවා අංශ සංවිධානය

අංශ කීපයක් යටතේ ඉහත කී සේවාවන් දියත් කෙරේ.

* ප්‍රතිග්‍රහන අංශය
* පාඨක සේවා අංශය

* ප්‍රලේඛන සේවා අංශය
* තොරතුරු තාක්ෂණ අංශය
* ග්‍රන්ථ විඥාපන සේවා අංශය
* සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය
* අධ්‍යාපන හා පුහුණු අංශය
* ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
* පුස්තකාල සේවා අංශය හා පුස්තකාල සංවර්ධන අංශය

## පුස්තකාල සංවර්ධනය සඳහා ඉටුවන සේවාවන්

පුස්තකාල ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් සේවාවන් රාශියක් ඉටු කෙරේ. පර්යේෂකයන් හා අනෙකුත් පාඨකයින් සඳහා ජාතික පුස්තකාලය සතු එකතු ඇසුරින් දැනුම හා තොරතුරු ලබාදීමේ පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යයකි.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික, අධ්‍යාපනික, සාහිත්‍යමය නිර්මාණයන් එක්රැස් කොට මතු පරපුර වෙනුවෙන් සංරක්ෂණය කර රැක ගැනීමත් අප රටට අදාළ විෂයයන් යටතේ දේශීය හා විදේශීය වශයෙන් පළවන සියලුම වර්ගයේ පුස්තකාල සම්පත් ජාතික පුස්තකාලය තුළ සංවිධානය කිරීමත් මෙයින් සිදුවන සුවිශේෂ කටයුත්තකි. එම සම්පත් ජනතාවට පරිහරණය කිරීමට අවස්ථාව ලබාදීම පිණිස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවාව 1990 අප්‍රේල් 27 දින ආරම්භ වීම ඓතිහාසික වශයෙන් වැදගත් සිදුවීමකි. රටේ ප්‍රධාන විමර්ශන හා පර්යේෂණ පුස්තකාලය ලෙස ශ්‍රී ලංකාවාසී ජනතාවට සිය සේවා සැපයීමට පාඨක සේවා අංශය මගින් අද්විතීය මෙහෙවරක් ඉටු වේ.

මහල් පහකින් යුතු ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වර්ග මීටර 11,250 ක් වන අතර පාඨකයන් 320 දෙනෙකුට එකවර සම්පත් පරිශීලනයට පහසුවන අන්දමේ ප්‍රධාන කියවීම් ශාලා තුනකින් ද අධ්‍යයන කාමර කීපයකින් ද යුක්ත වේ. දැනට ලක්ෂ 5කට අධික ග්‍රන්ථ සම්භාරයකින් ද පුවත්පත්, වාර සඟරා, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් මාධ්‍ය මගින් ද පර්යේෂණ හා විමර්ශන කටයුතුවලට අවශ්‍ය තොරතුරු පාඨකයින්ට ගවේශනය කිරීමට මෙයින් ඉඩකඩ ලැබේ. සෑම කෙනෙකු ම ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමට තම අනන්‍යතාව තහවුරු කිරීම පමණක් ප්‍රමාණවත් වන අතර වසරක, හය මසක හා තුන් මසක ආදී වශයෙන් ස්ථිර සාමාජිකත්වය ද දෛනික සාමාජිකත්වය ද ලබා ගත හැක.

1990 සිට මේ දක්වා සාමාජිකත්වය ලබා ගැනීමේ ශීඝ්‍ර වර්ධනයක් ඇත. එය පහත සඳහන් සටහනෙන් පැහැදිලි වේ.

| වර්ෂය | ස්ථිර සාමාජික සංඛ්‍යාව | තාවකාලික සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 1990 | 61 | 236 |
| 1995 | 588 | 8285 |
| 2000 | 4309 | 21496 |
| 2005 | 8044 | 46025 |
| 2008 | 14161 | 67570 |

පාඨකයන්ගේ පහසුව උදෙසා ඡායා පිටපත් ලබාදීම, නව ප්‍රකාශන ප්‍රදර්ශනය, පටුන පිටු සේවාව, සාහිත්‍ය ගවේශන කටයුතු, පරිගණක සූචිය තුළින් පොත් තෝරා ගැනීමට සහායවීම, අන්තර්ජාල සේවා, පාඨක අධ්‍යාපන සේවා, පොත් ප්‍රදර්ශන පැවැත්වීම හා ජාතික පුස්තකාලය නැරඹීමට පාඨක කණ්ඩායම්වලට අවස්ථාව ලබාදීම වැනි කාර්යයන් ඉටු කෙරේ.

## ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා

ජාතික පුස්තකාලයක් මගින් ඉටුකළ යුතු ප්‍රධාන වගකීමක් වනුයේ ජාතික මට්ටමේ විඥාපන සේවාවන් හා ප්‍රලේඛන කටයුතු සංවිධානය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන හා පූර්වකාලීන) සම්පාදනය, විශේෂ ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා සාධිකාර ලේඛන සම්පාදනය, පිළිගත් ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිති අනුව ජාතික පුස්තකාල සූචි සම්පාදනය හා ප්‍රලේඛන මූලාශ්‍ර සකස් කිරීම කරනු ලැබේ. දේශීය වශයෙන් සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් රටතුළ පළවන ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් නිල ප්‍රකාශනය ලෙස සැලකිය හැකි ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය කිරීමේ වගකීම උසුලනුයේ ජාතික පුස්තකාලය මගිනි.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන)

1962 වසරේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරන ලද මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදන කටයුතු 1974 සිට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරිණ. වර්තමානයේ දී මාසික ප්‍රකාශනයක් ලෙස නිකුත් කරන මෙහි ශ්‍රී ලංකාවේ පළවන නවතම පොත්, වාර සඟරා හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. පුස්තකාල වෘත්තිකයන්ට, පර්යේෂකයන්ට හා පාඨකයන්ට පොත් තෝරා ගැනීමට මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වන මූලාශ්‍රයකි.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්වකාලීන)

ශ්‍රී ලංකාවට මුද්‍රණ ශිල්පය හඳුන්වාදුන් 1737 වසරේ සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රවර්තන ප්‍රකාශයට පත්කිරීම ආරම්භ වූ 1963 දක්වා කාලය තුළ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ශ්‍රී ලංකාව තුළ පළ වූ ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙයින් එළි දැක්වේ. පහත සඳහන් කෘති දැනට පළ කර ඇති බැවින් පැරණි පොතපත පිළිබඳ අධ්‍යයනය සඳහා ඒවා ප්‍රයෝජනවත් වේ.

1737-1884 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)-
1911-1920 (සිංහල සහ ඉංග්‍රීසි)
1885-1900 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)-
1921-1930 (සිංහල සහ ඉංග්‍රීසි)
1901-1910 (සිංහල සහ ඉංග්‍රීසි) -
1962 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)

## ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත්වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වාර සඟරා ලිපි මෙන් ම ශ්‍රී ලංකාව පිළිබඳව විදේශීය වාර සඟරාවල ඇතුළත් ලිපි අන්තර්ගත කොට ත්‍රෛමාසික ප්‍රකාශනයක් ලෙස 1998 සිට පළකරනු ලබන මෙම අනුක්‍රමණිකාව වටිනා විමර්ශන මූලාශ්‍රයකි.

## ජාතික මට්ටමේ සූචි සම්පාදනය

## ජාතික ඒකාබද්ධ සූචිය

කිසියම් රටක විමර්ශන පුස්තකාලවල තැන්පත් කොට ඇති පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එක් මධ්‍යස්ථානයකින් පහසුවෙන් ලබාදීමේ අරමුණින් ජාතික පුස්තකාල මගින් ඒකාබද්ධ සූචි සම්පාදනය කිරීම සිදු වේ. කිසියම් විෂයයකට, භූගෝලීය ප්‍රදේශයකට සීමා වී හෝ පුස්තකාල කිහිපයක් එකතුවී සාමූහික වශයෙන් සකස් කරනු ලබන ග්‍රන්ථ විස්තර සහිත ලේඛනයක් ඒකාබද්ධ සූචියක් ලෙස හැඳින්විය හැකිය. ප්‍රාදේශීය මට්ටමෙන් පුස්තකාලවල විසිරී ඇති සම්පත් මොනවාදැයි විස්තර දැනගැනීමට එය ප්‍රයෝජනවත් වන අතර මධ්‍යගත සූචියක් තුළින් පාඨකයන් සඳහා වඩා කාර්යක්ෂමව, වේගවත් ලෙස තොරතුරු ගවේෂණ මාර්ග පුළුල් කළ හැක. රටෙහි පළවන සෑම ප්‍රකාශනයක් ම ජාතික පුස්තකාලයක තැන්පත් විනා බැවින් ද පර්යේෂණයන්හි නියැලෙන පාඨක පිරිස වැඩි ප්‍රමාණයක් සිටින බැවින් ද ඒකාබද්ධ සූචි සම්පාදනය අත්‍යවශ්‍ය කටයුත්තක් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය මගින් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ආරම්භ කළේ 1986 වර්ෂයේදීය. විශ්වවිද්‍යාල පුස්තකාල, පර්යේෂණායතන, මහජන සහ විශේෂ පුස්තකාල 50කට වැඩි ප්‍රමාණයක් ඒ සඳහා දායකත්වය ලබාදේ. 1994 දී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම ආරම්භ වූ අතර 2001 වසරේ සිට මාර්ගගත සූචියක් ලෙස ජාතික පුස්තකාල වෙබ් අඩවිය (www.natlib.lk) ඔස්සේ එම තොරතුරු පරිශීලනය කළ හැකිය.

## තොරතුරු ක්ෂේත්‍රයට අදාළ විමර්ශන මූලාශ්‍ර හා දත්ත පදනම් නිර්මාණය කිරීම

ජාතික පුස්තකාලයේ තැන්පත්ව ඇති සම්පත් පමණක් නොව විවිධ විෂය ක්ෂේත්‍රවලට අයත් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එක්රැස් කොට අනුක්‍රමණිකා හා නාමාවලී වැනි විමර්ශන මූලාශ්‍ර සැකසීම සිදු වේ. ජාතික පුස්තකාලය මගින් අනුක්‍රමණිකා සහ ග්‍රන්ථ නාමාවලී කිහිපයක් පළ කර ඇත.

## ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව

සෑම පුද්ගලයෙකු ම පුවත්පත් ආශ්‍රයෙන් තොරතුරු සොයනු ලැබේ. එම පිරිසගේ පහසුව සඳහා ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළවන ප්‍රධාන ජාතික පුවත්පත්වල ඇතුළත් විශේෂිත ලිපි අනුසාරයෙන් ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සකස් කරනු ලැබේ. 1991 සිට 1994 සහ 2000 වර්ෂවලට අදාළ පුවත්පත් ලිපි අනුක්‍රමණිකා කලාප 13ක් ප්‍රකාශයට පත් කර ඇත. මාර්ගගත දත්ත පදනමක් ලෙස මෙම තොරතුරු අන්තර්ජාලයට ඇතුළත් කර ඇත.

## පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 1981-2000

ශ්‍රී ලංකාවේ සහ ශ්‍රී ලාංකිකයන් විසින් විදේශීය විශ්වවිද්‍යාලවලට 1981-2000 කාලය තුළ ඉදිරිපත් කර ඇති පශ්චාත් උපාධි නිබන්ධන පිළිබඳ තොරතුරු අන්තර්ගත වූ මෙය මාර්ගගත දත්ත පදනමක් ලෙස අන්තර්ජාලයට ඇතුළත් කර ඇත. 2001 සිට 2006 කලාපය සඳහා තොරතුරු එක්රැස් කරමින් පවතී.

## ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතන මගින් පළ කරනු ලබන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් මෙය පාඨකයනට වැදගත් විමර්ශන මූලාශ්‍රයකි. 1990 සිට 2008 දක්වා කාලය ආවරණය වන පරිදි කලාප කිපයක් ප්‍රකාශයට පත් කර ඇත.

## ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව

1976 සිට 1995 දක්වා ශ්‍රී ලංකාවේ පැවති සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ. එය පරිගණක දත්ත පදනමක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

## පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය

ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, වාර සඟරා වැනි විමර්ශන මූලාශ්‍ර ද පොත්, වාර්තා සහ වෙනත් ලේඛන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු හා එම කෘති තැන්පත් වී ඇති පුස්තකාල පිළිබඳ විස්තර ආදිය ඇතුළත් කොට මෙම කෘතිය 2007 වසරේ දී ජාතික පුස්තකාලයේ ප්‍රලේඛන සේවා අංශය මගින් සම්පාදනය කරන ලදී. දේශීය පුස්කොළ ලේඛන සාහිත්‍යය ගවේශනය කරන පර්යේෂකයෙකුට මෙය අත්‍යවශ්‍ය මෙවලමකි.

## පුස්තකාල සහයෝගිතාව හා සම්පත් හුවමාරු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාලය වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය වෙනත් පුස්තකාල සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය (SLSTINET), කෘෂිකර්ම තොරතුරු ජාලය (AGRINET), පරිසර තොරතුරු ජාලය (ENLINET), වැනි ජාල කිහිපයක් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සහ සම්මන්ත්‍රණවලට සහභාගිවීම සිදු කෙරේ. ජාතික පුස්තකාලයේ තැන්පත් වී ඇති බුද්ධිමය සම්පත් අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය යටතේ ඉල්ලීම් කරනු ලබන වෙනත් පුස්තකාල සඳහා ලබාදීම තුළින් සම්පත් හුවමාරු කිරීම හා අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් දියත් කෙරේ.

## විද්‍යුත් පුස්තකාල පද්ධති නිර්මාණය කිරීම

වර්තමාන යුගයේ අධ්‍යාපනික හා තොරතුරු අවශ්‍යතාවන් කාර්යක්ෂම ලෙස සපුරා ගැනීම සඳහා පරිගණක ආශ්‍රිත තාක්ෂණ පහසුකම් උපයෝගි කරගත යුතුය. පුස්තකාල ස්වයංක්‍රියකරණ කටයුතු මගින් ලෝකයේ කුමන රටක වුව ද වෙසෙන පුද්ගලයෙකුට භූගෝලීය සීමාවන් අභිබවා ඉතා ඉක්මනින් තොරතුරු සොයාගැනීමට පහසු ප්‍රවේශයක් ලැබේ. එම අභියෝගය ජය ගැනීමට ජාතික පුස්තකාලයේ තොරතුරු තාක්ෂණ හා සංඛ්‍යාංකකරණ අංශය මගින් වැඩකටයුතු රාශියක් ඉටු කරනු ලැබේ. 1997 වසරේදී ජාතික පුස්තකාලය ගැන තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී. (www.natlib.lk) ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති දුර්ලභ ග්‍රන්ථ හා ජනසාහිත්‍ය එකතුවට අයත් අත්පිටපත් සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතිය (Digitization) 2005 වසරේ සිට ආරම්භ කරන ලදී. තවද විද්‍යුත් පුස්තකාල සංකල්පය බල ගැන්වීමට උපකාරී වන පරිගණක දත්ත පදනම් නිර්මාණය කිරීම, අන්තර්ජාල පහසුකම් උපයෝගි කරගෙන මාර්ගගත ප්‍රවේශයන් (Online access) විවෘත කර ඇත. ජාතික ඒකාබද්ධ සූචිය, ජාතික පුස්තකාල සූචිය, පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව, පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව, බලය විමධ්‍යගත කිරීම පිළිබඳ තොරතුරු, ජාතික ග්‍රන්ථ නාමාවලි 2006 සහ මහජන පුස්තකාල පිළිබඳ විස්තර අන්තර්ජාලයට ඇතුළත් කර ඇත. ඉහත කී තොරතුරු සංගෘහිත තැටි ස්වරූපයෙන් ද සම්පාදනය කර තිබේ.

## පුස්තකාල සංවර්ධනය සඳහා උපදේශක සේවාවන් සැපයීම

ජාතික පුස්තකාල සෑම රටක ම පුස්තකාල පද්ධතියේ නායකත්වය උසුලන ආයතන වන අතර මහජන, පාසල්, විශේෂ හා වෙනත් පුස්තකාලවල සේවාවන් වැඩිදියුණු කිරීමට මාර්ගෝපදේශ

ලබා දේ. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල 800 කට වැඩි ප්‍රමාණයක් තිබේ. කිසිදු භේදයකින් තොරව පොදු ජනතාවට තම අධ්‍යාපන හා තොරතුරු අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට ඒවා උපකාර වේ. විධිමත් අධ්‍යාපනය ලබන ළමා සහ තරුණ පරපුර බුද්ධිමත් පුරවැසියන් කිරීමට පාසල් පුස්තකාල සේවා මැනවින් ක්‍රියාත්මක විය යුතු වේ. ශ්‍රී ලංකාවේ 10000 කට ආසන්න පාසල්වලට අනුයුක්ත පුස්තකාල රාශියක් ද තිබේ. ඒවායේ කාර්යමණ්ඩල පුහුණු කිරීම, කියවීම ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් දියත් කිරීම, පාඨක සමාජ පිහිටුවීම, පුස්තකාල පරිපාලනය විධිමත් කරවීම, වෘත්තීයමය උපදෙස් ලබාදීම, නව පුස්තකාල ගොඩනැගිලි සැලසුම් ලබාදීම වැනි සේවාවන් සඳහා ජාතික පුස්තකාලය උපරිම අන්දමින් සහාය වේ.

## පුස්තකාල ප්‍රමිති සම්පාදනය සහ ශ්‍රේණිගත කිරීමේ කටයුතු

පුස්තකාල සේවාවන් විධිමත් කොට කාර්යසාධනය ඉහළ මට්ටමකට වර්ධනය කර ගැනීම පිණිස පුස්තකාල ශ්‍රේණිගත කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් වේ. පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ බලතල පැවරී ඇත්තේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයටය. ඒ සඳහා මණ්ඩලය මගින් ප්‍රමිති සකස් කර ඇත. එනම් රජයේ පුස්තකාල හා මහජන පුස්තකාල සඳහා අධි ශ්‍රේණිය, පළමු ශ්‍රේණිය, දෙවන ශ්‍රේණිය, තුන්වන ශ්‍රේණිය දැක්වෙන ප්‍රමිති ද පාසල් පුස්තකාල සඳහා පළමුවන, දෙවන හා තුන්වන ශ්‍රේණියට අදාළ ප්‍රමිති වශයෙන් වර්ග කීපයකි. පුස්තකාලවල භෞතික සම්පත් හා ගුණාත්මක තත්වයන් සුදුසු මට්ටමට පවතීදැයි තක්සේරු කිරීමට යොදාගන්නා මෙවලමක් ලෙස ඒවා වැදගත් වේ. පුස්තකාල ගොඩනැගිලි, ඉඩකඩ ප්‍රමාණයන්, වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන, සම්පත් ප්‍රමාණයන්, සේවා අංශ සංවිධානය, විවෘත වන වේලාවන්, සැපයිය යුතු සේවාවන් ආදිය පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක කරුණු එම ප්‍රමිතිවල අඩංගු වේ. රාජ්‍ය,

මහජන හා පාසල් පුස්තකාලවල පරිපාලන සාධිකාරිත්වය, සංවිධාන ව්‍යුහය, අරමුණු, පාඨක අවශ්‍යතා හා සේවාවන් ආදිය එක සමාන තත්වයක නොපවතී. එහෙයින් පුස්තකාල පරීක්ෂා කර වාර්තා ලබාගෙන ප්‍රමිති මට්ටම් පරීක්ෂා කරනු ලැබේ. එම වාර්තා සමාලෝචනය කොට ඇගයීම පිණිස ශ්‍රේණිගත කිරීමේ උපදේශක කමිටුවක් වෙත ඉදිරිපත් කළ පසු විධිමත් පරිදි ශ්‍රේණිගත කිරීම සිදු වේ. පුස්තකාලවල කාර්යමණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීම සඳහා එය අත්‍යවශ්‍ය වේ.

## 1990 සිට 2008 වසර දක්වා ශ්‍රේණිගත කරන ලද පුස්තකාල සංඛ්‍යාව

| | |
|---|---|
| මහජන පුස්තකාල | 635 |
| පාසල් පුස්තකාල | 184 |
| දෙපාර්තමේන්තු පුස්තකාල | 100 |
| එකතුව | 919 |

## පුස්තකාල සඳහා පොත් හා උපකරණ පරිත්‍යාග කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් දිවයිනේ පිහිටි සම්පත් හීන පුස්තකාල නගා සිටුවීම පිණිස පොත් හා උපකරණ ආදිය පරිත්‍යාග කෙරේ. 1985 සිට ක්‍රියාත්මක වන මෙම පරිත්‍යාග වැඩසටහන යටතේ මූල්‍යමය අතින් දුර්වල තත්ත්වයක පවතින පළාත් පාලන ආයතන පුස්තකාල, පාසල්, පිරිවෙන් පුස්තකාල ආදියට පොත් පරිත්‍යාග ප්‍රදානය කරනු ලැබේ. 2006 සිට 2008 අතර කාල සීමාව තුළ මහජන පුස්තකාල 331ක්, පාසල් පුස්තකාල 1546ක් හා වෙනත් පුස්තකාල 1006 කටත් රු. මිලියන 17ක් පමණ වටිනා පොත් පරිත්‍යාග ලබා දී ඇත. තව ද දිවයිනේ කෝටාගත පුස්තකාල 200 ක

උමණ පොත් බැදුම් හා සංරක්ෂණ ඒකක ආරම්භ කරවීම සඳහා පොත් බැදුම් මේස හා උපකරණ කට්ටල පරිත්‍යාග කරන ලදී.

ඒ හැර සුනාමි ආපදාවෙන් විනාශයට පත් මහජන, පාසල් හා වෙනත් පුස්තකාල සඳහා විදේශ ආධාර ද ලබාගෙන මණ්ඩලය මගින් විවිධ අංශ යටතේ අධාර ලබාදී ඇත. විනාශයට පත් පුස්තකාලවලට නව ගොඩනැගිලි ඉදිකර දී ඇති අතර ලී බඩු, පොත් පත් හා උපකරණ ආදිය ද විශාල පරිමාණයෙන් පරිත්‍යාග කරන ලදී. සුනාමි ප්‍රදේශවල පුස්තකාල කාර්යමණ්ඩල සඳහා පුහුණුකිරීම් හා දැනුවත් කිරීමට අදාළ පුනරුත්ථාපන වැඩසටහන් රැසක් ද දියත් කරන ලදී.

## පොත් ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන සේවා

මණ්ඩලය මගින් නව ලේඛකයන්ට අතහිත දීම හා පොත් ප්‍රකාශනය දිරිගැන්වීම සඳහා ලේඛක ආධාර වැඩසටහනක් 1986 සිට ආරම්භගය කරන ලදී. වාර්ෂිකව අත්පිටපත් භාරගෙන ක්‍රියාත්මක වන එම ව්‍යාපෘතිය යටතේ ග්‍රන්ථ 2000 ට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත් වී ඇත. ඒ අතරේ රාජ්‍ය සම්මාන ලැබූ කෘති කීපයක් ද ඇත. දේශීය වශයෙන් නවක ලේඛකයින් බිහි කිරීමටත්, නව ග්‍රන්ථ එළි දැක්වීම තුළින් ප්‍රකාශන ප්‍රමාණය පුළුල් කිරීමටත් එමගින් වටිනා දායකත්වයක් සැපයෙන අතර පුස්තකාල සඳහා පරිත්‍යාග වශයෙන් ද එම පොත් ලබා දේ. එය දිවයිනේ පුස්තකාල සම්පත් සංවර්ධනයට රුකුලක් වේ.

ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ඉහත කී සේවාවන් දියත් කිරීම අඛණ්ඩව සිදුවේ. රටේ සංවර්ධනය මෙන් ම මහජනතාවගේ දැනුම දියුණු කිරීම සඳහා එමගින් ඉටුවන්නේ අමිල සේවයකි. ජාතියේ දැනුම හා ලිඛිත සාහිත්‍යයය ඒකරාශී කොට අනාගත පරපුර උදෙසා සුරකින අද්විතීය දැනුම් කෝෂ්ඨාගාරය ලෙස හැඳින්විය හැකි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය රටේ කීර්තිමත් ආයතනයක් ලෙස නැමදෙනා [illegible] පාත්‍ර වේ.

# ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිරි, එම් එස් යූ "ජාතික පුස්තකාල හා ඒවායේ කාර්යයන් " පුස්තකාල ප්‍රවෘත්ති 3 කලාපය අංක 2 අප්‍රේල් - ජුනි 1982 පි. 12-16

පරිපාලන වාර්තාව - 2004, කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2004

"පුස්තකාල ප්‍රවෘත්ති විශේෂ වෙළුම "23 වෙළුම 4 කලාපය හා 24 වෙළුම පළමු කලාපය, 2002 ඔක්. - දෙසැ. හා 2003 ජන-මාර්තු

පුස්තකාල ප්‍රවෘත්ති 28 වෙනි වෙළුම 1 කලාපය, ජනවාරි - මාර්තු 2007

ලයින්, මොරිස් බී "ජාතික පුස්තකාල සම්ප්‍රදාය හා වෙනස " පුස්තකාල ප්‍රවෘත්ති 8 කලාපය අංක, 3, 4 ජුලි - දෙසැ.1987 .20-22

National Libraries in the knowledge based society : Proceedings (National Library of Thailand, Centennial Celebration Internaional Conference : 6-8 July 2005, National Library of Thailand) Bangkok : National Library of Thailand, 2006, p.402

National Library and Documentation Centre : 10th Anniversary 1990-2000 Colombo : National Library and Documentation Centre, 2000, 73p

# මණ්ඩලයීය ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මගින් මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා ලබා දී තිබෙන දායකත්වය


## ඩබ්ලිව්. සුනිල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය


කිසියම් රටක ලේඛන කලාවේ ඇතිවන ප්‍රගමනයත් සමග ම ප්‍රකාශන ක්ෂේත්‍රය තුළ ද කිසියම් පිබිදීමක් ඇතිවීම සුලභ ලක්ෂණයකි. මානව ශිෂ්ටාචාරය තුළ මිනිසා විසින් සිය ප්‍රාථමික අවධිවල දී තම අදහස් හැඟීම් අන් අය වෙත ප්‍රකාශ කිරීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කොට ඇති බව මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. මිනිසා ඉතාමත් ප්‍රාථමික අවස්ථාවල දී තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවිධ අභිනයන් යොදාගත් අතර වර්තමානයේ පවා ප්‍රාථමික හා ගෝත්‍රික ජන කොටස් අතර ඒවා දක්නට ලැබේ. ඊට අමතරව තමන් විසින් මුහුණ දුන් විවිධ සිදුවීම් තම ජනාවාස ආශ්‍රිත ව විවිධ ස්ථානවල සිතුවම් කර දැක්වීමට ප්‍රාථමික මිනිසා පෙළඹී තිබේ. පසු කාලීනව මිනිසා විසින් භාෂාවක් නිපදවා ගැනීමත් සමග ම එතෙක් විවිධ අභිනයන්ගෙන් සහ විවිධ සංකේත හා රූපාක්ෂර භාවිතයෙන් අදහස් ප්‍රකාශ කරනු වෙනුවට ඒවා විවිධ පෘෂ්ඨ මතුපිට ලියා දැක්වීමට පෙළඹී තිබේ. මේ සඳහා මැටි පුවරු, පැපිරස්, පාච්මන්ට්, ගල් පුවරු, ලී පතුරු පුස්කොළ ආදිය උපයෝගී කොටගෙන තිබේ. පසු කාලීනව කඩදාසි සොයා ගැනීමත් සමඟ ම ලේඛන කලාව වැඩි දියුණු වූ අතර වර්ෂ 1456 දී ජර්මන් ජාතික ජෝහැන්නස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමඟම ඉතා ශීඝ්‍ර ලෙස ලොව පුරා විවිධ මාදිලියේ පොත්පත් හා ප්‍රකාශන බිහිවෙන්නට විය. පොතපත බිහිවීමත් සමඟ

ඒවා කියවන පරිශීලනය කරන සමාජයක් බිහිවූ අතර, ඒ මගින් ලොව පුරා දැනුම සහිත සමාජයක් නිර්මාණය කරන්නට මූලික පදනම වැටුණි. මේ නිසා මුද්‍රණ තාක්ෂණය මෙන් ම ප්‍රකාශන කටයුතුවල ද ශීඝ්‍ර පිබිදීමක් ඇති වුණි. විවිධ පුද්ගලයින් විසින් ඉතා සීමාසහිත ලෙස සිදු කෙරුණු මුද්‍රණ කටයුතු හා ප්‍රකාශන කටයුතු වෙනුවට විශේෂයෙන් ම යුරෝපා රටවල් ආශ්‍රිතව මහා පරිමාණ මුද්‍රණ සමාගම් මෙන් ම ප්‍රකාශන සමාගම් බිහි විය. මෙම සමාගම් හරහා වාර්ෂිකව විශාල පරිමාණයෙන් පොතපත බිහි වූ අතර එම පොතපත ලොව පුරා ව්‍යාප්ත වීමක් ද සිදුවිය. මේ නිසා පොතපත එක් විටක දැනුම සන්නිවේදනය කිරීමේ එක් ප්‍රධාන වාහකයක් ලෙස කටයුතු කොට තිබේ.

මෙරට පොතපත බිහිවීමට පූර්වයෙන් බුද්ධාගම හා බැඳුණු දියුණු සාහිත්‍යයක් පැවති අතර ඉතා දීර්ඝ කාලයක් පුරාවට ඒවා මුඛ පරම්පරාගතව පවත්වාගෙන එමින් ක්‍රි.ව. 4 වන සියවසේ සිට පුස්කොළ ආශ්‍රිතව ලේඛනගත කිරීම ආරම්භ විය. පුස්කොළ පදනම් කොටගත් මෙරට ලේඛන ක්‍රමය ශ්‍රී ලංකාවේ විහාරස්ථාන කේන්ද්‍රකොට ගනිමින් පැවති බවට මෙරට ලේඛන කලාව අධ්‍යයනයේ දී පැහැදිලිවන කරුණකි. කෙසේ වුව ද මෙරට ලන්දේසි සමයේ දී මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දුන් අතර, එතැන් සිට ක්‍රමයෙන් මුද්‍රණ කටයුතුවල ශීඝ්‍ර පිබිදීමක් ඇතිවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රමයෙන් පොතපත ඇතුළු අනෙකුත් ප්‍රකාශනවල බිහිවීම දක්නට ලැබුණි. මෙරට බ්‍රිතාන්‍ය පාලන සමයේ දී පුවත්පත් ඇතුළු පොතපත මුද්‍රණය හා ප්‍රකාශනය ක්‍රමයෙන් වැඩෙන කර්මාන්තයක් වූ අතර, බොහොමයක් ප්‍රකාශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවීම මෙම යුගයේ දක්නට ලැබෙන විශේෂත්වයකි. මෙරට ප්‍රජාව අතර, සාක්ෂරතාව ක්‍රමයෙන් වර්ධනය වීමටත්, දැනුම සහිත සමාජයක් බිහිවීමටත් පොතපත ප්‍රබල මාධ්‍යයක් වූ බව ප්‍රකට කරුණකි. ශ්‍රී ලංකාව බටහිර ජාතීන්ගෙන් නිදහස ලැබීමත්,සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්වීමත් සමග ම විශාල පරිමාණයෙන් ස්වදේශීය භාෂාවන්ගෙන් පොතපත බිහිවන්නට විය.

# පොතපත සඳහා අනුග්‍රහය ලබාදීම

පොතපත ප්‍රකාශනය සඳහා කිසියම් පාර්ශවයක අනුග්‍රහය ලබාදීම රටක ප්‍රකාශන කර්මාන්තයේ ඉදිරි ප්‍රගමනයට ඉවහල්වන ප්‍රබල සාධකයකි. මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රයේ ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ මුද්‍රණ තාක්ෂණය මෙරටට හඳුන්වා දීමත් සමගම බොහොමයක් ප්‍රකාශන මුද්‍රණය හා ප්‍රකාශනය සඳහා ආගමික මධ්‍යස්ථානවල අනුග්‍රහය ලද බවය. ආගමික මධ්‍යස්ථාන ආශ්‍රිතව මුද්‍රණ යන්ත්‍ර පවත්වාගෙන යමින් විවිධ ප්‍රකාශන මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කොට ඇති බව මෙරට මුද්‍රණ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. කෙසේ වුව ද 1959 වසරේ සිට ආරම්භ වූ රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානය හේතුවෙන් මෙරට ලේඛකයින්ගේ ප්‍රකාශන වාර්ෂිකව අගය කිරීමට ලක් කිරීමත් මුදලින් ත්‍යාග ලබාදීමත් හේතුවෙන් පළමුවරට මෙරට ප්‍රකාශන සඳහා රජයේ විශේෂ අවධානය යොමුවීම වැදගත් සන්ධිස්ථානයකි. මෙරට ප්‍රකාශන සඳහා රාජ්‍ය සම්මාන පිරිනැමීමත් සමග ම වාර්ෂිකව පළවන ප්‍රකාශන අගය කිරීමට ලක්වීම හේතුවෙන් වඩා ගුණාත්මක ප්‍රකාශන මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්වීමට යම් වක්‍ර හෝ බලපෑමක් ඇතිවී ඇති බව ඉතා පැහැදිලි කරුණකි. එමෙන්ම විසිවන සියවස මැද භාගයේ දී ලේඛන කලාව කෙරෙහි දේශීය ලේඛකයන් තුළ ඇතිවූ උනන්දුව හේතුවෙන් මෙරට ක්‍රමයෙන් පොතපත සුලභ වීමත් ඒ කෙරෙහි මෙරට ජනතාව අතර විශාල උනන්දුවක් ඇතිවීමටත් හේතුවිය. නිදහස ලැබීමෙන් පසු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම් විශේෂයෙන් මෙරට විශ්වවිද්‍යාලවල ප්‍රමාණය වැඩිවීමත් ඒ හරහා දේශීය උගතුන්ගේ වැඩිවීමත් 1956 න් පසු ඇතිවූ ස්වභාෂා අධ්‍යාපන ක්‍රමයත් මෙරට පොතපත සුලභ වීමට හේතුවිය. ප්‍රාදේශීය වශයෙන් මධ්‍ය මහා විද්‍යාල ඇතිවීම නිසා ඒවායින් කියවීමට උනන්දු වූ විශාල පිරිසක් ග්‍රාමීය මට්ටමින් ද බිහිවීම වැනි හේතු ගණනාවක් නිසා පොතපත පිළිබඳ වැඩි උනන්දුවක් ජනතාව තුළ ඇතිවිය. ටී.ජ්. පියදාස මහතා පවසන පරිදි 1960 ගණන් වනවිට මේ සඳහා අත්තිවාරම ලෙස සැලකිය හැකි ජාතික පොත් සංස්ථාව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හා ජාතික

ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය පිහිටුවීම ද මෙහි දී කැපී පෙනෙන සිද්ධියක් බවය (පියදාස, 1985). මෙම කාල වකවානුවේ ම දියුණුවන රටවල පොතපත, අධ්‍යාපනය, සංස්කෘතික කටයුතු ආදිය කෙරෙහි යුනෙස්කෝ සංවිධානය මහත් උනන්දුවක් දක්වනු ලැබූ අතර, ශ්‍රී ලංකාව තුළ ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයක් ඇතිකිරීමට උත්සුක විය. එම කාර්යය සඳහා එවකට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ව සිටි එම්.ජේ.පෙරේරා මහතා විසින් ග්‍රන්ථ කර්තෘවරුන් පොත් ප්‍රකාශකයින්, මුද්‍රණ ශිල්පීන්, පොත් වෙළඳුන් ඒකරාශි කොට මෙරට ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය පිහිටුවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය යන නම එම ආයතනයට පසුව ලැබුණු අතර එම ආයතනය ආරම්භයේ දී පිහිටුවනු ලැබුවේ ජාතික පොත්පත් සංස්ථාව වශයෙනි. එය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ආරම්භ වූ අතර, පසුව ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය ද අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදී. පොත්පත් සංස්ථාව මගින් එම කාලයේ දී "පතපොත" නමින් සඟරාවක් පළකළ අතර එවකට දිනමිණ පුවත්පතේ කර්තෘ මණ්ඩලයේ සිටි පියසේන නිස්සංක මහතාත් මහාචාර්ය බඹරැන්දේ සිරිසීවලී හිමිපාණෝත් මෙම සඟරාව ප්‍රකාශයට පත්කිරීම සඳහා දැඩි උනන්දුවකින් කටයුතු කොට තිබේ. ජාතික පොත්පත් සංස්ථාව මගින් එවකට ජංගම පුස්තක සේවා, පොත් ප්‍රදර්ශන, පොත් සල්පිල් ආදිය සංවිධානය කළ අතර ජනතාව අතර පොතපත ජනප්‍රිය කරවීම සඳහා නොයෙකුත් ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහි මූලික අරමුණ වී තිබුණේ මෙරට ලේඛකයින්, ප්‍රකාශකයින් හා පොත් වෙළඳුන් දිරිගැන්වීමයි. ජාතික පොත්පත් සංස්ථාව මගින් එම කාලයේ දී හොඳ පොතපත තෝරා සම්මාන හා සහතික ලබාදීමට කටයුතු කොට තිබෙන අතර, යාපනයේ සිට ද්‍රවිඩ ලේඛකයින් කොළඹ නගරයට ගෙන්වා සාහිත්‍ය තරඟ හා පොතපත හා සම්බන්ධ විවිධ සම්මන්ත්‍රණ සංවිධානය කිරීමට ද කටයුතු කොට තිබේ.

මෙරට පුස්තකාලයාධිපතිවරුන් විවිධ විද්වතුන් මෙන්ම යුනෙස්කෝවේ ද මූලික මැදිහත්වීම මත එවකට පැවති රජය විසින්

1970 වසරේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවනු ලැබූ අතර, ඒ මගින් දේශීය පොතපත කෙරෙහි පැවති උනන්දුව වඩා තීව්‍රකර වීමට ද හේතු විය. එම ආයතනය පිහිටුවීමෙන් පසු බොහෝ දෙනා සලකනු ලැබුවේ ශ්‍රී ලංකාවේ සෙසු පුස්තකාලවල මව් ආයතනය වශයෙනි. පුස්තකාල සේවා මණ්ඩලය ද මෙරට පොතපත සුලභ කිරීමේ ජාතික මෙහෙවරට අතදීමක් වශයෙන් 1984 වසරේ ජුලි මාසයේ දී ග්‍රන්ථ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. වී.ජ්. පියදාස මහතා පවසන පරිදි "පුස්තකාල සේවා මණ්ඩලය දැනට ක්‍රියාත්මක ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය මේ යුගයේ ජාතික අවශ්‍යතාවක් ලෙස අගය කළයුතු වෙයි. පුස්තකාල සඳහා වැඩි වශයෙන් පොතපත අවශ්‍ය වෙයි. මේ කාලය යම් යම් හේතු සාධක නිසා පොතපත ලිවීමත්, මුද්‍රණයත් පළවීමත් ඉතාමත් අඩුබව රහසක් නොවේ. මේ තත්වය තේරුම් ගෙන මණ්ඩලය ලේඛකයින් හා ප්‍රකාශකයින් දිරි ගැන්වීමටත් පොතපත බහුල කිරීමටත් මේ දරන උත්සාහය ඉතා අගනා ක්‍රියාවක් ලෙස සැලකිය හැකිය". (පියදාස 1985)

## පොත් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් 1984 වසරේදී ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මූලික අරමුණු ලෙස එන්.අමරසිංහ මහතා පෙන්වා දෙන්නේ මෙරට පොත් ප්‍රකාශන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමත් පොදු පාඨක ප්‍රජාව අතර ඵලදායි පුස්තකාල සේවාවක් බිහිකරලීම සඳහා පොතපත සුලබ කිරීමත්ය. (Amarasinghe, 1986) මෙම වැඩසටහන ආරම්භ කරන අවධිය වන විටත් ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ දියුණු වෙමින් පැවති රටවල වාර්ෂිකව ප්‍රකාශයට පත්වන පොත් සංඛ්‍යාව ඉතා සීමිත අගයක් ගත් අතර, ජනතාව අතර කියවීම සඳහාත් ඔවුන් අතර පොතපත කියවීමට උනන්දුවක් ඇතිකරලීම සඳහා එම ප්‍රමාණය ප්‍රමාණවත් නොවීය. මේ නිසා එම රටවල පොත් පිපාසයක් (Book Hunger) පැවති බව යුනෙස්කෝ සංවිධානයේ ද පිළිගැනීම විය. මේ තත්වය මෙරට මැඩ පැවැත්වීම සඳහා විවිධ සංවිධාන හා ආයතන උත්සාහ ගෙන තිබේ. කෙසේ වුව ද එමගින්

ප්‍රමාණවත් විසඳුම් සපයාගත නොහැකි විය. ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් වශයෙන් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකරන ලදි. ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව බොහෝ රටවල ජාතික පුස්තකාල විසින් තම රටවල පොත් ප්‍රකාශන කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා සුවිශාල කාර්යභාරයක් ඉටුකරනු ලැබේ.

ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1984 වසරේ දී මෙම වැඩ සටහන ආරම්භ කිරීමේ දී මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හඳුනාගත් ප්‍රධාන ගැටලු දෙකක් වන්නේ පොත් ප්‍රකාශනය සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම හේතුවෙන් ඒවා අලෙවිකර ගැනීමේදී කර්තෘවරුන් මෙන්ම ප්‍රකාශකයින් ද මුහුණදෙන ගැටලුව සහ එහි බලපෑම මත දේශීය පොත්වෙළඳ පොල සීමාසහිත එකක් වීමය. මෙය ග්‍රන්ථ කර්තෘවරුන්ටත් පොත් ප්‍රකාශකයින්ටත් එකසේ බලපෑ පොදු ගැටලුවක් වූ අතර පොත් ප්‍රකාශනය සඳහා අධික වියදමක් දැරීම හේතුවෙන් පොත් මිල ද ශීඝ්‍ර ලෙස ඉහළ යාම වළක්වාගත නොහැකි විය. මේ හේතුව මත පොතපත මිල දී ගැනීමට අධික වියදමක් දැරීමට පාරිභෝගිකයාට සිදුවීමෙන් පොත් ඉල්ලුම අඩු වූ අතර, එය ප්‍රකාශකයන් අධෛර්යමත් කිරීමට ද හේතුවක් විය. ප්‍රසිද්ධ ලේඛකයන් අතලොස්සකට පමණක් යම් ලාභයක් ලබාගත හැකි වුවත් පොදුවේ මෙරට ප්‍රකාශන කර්මාන්තයට සුබදායි යුගයක් නොවීය. බොහෝ ප්‍රකාශකයින්ට තමන් පොතපත වෙනුවෙන් ආයෝජනය කළ මුදල පියවා ගැනීමට වසර ගණනාවක් බලා සිටීමට සිදුවිය. එම නිසා පොත් ප්‍රකාශනය සඳහා මුදල් ආයෝජනය කොට මූල්‍යමය අවධානමක් (Financial risk) දැරීමට ප්‍රකාශකයෝ අධෛර්යමත් වූහ. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පොත් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පියවර තැබුයේ මෙවන් පසුබිමක සිටය. 1984 වසරේ ජූලි මාසයේ ආරම්භ කළ මෙම වැඩ සටහන මගින් 2009 වසර වනවිට ග්‍රන්ථ නාම 2500 කට ආසන්න ප්‍රමාණයක් මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රයට දායාද කරලීමට හැකියාව ලැබී තිබේ.

# අනුග්‍රහය ලබාදීමේ ක්‍රමවේදය

මෙම පොත් ප්‍රකාශන ආධාර වැඩසටහන යටතේ ලේඛකයන් වෙත අනුග්‍රහය ලබාදීම සඳහා සැම වසරක ම පළමු කාර්තුවේ දී ලේඛකයන් වෙතින් අත් පිටපත් කැඳවනු ලබන අතර, එම අත් පිටපත් එම විෂයයන් හා සම්බන්ධ විද්වතුන් වෙත යොමුකොට ලබාගන්නා සමීක්ෂණ වාර්තාවලට අනුව අනුග්‍රහය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුකෙරේ. අත් පිටපත් සම්බන්ධ සියලු තීරණ ගැනීම ප්‍රකාශන උපදේශක කමිටුවක් මගින් සිදුකරන අතර, එම කමිටුව මෙරට විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගෙන් මෙන්ම මෙරට ඉහළ පෙළේ විද්වතුන්ගෙන් සමන්විත වේ. සමීක්ෂකයන් වෙත යැවෙන අත්පිටපත්වලට අදාළ සමීක්ෂකයන් තෝරා ගැනීම සිදුකෙරෙන්නේ ද මෙම ප්‍රකාශන උපදේශක කමිටුව මගිනි. සමීක්ෂකයන් වෙත අත් පිටපත් යොමුකිරීමේ දී ඒවායේ රහස්‍ය භාවය උපරිම මට්ටමින් සුරකින අතර, කිසිදු අවස්ථාවක සමීක්ෂකවරයා වෙත අත්පිටපත අයත් කර්තෘ පිළිබඳව හෝ කර්තෘ වෙත අදාළ සමීක්ෂකවරයා පිළිබඳව හෝ තොරතුරු හෙළි නොකිරීම මෙම වැඩ සටහනේ විශේෂත්වයකි. සමීක්ෂණ වාර්තාවලට අනුව ප්‍රකාශන උපදේශක කමිටුවේ තීරණය පරිදි අනුග්‍රහය ලබාදීමට තෝරාගන්නා අත් පිටපත් සඳහා මුදලින් අනුග්‍රහය ලබාදීම සිදුකරනු ලැබේ. අනුග්‍රහය ලබාදීමේ දී උපරිම ආධාර මුදල රු. 50,000 ක් වන අතර, එම ලබාදෙන ආධාර මුදලට සමානුපාතිකව එම පොත සඳහා මණ්ඩලය තීරණය කරගත් මිලකට අනුව පිටපත් ප්‍රමාණයක් මණ්ඩලය ලේඛකයා වෙතින් මිල දී ගනු ලැබේ. මෙම ආධාර මුදලේ උපරිමය සමහර වසරවල රු 100,000 දක්වා පැවති අතර ලැබෙන ප්‍රතිපාදනවලට අනුව එම මුදල වසරින් වසර වෙනස් වේ. මෙලෙස අනුග්‍රහය ලබාදීම මගින් ලේඛකයාට පොත මුද්‍රණය කරගැනීම සඳහා අවශ්‍ය මූලික පිරිවැය දරාගතහැකි අතර, එම කෘතිය ප්‍රකාශකයෙකු යටතේ ප්‍රකාශයට පත්කරන්නේ නම් ඕනෑම ප්‍රකාශකයෙකු පැකිලීමකින් තොරව ඒ සඳහා ඉදිරිපත් වේ. මේ මගින් බලාපොරොත්තු වන්නේ පොතපත රචනා කිරීම සඳහා ලේඛකයන් උනන්දු කරවීමත් පොතපත ප්‍රකාශයට පත්කිරීම සඳහා ප්‍රකාශකයන් දිරිමත් කිරීමත්ය. මේ මගින්

පොත්වල මිල සාධාරණ මට්ටමක පවත්වාගෙන යාමටත් රට තුළ පොතපත බහුල කිරීමත් අපේක්ෂා කෙරේ.

## අරමුණු :

## පොත්පත්වල ගුණාත්මක බව ඉහළ නැංවීම

මෙම වැඩසටහනේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ පොත්පත්වල ගුණාත්මක බව ඉහළ තලයකට රැගෙන ඒම සඳහා දේශීය ලේඛකයන් දිරිමත් කිරීමය. මේ යටතේ පොත්පත්වල අන්තර්ගතය පෙළගැස්ම හා පොත්වල භෞතික සැකැස්ම කෙරෙහි කර්තෘවරුන් ප්‍රකාශකයන් උනන්දු කිරීම මෙම වැඩසටහන මගින් බලාපොරොත්තු වේ.

පොතපත සුලබ කිරීමත් සමග ම ඒවායේ ගුණාත්මක බව ඉහළ මට්ටමක පැවතීම රටක ප්‍රකාශන කර්මාන්තයේ සංවර්ධනයක් අපේක්ෂා කරන්නන්ගේ බලාපොරොත්තුව වේ. මෙම ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කිරීම මගින් අපේක්ෂා කළ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ඕනෑම කෘතියක අන්තර්ගතය ඉහළ මට්ටමක පැවැතීමත් ඒවායේ ශාස්ත්‍රීය මට්ටම උසස් මට්ටමක පැවතීමත් ය. මෙම අරමුණ ඇතිව අත් පිටපත් සමීක්ෂණය සඳහා යොමුකෙරෙන අතර, සමීක්ෂකවරුන්ගේ යෝජනා හා අදහස්වලට අනුව කෘතියක අන්තර්ගතය උසස් මට්ටමකට රැගෙන ඒමට කටයුතු කෙරේ. ඊට අමතරව ප්‍රකාශන කර්මාන්තයේ පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව උසස් පෙළ ගැස්මකින් යුත් පොතක් නිර්මාණය කිරීම සඳහා ද මේ මගින් ප්‍රකාශකයන් උනන්දු කෙරේ. එහි දී පොතක මුල් පිටු එහි අන්තර්ගතය හා පසු පිටු සකස් කිරීම නිසි ප්‍රමිතියකට අනුව සිදුකිරීම කෙරෙහි ප්‍රකාශකයින්ගේ අවධානය යොමු කෙරේ. ඊට අමතරව පොතක පිට කවරය, එහි භාවිත වර්ණ, කඩදාසිවල ස්වභාවය, අකුරුවල ප්‍රමිතීන් මෙන් ම අන්තර්ගත ඡායාරූප ද ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව පොතකට ඇතුළත් කිරීම පිළිබඳව කර්තෘවරුන්, ප්‍රකාශකයින්, මුද්‍රණකරුවන් අතර උනන්දුවක් ඇතිකරලීමට පසුගිය

කාලය තුළ මෙම වැඩ සටහනට හැකියාව ලැබී ඇති බව කිව යුතුය. පසුගිය කාලවල දී පොත්පත්වල කඩදාසි සඳහා නුසුදුසු මට්ටමේ කඩදාසි භාවිත කළ ද මෙම ව්‍යාපෘතිය යටතේ එම පාර්ශව දැනුවත් කිරීම හේතුවෙන් උසස් මට්ටමේ පොතපත මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා ප්‍රකාශකයන් පෙළඹී තිබේ. එපමණක් නොව ජාත්‍යන්තර ප්‍රකාශන කර්මාන්තයේ අනුගමනය කරන ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අතර අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) ප්‍රකාශනගත සූචිකරණ දත්ත නිසි ප්‍රමිතියකට අනුව සකස්විය යුතු ග්‍රන්ථනාමාවලිය ආදී මූලික ප්‍රමිතීන් පිළිබඳව ලේඛකයන් ප්‍රකාශකයන් දැණුවත් කිරීම මගින් ශ්‍රී ලාංකීය ප්‍රකාශන ක්ෂේත්‍රය ඉහළ තලයකට රැගෙන ඒම සඳහා මෙම ව්‍යාපෘතියට දායකත්වය ලබාදීමට හැකියාව ලැබී තිබේ.

## ග්‍රන්ථ කර්තෘවරුන් හා පරිවර්තකයින් දිරිමත් කිරීම

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමග ම මෙරට බොහෝ ලේඛකයින් හට පොතපත ප්‍රකාශයට පත් කිරීම සඳහා විශේෂ අත්වැලක් සැපයුණු බව සඳහන් කළ හැකිය. මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වන පොතපත අලෙවි කර ගැනීමේ දී විශාල අභියෝගයකට මුහුණ දීමට ප්‍රකාකශකයන්ට සිදුවන බැවින් ඔවුහු බොහෝ විට ආධුනික මට්ටමේ ලේඛකයන්ගේ පොතපත ප්‍රකාශයට පත් කිරීම සඳහා මැලිකමක් දැක් වූහ. ප්‍රවීණ ලේඛකයන්ගේ පොතපත සඳහා යම් පාඨක ඉල්ලුමක් පවතින බැවින් බොහෝ අවස්ථාවල දී ප්‍රසිද්ධ මෙන් ම ප්‍රවීණ මට්ටමේ ලේඛකයන් ගේ පොතපත ප්‍රකාකශයට පත් කිරීම සඳහා ප්‍රකාශකයෝ උනන්දු වෙති. බොහෝ අවස්ථාවල දී ආධුනික ලේඛයන්ගේ පොතපත ප්‍රකාශයට පත්කිරීම සඳහා උනන්දුවක් නො දැක්වීම හේතුවෙන් කුසලතා ඇති ආධුනික ලේඛයන් ට ඉදිරියට ඒමට පැවති අවස්ථා ඉතා සීමා සහිත විය. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමග ම මෙරට ආධුනික ලේඛකයින් රැසකට මෙම ක්ෂේත්‍රය සඳහා අවතීර්ණ වීමට හැකියාව ලැබුණු අතර වර්තමානයේ ප්‍රවීණ ලේඛකයන්

බවට පත්ව සිටින මෙරට ලේඛකයන් ගණනාවක් මෙම ව්‍යාපෘතිය යටතේ අත්පොත තැබුවන් බව ප්‍රකට කරුණකි.

දේශීය කෘතිවලට පමණක් නොව මෙරට පරිවර්තකයන් විසින් පරිවර්තනය කරනු ලබන පරිවර්තන කෘති ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම මගින් මෙරට පරිවර්තන සාහිත්‍ය දියුණු කිරීමට අනුබල ලබාදෙන අතර පසුගිය කාල වකවානුව තුළ විශ්ව සාහිත්‍යයේ සම්භාවනාවට පත් කෘති රැසක් මෙරට සාහිත්‍යයට දායාද කිරීමට හැකියාව ලැබුණි. මේ මගින් විශ්ව සාහිත්‍යයේ උසස් කෘති රස විඳීම සඳහා මෙරට පාඨකයිනට අවස්ථාව ලැබෙන අතර එවැනි කෘති පරිවර්තනය කරන්නන් දිරිමත් කිරීමට ද මෙය හේතු වේ.

## පොතපත කියවීම ප්‍රවර්ධනය කිරීම

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණක් වූයේ දේශීය වශයෙන් පොතපත සුලබ කිරීමයි. මුද්‍රණ අනුග්‍රහය හිමිවන සෑම පොතකින් ම අවම වශයෙන් පිටපත් දහසක් මුද්‍රණය කිරීම සඳහා කර්තෘවරු පොළඹවන අතර ඒ මගින් වැඩි පාඨක පිරිසක් අතර පොතපත පැතිර යාමට හේතු වේ. මේ මගින් දේශීය වශයෙන් පොතපත කියන ප්‍රබුද්ධ පාඨක පිරිසක් බිහිකිරීම අරමුණ වේ.

## පොත් මිල සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම

කඩදාසි මිල සහ මුද්‍රණ වියදම් ඉතා ශීඝ්‍ර ලෙස ඉහළ යාම පොත්මිල ඉහළ යාමට ඍජු ලෙස බලපා තිබේ. පොත් මිල ඉහළ යාම හේතුවෙන පොත් අලෙවිය සීමාවන අතර, පොත් වෙළෙන්දන් මෙන් ම පොත් ප්‍රකාශකයන් ද අධෛර්යමත් කිරීමට ප්‍රබල හේතුවක් වේ. පොත් මිල ඉහළ යාම පාඨකයින්ට ද බලපාන අතර එය පොතපත කියවීම සීමා කිරීමට ද හේතු වේ. මෙම වැඩසටහන යටතේ ලේඛකයන් වෙත මූල්‍යමය අනුග්‍රහයක් ලබාදීම මගින් ප්‍රකාශකයන් ද පොතපත

ප්‍රකාශයට පත් කිරීම සඳහා පොළඹවන අතර එය පොත් මිල සාධාරණ මට්ටමක පවත්වා ගෙනයාම සඳහා හේතු වනු ඇත.

## ජාතික පුස්තකාල සේවාව ප්‍රවර්ධනය කිරීම

මෙරට පුස්තකාල අතර මව් ආයතනය වශයෙන් ක්‍රියා කරනු ලබන ජාතික පුස්තකාලය, සෙසු පුස්තකාලවල සේවා වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ මෙරට ග්‍රාමීය මෙන් ම අර්ධ නාගරික ප්‍රදේශවල පවත්නා පුස්තකාලවල එකතු සංවර්ධනය සඳහා වාර්ෂිකව විශාල පොත් ප්‍රමාණයක් පරිත්‍යාග වශයෙන් ලබා දීමට ක්‍රියාකරනු ලැබේ. මෙලෙස පරිත්‍යාග කිරීම සඳහා අවශ්‍ය පොත්පත් විශාල සංඛ්‍යාවක් මෙම වැඩසටහන යටතේ ලේඛකයන් වෙතින් ලබා ගැනීම සිදු කෙරේ. ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මඟින් දේශීය ලේඛකයින්ට අතදීම ප්‍රධාන අරමුණක් වුව ද ඒ යටතේ ලබා ගන්නා පොතපත මඟින් මෙරට පුස්තකාල සේවාවේ ප්‍රවර්ධනය සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන බව සඳහන් කළ හැකිය.

## ගැටලු :

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කරනු ලබන බොහෝ අත්පිටපත් නිසි පරිදි සකස් නොකොට ඉදිරිපත් කිරීම ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනා ගත හැකිය. බොහෝ ලේඛක ලේඛිකාවන් කල්තබා අත්පිටපත් සකස් කොට ඉදිරිපත් කිරීම වෙනුවට අත්පිටපත් භාරගන්නා බව දැක්වෙන පුවත්පත් දැන්වීම පළවීමෙන් පසු ඒ සඳහා සූදානම් වන බව පැහැදිලි කරුණකි. එම හේතුව නිසාවෙන් නිසි පරිදි සෝදුපත නොකියවීම මත භාෂා දෝෂ, ව්‍යාකරණ දෝෂ ආදිය බහුල වීමත්, ඒවායේ නිර්මාණ ගුණය හීන වීමත් හේතුවෙන් වැඩි අත්පිටපත් සංඛ්‍යාවක් වාර්ෂිකව ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමට සිදු වී තිබේ.

පොත්වල මිල සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් වුව ද ප්‍රකාශකයින් විසින් අධික ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් විවිධ හේතු ඉදිරිපත් කොට පොත් සඳහා ඉහළ මිලක් නියම කිරීම දැකගත හැකිය. මෙම තත්වය කර්තෘ ප්‍රකාශනවලට වඩා ආයතනික ප්‍රකාශනවල දැකගත හැකිය.

අත්පිටපත් සම්බන්ධ මූලික තීරණ ලබා ගැනීම සඳහා සමීක්ෂකයින් වෙත යැවෙන අතර සෑම විටම ඔවුන් වෙතින් ලබා ගන්නා සමීක්ෂණ වාර්තාවලට අනුව අත්පිටපත් සම්බන්ධ තීරණ ගනු ලැබේ. සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා යැවෙන අත්පිටපත සීමිත කාලසීමාවකට යැවෙන අතර සමහර අත්පිටපත් සමීක්ෂකවරු ළඟ දීර්ඝ කාලයක් තබා ගැනීම හේතුවෙන් ඒ පිළිබඳ විසඳුම් ලබා දීමට දීර්ඝ කාලයක් ගත වීම ප්‍රබල ගැටලුවක් වී තිබේ. නිර්මාණාත්මක අත්පිටපත් සඳහා සති දෙකක කාලයක් ද ශාස්ත්‍රීය මට්ටමේ අත්පිටපතක් සඳහා මසක කාල සීමාවක් ලබා දුන්න ද සමහර සමීක්ෂකයින් ළඟ මාස ගණනාවක් තබා ගැනීම මඟින් මණ්ඩලය ප්‍රබල ගැටලුවකට මුහුණ දී තිබේ. මේ හේතුව නිසා බොහෝ ලේඛකයින් තුළ මෙම ව්‍යාපෘතිය කෙරෙහි අප්‍රසාදයක් ඇති කරලීමට ද හේතු වේ.

## සමාලෝචනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1984 වසරේ දී ආරම්භ කළ පොත් ප්‍රකාශන ආධාර වැඩ සටහන මගින් වසර විසිපහක කාල පරිච්ඡේදය තුළ මෙරට ප්‍රකාශන ක්ෂේත්‍රයට මාහැඟි දායකත්වයක් ලබාදී ඇති බව කිව යුතු ය. සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ග්‍රන්ථ නාම 2500 කට ආසන්න සංඛ්‍යාවක් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා දායකත්වය ලබාදී තිබෙන අතර එ මගින් දේශීය ලේඛකයන්ට තම බුද්ධිය මෙහෙයවා කරනු ලබන උසස් නිර්මාණ ප්‍රකාශයට පත්කිරීමට හැකියාව ලැබී තිබේ. මෙලෙස බිහිවූ කෘති අතරින් විශාල ප්‍රමාණයකට රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලැබී තිබීම ද සුවිශේෂ කරුණකි. එමගින් පැහැදිලි වන්නේ මෙරට ප්‍රකාශන

කර්මාන්තය සඳහා ගුණාත්මක මට්ටමේ උසස් ප්‍රකාශන දායාද කිරීමට මෙම ව්‍යාපෘතිය සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇති බවය.

## ආශ්‍රිත ග්‍රන්ථ :


අලහකෝන්, උදිත; සුනිල්, ඩබ්ලිව් (2004) රාජ්‍ය සම්මානලාභී සිංහල ග්‍රන්ථ නාමාවලිය, කොළඹ : ඇස්.ගොඩගේ,

ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය (2003) කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

දයාරත්න බන්දුල පී. (2006) පොත් ප්‍රකාශනය ව්‍යාපෘතියක් වශයෙන් ලංකාවට විශේෂිත, බත්තරමුල්ල : රුවන් ප්‍රකාශන

පියාදාස, ටී.ජී. ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තීය පිළිබඳ මතක සටහන් ; පුස්තකාල ප්‍රවෘත්ති. 1995 ජුලි - සැප්.,පි. 5 - 8

පෙරේරා, නිමල් ආර්යවංශ (2006) පොත් සැලසුම් කිරීම ; වැල්ලම්පිටිය : ලස්සන ප්‍රකාශකයෝ

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය - 2009 විස්තර පත්‍රිකාව ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

බොතේජු, බොබී. ඒ (2005) ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ මූලික සංකල්ප, කොළඹ : එස්.ගොඩගේ.

හපුආරච්චි, අජන්තා (2003) මුද්‍රණ ශිල්පය; ප්‍රභවය හා පරිනාමය ශ්‍රී ලංකාවට විශේෂිත කොළඹ : එස්.ගොඩගේ

හේමපාල, නුවරඑළියේ (2005) මුද්‍රණ සන්නිවේදනයේ සම්භවය සහ ප්‍රථම සිංහල මුද්‍රිත පොත, මුල්ලේරියාව : විජේසූර්ය ග්‍රන්ථ කේන්ද්‍රය

Amarasinghe, N (1986) Book promotion project: A catalogue of books published under the sponsorship of the Sri Lanka National Library Services Board, Colombo : Sri Lanka National Library Services Board.

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලේඛන කළමනාකරණයේ දී හා සංරක්ෂණයේ දී මුහුණදෙන අභියෝග

## ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ

මෙරට රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය නීතියෙන් පැවරී ඇත්තේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ය. මෙකී නෛතික බලය පැවරී ඇත්තේ, 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක නීතිය හා එකී පනත සංශෝධනය කෙරුණු 1981 අංක 30 දරණ ජාතික ලේඛනාරක්ෂක පනත අනුව ය. ඒ අතර, රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක කරන ආයතන සංග්‍රහයේ 29 වෙනි පරිච්ජේදයේ 9;1 - 9;8 දක්වා වගන්ති ද බලපානු ලබයි.

''රාජ්‍ය ලේඛනයක් '' යනු, රජයේ ආයතනවල දෛනික රාජකාර් තුළින් නිර්මාණය වන විවිධ වර්ගයේ ලේඛන ලෙස ගැනේ. එනම් කඩදාසි පාදක ලිපි ලේඛන, ශ්‍රව්‍ය දෘශ්‍ය සහ පරිගණක ලේඛන ද මේ ගණයට වැටේ. රාජ්‍ය ආයතනවලින් දෛනිකව නිර්මාණය වන රාජ්‍ය ලේඛන ප්‍රමාණය දළ වශයෙන් වුව ද ගණන් බලා නැති නමුදු, එය ඉතා අධික සංඛ්‍යාවක් බව ඕනෑම රජයේ ආයතනයකට ගියවිට එහි විවිධ අංශවල තැන්පත් කර ඇති ලිපි ලේඛනවලින් දෘශ්‍යමාන වේ. මෙසේ තැනින් තැන අවිධිමත් ව තැන්පත් කර ඇති ලේඛන රාශිය හේතු කොට ගෙන ඒවායේ කළමනාකාරිත්වය සහ සංරක්ෂණය පිළිබඳ සංකීර්ණ වූ ද, විවිධ වූ ද ප්‍රශ්න පැන නගී.

ලේඛන කළමනාකරණ මූලධර්මවල, මෙවැනි සංකීර්ණ ලිපිලේඛන වර්ග සම්බන්ධ ප්‍රශ්න විසඳීමට ලේඛනවල ජීවන චක්‍රය පාලනය කිරීමේ විධි සහ ක්‍රම යොදා ගනු ලබයි. ''ලේඛනවල ජීවන

චක්‍රය පාලනය කිරීමේ දී එම ලේඛනවල අඩංගු වන සංරක්ෂණ ප්‍රශ්න ද විසඳා ගැනීමට ක්‍රියාපටිපාටීන් යොදා ගනු ලබයි. ලේඛනවල ජීවන චක්‍රය කොටස් තුනකට බෙදා දැක්වේ. ප්‍රථමයෙන් භාවිත හෙවත් සක්‍රීය අවස්ථාව, දෙවනුව, අධි භාවිත සහ අකර්මන්‍ය අවස්ථාව සහ තෙවනුව අධිලේඛන හෙවත් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට පැවරූ පසු සිදු කරන කළමනාකරණය සහ සංරක්ෂණ ක්‍රියාදාමයයි.

ඉහත අවස්ථා තුනින්, ප්‍රථම අවස්ථාව ඉතා වැදගත් අවස්ථාව ලෙස සැලකිය හැකිය. මූලික අවස්ථාව විධිමත් පරිදි කළමනාකරණය නො කළහොත් රාජ්‍ය ලේඛනවලින් ලබා ගන්නා තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමට නො හැකිව තීරණ ප්‍රමාද වීමෙන්, පාලකයාට සහ පාලිතයින්ට අනේකවිධ ප්‍රශ්න පැන නගින අතර, තොරතුරු සංරක්ෂණය නො කිරීමෙන්, ලේඛන විනාශ වී යාමේ තර්ජනයක් ද හට ගනී.

භාවිත හෙවත් සංක්‍රීය ලේඛන කළමනාකරණයේ දී ලේඛනය නිර්මාණය කිරීමේ දී ඊට යොදා ගන්නා ගොනු කවරය, කඩදාසිය සහ තීන්තවල උසස් ගුණය අනුව එම ලිපිගොනු එදිනෙදා කටයුතුවල දී මනාව පවත්වා ගෙන ආරක්ෂා කරගත හැකි අතර, බාල වර්ගයේ ද්‍රව්‍ය යොදා ගැනීමෙන්, ඉක්මණින් ලේඛනය කැඩී බිඳී ගොස් තොරතුරු නැතිවී යාමට හේතු වේ. රජයේ කාර්යක්ෂම ලිපි ආරම්භ වන්නේ එම ආයතනයට පිටතින් ලැබෙන ලිපි හා ඊට යවන පිළිතුරු ද, අභ්‍යන්තර නියෝග වැනි ලිපි ලේඛන ද ආශ්‍රයෙනි.

## තැපැල් කළමනාකරණය

ඉහත දැක්වූ පරිදි රාජ්‍ය ලේඛන කළමනාකරයේ දී තැපැල කළමනාකරණය ඉතා වැදගත් අවස්ථාවකි. බොහෝ කාර්යාලවල එදිනෙදා ලැබෙන තැපැල ලේඛනයක සටහන් නොකරන අතර, සමහර කාර්යාලවල ලියාපදිංචි හෝ නමට ලැබෙන ලිපි පමණක් ලේඛනගත කරනු ලබයි. මෙය අසම්පූර්ණ ක්‍රියාවකි. රජයේ ආයතනයකට ලැබෙන

සියලුම වර්ගයේ ලිපි ලියාපදිංචි කළයුතු අතර, මේ සඳහා පරිගණක ප්‍රතිමූර්තිකරණ ක්‍රියාවලිය (Computer Scanning) යොදාගත හැකිය. මෙමඟින් ලැබෙන ලිපි නැති වීම අස්ථානගත වීම වළකාලයි. ලැබෙන ලිපි රෙජිස්ටරයට ද පරිගණකයට නිර්විෂ්ඨ කළ හැකිය.

## භාවිත ලේඛන කළමනාකරණය

නැපැල කළමනාකරණයෙන් ඇරඹෙන භාවිත ලේඛන ක්‍රියාවලිය ඉතා වැදගත් අවස්ථාවක් වේ. මේ සඳහා ලිපි ලේඛන සොයා ගැනීමට ද, තොරතුරු ඉතා ඉක්මනින් ලබා ගැනීමට ද, අවශ්‍ය ප්‍රධාන කරුණු කීපයකි. යම් අංශයක බිහිවන ලිපිගොනු සඳහා අංකානු සූචියක් ද විෂයානුකූල සූචියක් ද, ගොනුව හෝ ලේඛනය, රෙජිස්ටරය තැන්පත් ස්ථානය දක්වන ඉඟි වැලක් ද සැකසිය යුතුය. එදිනෙදා පරිපාලනයට අවශ්‍ය ලේඛන නියමිත ස්ථානයෙහි තැන්පත් නොකර, අස්ථානගතවන ලිපි ලේඛන සෙවීමට කොතරම් කාලයක් ගත වන්නේ දැයි සොයා බැලි ය යුතුය. ඉහත දක්වා ඇති අංකානු සූචිය (Numeral Index) සහ විෂයානුකූල සූචිය (Subject Index) පරිගණකගත කළ හැකිය. එවිට මෙහි ක්‍රමානුකූල පාලනයක් ඇති වේ. අංශ ප්‍රධානියාට තම අංශයේ නිර්මාණය වී ඇති ලිපි ලේඛන මොනවා ද යන්න ද, එම ලේඛන කොහි තැන්පත් වී ඇතිදැයි යන්න ද ක්ෂණයකින් සොයාගත හැකි වන අතර, ලිපි ලේඛන නැතිවීම අවම කිරීමට ප්‍රධාන ලිපිගොනු රෙජිස්ටරය යොදා ගත හැකි වේ.

භාවිත ලිපිගොනු පරිපාලනයේ දී රාජ්‍ය ආයතන, ඒකීය අංක ක්‍රමයක් codation of files) තම ආයතනයේ ගොනු අංක යෙදීමේදී භාවිත නොකරයි. බොහෝවිට යමෙකු තම සිතැඟි පරිදි යොදන සංකීර්ණවූ ද අංක අකාරාදි (Numeral Alpha) ඇල්ෆා ක්‍රම භාවිත කරති. මෙය පරිගණකගත කිරීමේ දී ප්‍රශ්න ගෙන දෙයි. රාජ්‍ය ආයතන සඳහා යොදා ගත යුත්තේ සරල අංක ක්‍රමයකි. උදාහරණ ලෙස පහත සඳහන් අංක ක්‍රමය යොදා ගත හැකිය.

හෝ

| ජා ලේ දේ | / NA | / 1 | / 10 | / 5 | / 8 | / 09 |
|---|---|---|---|---|---|---|
| ↓ | ↓ | ↓ | ↓ | ↓ | ↓ | ↓ |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | ආයතනය | අංශය | විෂය | උප විෂය | අයිතමය | වර්ෂය |

සමහරවිට රාජ්‍ය ආයතනයෙ විශාලත්වය අනුව එහි යටතේ ඇති විවිධ ආයතන දැක්වීමට අංකයක් ද යොදා ගත හැකිය. එකී අංකය සෑම විට ම, යම් අංකයකට පෙර ''0'' යොදා දැක්විය යුතුය.
(උදාහරණ 06)

උදාහරණ :- 01 - නුවර කාර්යාලය
02 - මාතර කාර්යාලය යනුවෙනි

භාවිත ලේඛන්වලට යොදන විෂයනාම (Subjects Headings) සඳහා "විවිධ", "මිශ්‍ර", "පොදු", "සාමාන්‍ය" යන වචන භාවිත නොකළ යුතුයි. බොහෝ රාජ්‍ය ආයතනවල සිතුමතේ මෙම විෂය නාම යොදා ගනී. මෙවිට තොරතුරු ලබා ගැනීම දුෂ්කර වේ. පරිගණක ක්‍රමයන් හඳුන්වා දීමේදී ඉහත දක්වා ඇති විෂය නාම බරපතල ප්‍රශ්න ගෙන දේ. යම් ගොනුවකට යොදන විෂය නාමය ඉතා පැහැදිලි වියයුතු අතර එහි ගොනු කර ඇති ලිපිවල සත්‍ය කරුණු නිරූපණය කළ යුතුය. ලිපි ගොනු තැන්පත් කිරීමේ දී නිශ්චිත ජාලය ගොනු කවරයේ සටහන් කළ යුතුය.

උදාහරණ :-

කැබි / 1 / 5 / 10

↓ ↓ ↓ ↓

කැබිනෙට්ටුව | කැබිනට් අංකය | ලාච්චුව | ගොනුව

බොහෝ කාර්යාලවල ගොනු කවර ඉතා තුනී වන අතර, බාල වර්ගයෙන් සමන්විතය. එබැවින් ගොනුවක ලිපි 1 - 150 දක්වා අමුණා ඇතිනම්, ඊට වැඩි වන ලිපි බහාලීමට එකී ගොනුවේ අංකයෙන් සහ විෂය නාමයෙන් ම දෙවැනි වෙළුමක් විවෘත කළ යුතුය. වර්ෂයක් අවසාන වී නව වර්ෂයක් ආරම්භයේ ද දෙවැනි වෙළුමක් විවෘත කළ හැකිය.

ගොනුවල ලිපි ක්‍රමවත් ව,පිළිවෙළට ඇමිණිය යුතුය. මළ බැඳෙන කටු, අල්පෙනිති,ටැග් යනාදිය යොදාගත යුතු නොවේ.

යම් අංශයක ගොනු හඳුනා ගැනීමට එකී අංශයේ ගොනු කවර සඳහා වර්ණ ක්‍රමයක් ද යොදා ගත හැකිය. එවිට එකී අංශයේ සියලුම ගොනු කවර එක් වර්ණයකින් යුක්ත වේ. මේ ක්‍රමය හදිසි ආපදාවක දී ගොනු මිශ්‍ර වී ගිය විටෙක පහසුවෙන් වෙන් කරවා ගත හැකිය.

~~සක්‍රිය~~ ලේඛන් නව තාක්ෂණයට යොදා ගත හැකිය. එනම් අංශවල ඇති වැදගත්, නිතර භාවිත වන ගොනු, පරිගණක ප්‍රතිමූර්තිකරණ යන්ත්‍රයක් යොදා, ගැනීමෙන් පරිගණකයකට නිර්විෂ්ට කළ හැකිය. එවිට එදිනෙදා භාවිත ලේඛන ඉතා පහසුවෙන් පරිගණකයේ තිරයේ බලා ගත හැකිය. මෙම ක්‍රමය අනුගමනය කරන්නේ නම්, එම ලේඛන නීතියෙන් පිළිගැනෙන පරිදි පරිගණක

ප්‍රතිමූර්තිකරණය කළ යුතුය. ඒ සඳහා තොරතුරු කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකුගේ උපදෙස් ලබා ගත යුතුවේ.

## අර්ධ භාවිත සහ අකර්මන්‍ය ලේඛන කළමනාකරණය

ලේඛන කළමනාකරණයේ දී මුහුණපෑමට සිදුවන බරපතල ප්‍රශ්නයක් ලෙස අර්ධ භාවිත සහ අකර්මන්‍ය ලේඛන අවස්ථාව සැලකිය හැකිය. බොහෝ රාජ්‍ය ආයතනවල මෙම තත්වයට පත්වන ලිපි ලේඛන කිසිදු සැලකිල්ලකින් තොරව අංශවල හෝ කොරිඩෝවල ගොඩ ගසා ඇත. මින් ඒවායේ තොරතුරු ලබා ගැනීම දුෂ්කර වන අතර, වටිනා වැදගත් ලේඛන ඇතිනම් විනාශ වී යාමට හේතු පැදේ.

"අර්ධ භාවිත" ලේඛනයක් ලෙස සලකන්නේ ලිපි ගොනුව නිර්මාණයෙන් පසු වර්ෂ 05 කාලයක් පරිපාලනයට අවශ්‍ය නොවී පවතින ලේඛනයකි. "අකර්මණ්‍ය ලේඛනයක්" යනු වර්ෂ 05 - 10 කාලයක් කිසිදු පරිපාලන කටයුත්තකට යොදා නොගත් ලේඛනයකි. මෙම කාල පරාසය ප්‍රමිති ගත කාලය වුව ද, රාජ්‍ය ආයතනයකට අවශ්‍ය නම්, ඉහත කාලය කෙටි කිරීම හෝ දීර්ඝ කිරීම කළ හැකිය. මෙය කළයුතු වන්නේ, එම ආයතනයේ ප්‍රධානියාගේ අනුමැතිය අනුව හෝ තොරතුරු කළමනාකරණ විශේෂඥයෙකුගේ උපදෙස් අනුවය.

"අධි භාවිත" හා "අකර්මන්‍ය ලේඛන" රාජ්‍ය ආයතනයේ අංශවල තබාගත යුතු නොවේ. ඉහත තත්වයට පත් ලේඛන විධිමත් උපලේඛනයක අඩංගු කර, තම ආයතනය මගින් පාලනය වන ලේඛන කාමරයකට හෝ රජය මගින් හෝ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් හෝ පාලිත ලේඛන මධ්‍යස්ථානයකට (Record centre) පැවරිය යුතුය. මෙසේ ක්‍රියා කරන්නේ, හදිසියේ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් එම ගොනුව ඉක්මනින් ලබා ගැනීමට සහ තම ආයතනයේ ඉඩකඩ ප්‍රශ්නය විසඳා ගැනීමට ය.

ශ්‍රී ලංකාවේ ලේඛන මධ්‍යස්ථාන සංකල්පය දැනට ක්‍රියාත්මක නොවේ. එබැවින්, ඉහත සඳහන් ජීවන චක්‍රයේ දෙවැනි අවස්ථාවට පත් වූ ලේඛන නො සලකා හැර, කෘමි උවදුරට හෝ වෙනත් විනාශකාරී ක්‍රියාවනට අසු වී තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව පාලකයාට සදහටම අහිමි වනු ඇත. රජයේ ආයතනවල දැනට ක්‍රියාගතවන "ලේඛන කාමර" සංකල්පය බ්‍රිතාන්‍ය යුගයෙන් අප ලත් දායාදයකි. එකල මෙම ලේඛනාගාර ඉතා මනා තත්වයෙන් පවතවාගෙන ගිය නමුදු ඊට අනතුරුව ලේඛනාගාරවල තත්වය පහත් අඩියකට වැටී එහි තැන්පත් ලේඛන විනාශ මුඛයට පත්විණි. ලේඛනවල දෙවන අවස්ථාව නියම පරිදි පාලනය කිරීමට හෝ ලේඛන මධ්‍යස්ථාන පිහිටුවීමට වහා ක්‍රියා කළ යුතුය.

රාජ්‍ය ලේඛනවල ආරක්ෂාව සහ අනවශ්‍ය ලේඛන ඉවත් කිරීම හෙවත් අපහරණය ලේඛන කළමනාකාර නීතිරීතිවල ගැබ් වී ඇත. 1973 අංක 48 දරණ ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ආයතන සංග්‍රහයේ සඳහන් රෙගුලාසිවල මෙම ක්‍රියාදාමය විස්තර කර ඇත. එහෙත් විධිමත් ලේඛන ඇගයීමක් වාර්ෂිකව ක්‍රියා නො කරන රාජ්‍ය ආයතන, වටිනා වූ ද, වැදගත් වූ ද, ලිපි ලේඛන, අනවශ්‍ය, අවැදගත් ලේඛන සමග කාර්යාලයේ විවිධ අංශවල හෝ ලේඛන කාමරවල තැන්පත් කර තැබීමෙන්, හදිසි අවස්ථාවක දී අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව මගහැරී යනවා පමණක් නොව වැදගත් ලේඛන ජාතික ලේඛනාගාරයට නො පැවරීමෙන් විනාශ මුඛයට යනු ඇත.

භාවිත ලේඛන, වර්ෂ 5 - 10 කාලයක් වන විට එහි ජීවන චක්‍රයේ දෙවන අවස්ථාව එළඹීමට පෙර, සමීක්ෂණයක් මාර්ගයෙන්, අපහරණ ඇගයීමකට භාජනය කළ යුතුය. මෙකී අපහරණ ඇගයීම ප්‍රථමයෙන් රජයේ කාර්යාලයේ විධායක නිලධරයෙකු විසින් පරීක්ෂාකර එම උපලේඛන ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. ලේඛන ඇගයීම සහ අපහරණය පිළිබඳව, මෙම ලේඛකයා විසින් ලියන ලද "ලේඛන සහ අධි ලේඛන කළමනාකරණයේ මූලධර්ම" නැමැති ග්‍රන්ථයේ සවිස්තරව දැක් වේ. රාජ්‍ය ලේඛන අපහරණය සඳහා

ඇගයීමේ දී, එම ලේඛනවල අඩංගු සාක්ෂිමය අගය (Evidential value) හෙවත් ප්‍රාථමික අගය ද, විඥාපන අගය ද (Informational value) පරීක්ෂා කළ යුතුය. මෙම අගයන් දෙක ම අඩංගු නොවන ලිපි ලේඛන, ලේඛන කාමරයෙන්, වාරිකව විනාශ කළ හැකිය. මේ සඳහා ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

දැනට ලබාගෙන ඇති අත්දැකීම අනුව, නිර්මාණය වන රාජ්‍ය ලේඛන අතුරින් 95% ක ප්‍රමාණයක් ඉවත් කළ හැකිය. මෙසේ විනාශ කළ හැකි ලේඛන වර්ගවල විස්තර 1984.08.31 වැනි දින අංක 313 දරන ගැසට් පත්‍රයේ පළකර ඇත. මෙම ගැසට් පත්‍රය අනුව, ක්‍රම චර්යා ලේඛන (House keeping Records) හෙවත් රාජ්‍ය ආයතනවල බොහොමයක ට පොදු ලේඛන විනාශ කරන කාල සීමාවන් දැක්වේ. මෙසේ ලේඛන කාමරවල තැන්පත් අනවශ්‍ය ලේඛන ඉවත් කිරීමෙන් ඒවායේ ඉඩකඩ ඉතිරිවන අතර අධි ලේඛන (Archival records) හෙවත් ජාතික ලේඛනාගාරයට පැවරිය යුතු වටිනා වැදගත් ලෙඛන සංරක්ෂණය කර ගැනීමට ද පහසු වේ. ලේඛන කාමරය තුළ තැන්පත් ලේඛන පූර්ව සංරක්ෂණය (Preservation) සඳහා අවශ්‍ය ප්‍රමිති ක්‍රියාගත කළයුතු අතර, කැඩී බිඳී යන ලිපිගොනු සහ ලේඛන සංරක්ෂණය (Conservation) සඳහා ප්‍රථමාධාර දීමට කුසලතාවක් ඇති අයෙකු එනම් පොත් බැඳුම් කරුවෙකුවත් පත් කරගත යුතුයි. මෙම පොත් බැඳුම්කරුට, ජාතික ලේඛනාගාරයේ දී සංරක්ෂණය පිළිබඳ මූලික දැනුමක් ලබාදීම මැනවි.

මෙසේ ලේඛනාගාර තුළ මනාව තැන්පත් කර සංරක්ෂණය කරගන්නා ලිපි ලේඛන, 5 % ක ප්‍රමාණයක් අධිලේඛන ලෙස ජාතික ලේඛනාගාරයට පැවරීමේ දී යහපත් සංරක්ෂිත තත්වයෙන් පැවතීමට හේතුවන අතර, ජාතික ලේඛනාගාරයට පැවරූ පසු, එකී ලේඛන මනාව පවත්වා ගෙන යාමට ජාතික ලේඛනාගාර කාර්යය මඬුල්ලට පහසු වනු ඇත.

# ශ්‍රව්‍ය දෘශ්‍ය සහ විද්‍යුත් ලේඛන කළමනාකරණය

රජයේ ආයතනවල ශ්‍රව්‍ය දෘශ්‍ය හෙවත් ඡායාරූප, කැසට්, සූක්ෂම චිත්‍රපට, ද විද්‍යුත් ලේඛන (Electronic Records) හෙවත් පරිගණක ආශ්‍රිත ලේඛන බිහි වී ඇති අතර, අනාගතයේ දී මෙකී වර්ගවල විශේෂයෙන් පරිගණක පාදක ලේඛනවල ශීඝ්‍ර වර්ධනයක් ඇති විය හැකිය.

රාජ්‍ය ආයතනවල විද්‍යුත් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන පරිපාලනය සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රම තවම විධිමත්ව සකසා නැත. මෙම විෂය ක්ෂේත්‍රය ඉතා වැදගත් වන අතර කඩදාසි පාදක ලේඛන මෙන් නොව ඉතා ඉක්මණින් සහ පහසුවෙන් විනාශය කරා යා හැකිය.

ප්‍රථමයෙන් කළ යුත්තේ දැනට විවිධ රාජ්‍ය ආයතනවල තැන්පත් සහ බිහිවී ඇති උක්ත වර්ගයේ ලේඛන පිළිබඳව සමීක්ෂාවක් කිරීමය. මෙහි ප්‍රතිඵල අනුව, නිර්මාණය වී ඇති නව වර්ගයේ ලේඛන කළමනාකාරණයට නීති, රීති සහ රෙගුලාසි සැකසිය යුතුය. අද රාජ්‍ය ආයතනවල මිල දී ගෙන ඇති විවිධ වර්ගයේ පරිගණකවල සහ පරිගණක ජාලවල ගැබ්වී ඇති තොරතුරු මොනවාදැයි දන්නේ අල්ප දෙනෙකි. සමහරවිට රාජ්‍ය ආයතන ප්‍රධානියා ද තම ආයතනයේ පරිගණක ලේඛනවල තැන්පත් තොරතුරු සහ දත්ත පද්ධතිවල (Data Bases) ගැබ්වූ විඥාපනය නොදනී. මෙය භයානක තත්ත්වයකි. පරිගණක ලේඛන වහා වෙනස් කළ හැකි, ඉවත් කළ හැකි මැකිය හැකි වන් අතර, මෘදුකාංගය කියවිය හැකි දෘඪාංගය (Hardware) යල් පැන යා හැකිය. මෙම තත්වය යටතේ විද්‍යුත් ලේඛන වහා ආරක්ෂා කර ගැනීමට රාජ්‍ය ආයතන ක්‍රියා කළ යුතුය. මේ සඳහා විද්‍යුත් ලේඛන නිර්මාණය වන විට දී ම එකී ලේඛනවලට කළ යුතු කටයුතු තීරණය කරගත යුතුය. පරිගණක ලේඛන නිර්මාණයට යොදා ගන්නා මෘදුකාංග සහ දෘඪාංග ගැන සැලකිලිමත් විය යුතුය. තොරතුරු ප්‍රධාන ස්මරණයේ (Memory) තබා නොගන්නේ නම් මාර්ග අපගත කරන්නේ නම් (Offline) එම තොරතුරු ගැබ් කිරීමට යොදා ගන්නා

මාධ්‍යය ගැන සැලකිලිමත් විය යුතුය. තොරතුරු යාවත් කාල කරනුයේ නම්, කුමන වර්ගයේ CR - RW හෙවත් යලි ලිවිය හැකි සංගෘහිත තැටියේ ප්‍රමිති මොනවා ද? තොරතුරු යාවත්කාල නොකරනුයේ නම් යොදා ගන්නා CD-ROM හෙවත් කියවීමට පමණක් යොදා ගන්නා සංගෘහිත තැටියේ ප්‍රමිතිය කුමක් ද? යන්න තීරණය කළ යුතුය. විද්‍යුත් ලේඛන අපහරණයට ඇගයීමේ දී කඩදාසි ලේඛනවලට යොදාගත් ඉහත විස්තර කළ ඇගයීම් මූලධර්ම යොදා ගත හැකිය. එහෙත් විද්‍යුත් ලේඛන සඳහා දෙවන අවස්ථාවේ දී ලේඛන කාමරවල තැන්පතුවක් සිදු නොවේ. රාජ්‍ය ආයතනවල සංරක්ෂණය කළ නොහැකි විද්‍යුත් ලේඛනවල අඩංගු කරුණු, ඉතා ඉක්මණින් ජාතික ලේඛනාගාරයට පැවරිය යුතුය. විද්‍යුත් ලේඛන පහසුවෙන් සහ ඉක්මනින් වෙනත් මාධ්‍යයකට (Migration) මාරුකළ හැකි නිසා රාජ්‍ය ආයතනයේ ද තොරතුරුවල පරිගණක පිටපතක් තබා ගෙන එකී පිටපතක් ජාතික ලේඛනාගාරයට පැවරිය හැකිය. එහෙත් මෙසේ ජාතික ලේඛනාගාරයට පවරන විද්‍යුත් ලේඛන, නීතිය ඉදිරියේ සත්‍ය බවට පිළිගත හැකි ආකාරයෙන් සැකසිය යුතුය. මේ සඳහා ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් ඇත. එකී ක්‍රමවේදය යොදා ගැනීමෙන් පරිගණක ප්‍රතිමූර්තිකරණ (Computer Scanned Records) ලේඛන නීතිය ඉදිරියේ සාක්ෂි ලෙස පිළිගැනීමට හැකි විය යුතුය. මෙසේ රාජ්‍ය ආයතනවල විද්‍යුත් ලේඛන බිහිවීම නිසා අනාගතයේ අපට අවශ්‍ය විය හැකි වැදගත් සාක්ෂි අතුරුදහන් වීම වළකාලීමේ ක්‍රියා මාර්ග අදාල අධිකාරීන් විසින් ගනු ඇතැයි සිතමි.

රාජ්‍ය ලේඛන කළමනාකරණ සහ සංරක්ෂණය පිළිබඳව පුහුණු වෘත්තිකයින් ද රටට අවශ්‍ය වේ. විද්‍යුත් ලේඛන පරිපාලනයට විශේෂඥයින් අවශ්‍ය කාලයක් ද වේ. අද ලේඛන කළමනාකරණ විශේෂඥයින් ඇත්තේ කීපදෙනෙකි. ඒ අතුරින් අත්දැකීම් ඇති අය කීදෙනෙක් ඇද්ද? මෙම ක්ෂේත්‍රයේ පුහුණු කිරීම වේගවත් නො කළ හොත්, රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ නීති,රීති, රෙගුලාසි පැනවීමෙහි කුමන ඵලයක් වේ ද?

ඉහත දක්වා ඇති කරුණු රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ අද පවතින අභියෝග වෙති. මෙම අභියෝග ජය ගැනීමට විධිමත් වැඩපිළිවෙළක් සැකසීම අදාළ ක්ෂේත්‍රවල අයගේ වගකීමකි. එසේ නොමැතිව අප රට අතීත ඉතිහාසය විවරණයට තිබුණු මූලාශ්‍ර පමණක් ඉතිරිවී, නූතන යුගයේ ඉතිහාසය තව වර්ෂ 50 ක පමණ කාලයකින් ලිවීමට කිසිදු මූලාශ්‍රයක් නොමැති වීමේ තර්ජනයට මුහුණපෑමට සිදුවේ. පුස්කොළ පොතේ ද, කඩදාසියේ ද ලියූ ඉතිහාසය ඉතිරි වී සංගෘහිත තැටිවල අඩංගු බිට (Bi ts) අන්තර්ධාන වී, ඉතිහාසය ද මැකී යනු ඇත.

## විමර්ශනය ග්‍රන්ථ නාමාවලිය


1) ආයතන සංග්‍රහය, 29 පරිච්ඡේදය - 9 : 1 - 9 : 8 දක්වා වගන්ති

2) ජාතික ලේනාරක්ෂක පනත, 1973 අංක 48

3) ජාතික ලේඛනාරක්ෂක සංශෝධන පනත, 1981 අංක 30 දරන

4) රජයේ ගැසට් පත්‍රය, 1984.08.31, අංක 313 දරන

5) විමලරත්න, කේ.ඩී.ජී. (2000) ශ්‍රී ලංකාවේ ලේඛන සහ අධිලේඛන කළමනාකරණය පිළිබඳ ව්‍යවස්ථා සහ රෙගුලාසි පිටු 49, කොළඹ : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

6) විමලරත්න, කේ.ඩී.ජී. (2007) ලේඛන සහ අධිලේඛන කළමනාකරණ මූලධර්ම, කොළඹ : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීමෙහිලා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය


## ජ.ඩී. අමරසිරි

**අධ්‍යක්ෂ**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය


ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සංගම් හා සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. පුස්තකාල ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා අනුව ඉදිරියට යාමට එවැනි සහයෝගීතාවක් තිබිය යුතු වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය දැනට පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ ජාත්‍යන්තර ආයතන හා සංවිධාන රාශියක් සමඟ සම්බන්ධතා පවත්වයි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සම්බන්ධතා පවත්වන ප්‍රධාන ජාත්‍යන්තර සංවිධානයක් ලෙස ජාත්‍යන්තර පුස්තකාල සංගම් සංවිධානය (IFLA) හැඳින්විය හැකිය. මෙය පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධානත ම ජාත්‍යන්තර සංවිධානය වේ. සෑම වර්ෂයක ම මෙම සංවිධානයේ වාර්ෂික සමුළුව පැවැත්වෙන අතර මෙම සමුළුවට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකාවේ අනෙකුත් පුස්තකාලවේදීහු ද සහභාගි වෙති. මෙය පුස්තකාල ක්ෂේත්‍රයේ වැඩිම වෘත්තිකයින් පිරිසක් සහභාගිවන සමුළුව වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙම සංගමයේ සාමාජිකත්වය ද ලබා ඇත. මේ තුළින් ශ්‍රී ලංකාවට ඉෆ්ලා සංවිධානයේ විශේෂ ස්ථානයක් හිමිව ඇත. ඉෆ්ලා සංවිධානය හා

ස්වීඩන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (SIDA) සහයෝගය ඇතිව පුස්තකාල උපදේශනය හා ප්‍රතිපත්ති සංවර්ධනය (Library Advocacy and Policy Development) පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව ක් 2009.02.12 හා 13 දිනවල කොළඹ දී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ක්ෂේත්‍රය සවිබල ගැන්වීම සඳහා මග පෙන්විය හැකි කණ්ඩායමක් පුහුණු කිරීම මෙම වැඩමුළුවේ අරමුණ විය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය විදේශීය පුස්තකාල සංගම් හා සංවිධාන ගණනාවක සාමාජිකත්වය ලබාගෙන ඇත. දැනට පහත සඳහන් සංවිධානවල සාමාජිකත්වය ලබාගෙන ඇත.

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය
ඇමරිකානු පුස්තකාල සංගමය
ඕස්ට්‍රේලියානු පුස්තකාල සංගමය
නවසීලන්ත පුස්තකාල සංගමය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ජාත්‍යන්තර සහයෝගිතාවය ඇති කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන තවත් වැඩසටහනක් ලෙස ජාත්‍යන්තර පොත් හුවමාරු සේවය හැඳින්විය හැකිය. දැනට විදේශ පුස්තකාල හා ආයතන රාශියක් සමඟ ප්‍රකාශන හුවමාරු වැඩසටහන පවත්වාගෙන යනු ලැබේ. එම විදේශීය පුස්තකාල හා ආයතන පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ජපාන ජාතික පුස්තකාලය | නෝර්වේ ජාතික පුස්තකාලය |
| චීන ජාතික පුස්තකාලය | තායිලන්ත ජාතික පුස්තකාලය |
| තායිවාන් ජාතික පුස්තකාලය | ප්‍රංශ ජාතික පුස්තකාලය |
| ඉන්දීය ජාතික පුස්තකාලය | බුරුම ජාතික පුස්තකාලය |
| කොරියානු පදනම | කෙන්යා ජාතික පුස්කාල සේවය |
| කොරියානු ජාතික පුස්තකාලය | ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය |

සිංගප්පූරු ජාතික පුස්තකාල මණ්ඩලය

එක්සත් රාජධානියේ ජාත්‍යන්තර පොත් ආධාර වැඩ සටහන (Book Aid International) සමඟ ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සම්බන්ධතා පවත්වයි. මේ යටතේ ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට බෙදා හැරීම සඳහා මෙම ආයතනය විසින් ඉංග්‍රීසි පොත් නොමිලයේ ලබා දෙනු ලැබේ. පසුගිය වසර ගණනාව තුළ මෙම වැඩ සටහන් යටතේ විවිධ විෂයයන්ට අදාළ ඉංග්‍රීසි පොත් විශාල සංඛ්‍යාවක් ලැබී ඇති අතර මෙම වැඩසටහනට අදාළව විදේශ පුහුණු ශිෂ්‍යත්ව ද ලබා දී ඇත.

මීට අමතරව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය විදේශීය ප්‍රකාශකයන් සමඟ ද නිරන්තර සබඳතා පවත්වාගෙන යනු ලැබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සඳහා විදේශීය ප්‍රකාශන ලබා ගැනීමේ දී විදේශ ප්‍රකාශකයින්ගේ සහාය අත්‍යවශ්‍ය වේ.

ආසියා හා සාගර කලාපයේ ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව (CDNLAO) වාර්ෂිකව පැවැත්වේ. මේ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද සහභාගී වේ. ආසියා හා සාගර කලාපයේ ජාතික පුස්තකාලවල සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හා ගැටළු ආදිය මෙම සමුළුවේ දී සාකච්ඡා කෙරේ. ජාතික පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය සහයෝගීතාව වර්ධනය කර ගැනීමට මෙම සමුළුව බෙහෙවින් ඉවහල් වේ. ආසියා හා සාගර කලාපීය ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම 1985 දී කොළඹ දී පැවැත්වූ අතර මෙය ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සම්බන්ධතාවන්හි වැදගත්තම සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. ලොවපුරා සිටින ජාතික පුස්තකාල විශේෂඥයින්ගේ රැස්වීමක් වන යුනෙස්කෝ ජාතික පුස්තකාල කලාපීය සමුළුව 1967 දී කොළඹ දී පැවැත් වූ අතර මෙය ද ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල ඉතිහාසයේ වැදගත් සිදුවීමකි. රටක අධ්‍යාපනික සංස්කෘතික හා විද්‍යාත්මක කටයුතු සංවර්ධනය කිරීමේ දී ජාතික පුස්තකාලවල වැදගත්කම යුනෙස්කෝ ආයතනය වටහා

ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම සමුළුව ලොව විවිධ රටවල පවත්වා ඇත. ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව ද (CDNL) ජාතික පුස්තකාලය නියෝජනය වන ප්‍රධාන අන්තර් ජාතික වැඩසටහනකි.

පුස්තකාල ක්ෂේත්‍රයට අදාළව විවිධ රටවල පවත්වන පාඨමාලා සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ නිලධාරීහු සහභාගි වෙති. මෙයින් සමහර පාඨමාලා විදේශ ශිෂ්‍යත්ව වශයෙන් ද ලැබෙන ඒවා වේ. මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන (Malaysian Technical Cooperation Programme) යටතේ ලැබෙන ශිෂ්‍යත්ව මීට නිදර්ශනයකි. එමෙන් ම ඉෆ්ලා සංවිධානයෙන් ද මේ ආකාරයේ ශිෂ්‍යත්ව ලැබේ. අනෙකුත් පුහුණුවීම් බොහොමයක් මණ්ඩලයේ වියදමින් ලබාගන්නා ඒවා වේ. මේ ආකාරයේ විදේශ පුහුණුවීම්වලට සහභාගීවීම තුළින් ද පුස්තකාල ක්ෂේත්‍රයේ නව ජාත්‍යන්තර ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කර ගැනීමටත් බෙහෙවින් උපකාර වේ.

යුනෙස්කෝ සංවිධානය ක්‍රියාත්මක කරන ලෝකයේ මතකය (Memory of the World) වැඩසටහනට ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සම්බන්ධ වේ. ලෝකයේ විවිධ රටවලට අනන්‍යවූ ලේඛන උරුමයන් ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳ පාලනයක් ඇති කර ගැනීම මෙම වැඩසටහනේ අරමුණ වේ. ලෝකයේ මතකය පිළිබඳ ලේඛනයක් (memory of the world register) යුනෙස්කෝ සංවිධානය පවත්වා ගෙන යන අතර ලෝකයේ විවිධ රටවල විශේෂ වැදගත්කමක් ඇති ලේඛන උරුමයන් මෙම ලේඛනයට ඇතුළත් කෙරේ.

2007 ජූලි 23 සිට 25 දක්වා කොළඹ දී පැවති ආසියා හා සාගර කලාපයේ ලේඛන උරුමය සංරක්ෂණය කිරීම පිළිබඳ කලාපීය වැඩමුළුවේ උපදේශක රැස්වීමේ දී ශ්‍රී ලංකාවේ පවතින මේ ආකාරයේ ලේඛන උරුමයන් පිළිබඳව සාකච්ඡා විය. මෙම රැස්වීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති තුමා, අධ්‍යක්ෂ

ජනරාල්තුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ද ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතීන් ද යුනෙස්කෝ සංවිධානයේ උපදේශකවරයෙක් ද, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු ක්ෂේත්‍රයේ විද්වතුන් රැසක් ද මෙයට සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ ඇති පුස්කොළ පොත් එකතුව ලේඛන උරුමයක් වශයෙන් ලෝකයේ මතකය පිළිබඳ ලේඛනයට ඇතුළත් කිරීමේ හැකියාව පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කර ඒ පිළිබඳ යෝජනාවලියක් යුනෙස්කෝ සංවිධානයට ඉදිරිපත් කළයුතු බව යුනෙස්කෝ උපදේශකවරයාගේ අදහස විය.

යුනෙස්කෝ සංවිධානයේ සැමට තොරතුරු වැඩසටහනට ද (Information for all) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය නියෝජනය කරයි. සියලුම ජනකොටස්වලට තොරතුරුවලට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම සඳහා අවකාශ සලසා දීම මෙම වැඩසටහනේ අරමුණ වේ. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසමේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකාවේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

යුනෙස්කෝ සංවිධානයේ තවත් වැඩසටහනක් වන අස්පර්ශනීය උරුමය සංරක්ෂණය (Conservation of Intangible Heritage) වැඩසටහනට ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සම්බන්ධ වේ. අස්පර්ශනීය උරුමය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අස්පර්ශනීය උරුමය පිළිබඳ ජාතික ලේඛනයක් (National inventory) සකස් කිරීම දැනට කරගෙන යනු ලැබේ. අස්පර්ශනීය උරුමය පිළිබඳ යුනෙස්කෝ සම්මුතිය මගින් අශ්පර්ශීය උරුමය පිළිබඳ පහත සඳහන් ප්‍රභේද හඳුනා ගෙන ඇත.

1. වාචික සාම්ප්‍රදාය
2. රංග කලාව
3. සමාජ සිරිත් විරිත්, පුදපූජා, උත්සව ආදිය
4. ස්වභාවධර්මය හා විශ්වය පිළිබඳ දැනුම හා ක්‍රියාකාරකම්
5. සාම්ප්‍රදායික යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ආදිය

ජාතික පුස්තකාල වෙබ් අඩවිය මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිළිබඳව හා එහි තොරතුරු මූලාශ්‍ර පිළිබඳව ලෝකයේ ඕනෑම අයෙකුට ගවේෂණය කිරීමේ අවස්ථාව ලබා දී ඇත. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ව්‍යුහය හා කාර්යයන්ට අමතරව ජාතික පුස්තකාල සූචිය, ජාතික ඒකාබද්ධ සූචිය පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව ජාතික ග්‍රන්ථ නාමාවලිය පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව, නැට්නෙට් ලංකා ප්‍රවෘත්ති පත්‍රිකාව ආදි මූලාශ්‍ර දැනට අන්තර්ජාලයට සම්බන්ධ කර ඇත. ජාතික පුස්තකාල වෙබ්අඩවිය මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයන් ලබා දීමටත්, තොරතුරු ලබා දීමටත් හැකි වී ඇත.

අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN), අන්තර්ජාතික ප්‍රමිත මාලික අංක ව්‍යාපෘතිය (ISSN) අන්තර්ජාතික ප්‍රමිත සංගීත අංක ව්‍යාපෘතිය (ISMN) යන ව්‍යාපෘතිවල දේශීය නියෝජිත ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කටයුතු කරයි. මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය හේතුවෙන් දකුණු ආසියාවේ වෙනත් රටවලට මඟ පෙන්වන්නකු ලෙස ද කටයුතු කිරීමට අප ආයතනයට අවස්ථාව ලැබී ඇත. භූතානයේ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය ඇරඹීමට අවශ්‍ය පුහුණුව සහ උපදෙස් මේ අනුව 2000 වසරේ මුල දී ලබා දෙන ලදී.

යුනෙස්කෝ ආයතනය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීමේ දීත්, එහි ගොඩනැගිලි සැලසුම් කිරීමේ දීත් විශාල මෙහෙයක් ඉටු කරන ලදී. වර්තමානයේදී ද ලෝකයේ මතකය වැනි විවිධ පුස්තකාල වැඩසටහන්වල දී ජාතික පුස්තකාලයට මෙම සංවිධානය සමඟ සමීපව කටයුතු කිරීමට හැකි වී ඇත. ඇමෙරිකා එක්සත් ජනපද ප්‍රවෘත්ති ඒජන්සිය, බ්‍රිතාන්‍ය මණ්ඩලය, බ්‍රිතාන්‍යයේ ජාත්‍යන්තර පොත් ආධාර ආයතනය වැනි සංවිධාන ද විශේෂඥ සේවා, පුහුණු පහසුකම් හා ද්‍රව්‍යමය ආධාර ලබා දීමෙන් ජාතික පුස්තකාල කටයුතුවලට දායකත්වය ලබා දේ.

ලෝක බැංකුව, සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය - 2 යටතේ ශ්‍රී ලංකාවේ පාසැල් පුස්තකාල සංවර්ධනය සඳහා මෙන් ම පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනය (NILIS) පිහිටුවීමටත් ආධාර කර ඇත. මෙම ආධාර ලබා ගැනීමේ දී ජාතික පුස්තකාලය ද ක්‍රියාකාරී ලෙස මැදිහත් වූ අතර, පාසැල් පුස්තකාලයාධිපතීන්, පුස්තකාල පුහුණුකරුවන් මෙන් ම ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ පුහුණු කටයුතුවලට ද එමගින් ආධාර ලබා දී තිබේ.

මෙම කරුණු අනුව බලන විට පුස්තකාල ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීමෙහිලා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන බව පැහැදිලි වේ. පුස්තකාල ක්ෂෙත්‍රයේ ජාත්‍යන්තර ප්‍රවණතා අනුව උරෙන් උර ගැටී ඉදිරියට ගමන් කිරීමට මේ ආකාරයේ සහයෝගීතා වැඩසටහන් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ලෝකයේ දියුණු යයි සම්මත රටවල ජාතික පුස්තකාල සේවාවන් සමඟ සසඳන විට සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් අපගේ ජාතික පුස්තකාල සේවාවේ යම් යම් අඩුපාඩුකම් තිබේ. මෙම අඩුපාඩුකම් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ :

1) අමරසිරි, එම්.එස්.යූ. (සංස්.) (1990), ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය : සමරු කලාපය, කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

2) දසවස් සමරුව 1990 - (2000) කොළඹ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

3) Amarsiri, G.D., (2005) Role of the National Libraries in a changing Environment : An overvies of the National Library of Sri Lanka, proceedings of the International Conference on National Libraries in knowledge Based Society : Bangkok : National Library of Thailand

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කාර්යභාරය පිළිබඳ හැඳින්වීමක්

**_විජය ප්‍රේමදර්ශන_**
පුස්තකාල සංවර්ධන සහකාර
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

මිනිසා ශිෂ්ටාචාරගත වී ජනාවාස වූ දා සිට 21 වන සියවස දක්වා පා තබා ඇත්තේ තාක්ෂණික විප්ලවය නැමැති පියගැටපෙළ මතිණි. මේ ආකාරයෙන් මානව සංවර්ධනය ක්‍රමයෙන් දියුණු වී ඇති බව පෙනේ. කිසියම් රටක් ආර්ථික, සාමාජික, හා සංස්කෘතික ම ය වශයෙන් වර්ධනය වීමට නම් මානව සම්පතෙහි ක්‍රියාකාරීත්වයට ආකල්ප මය වෙනසක් අවශ්‍ය වන බව නො කිවමනා ය. ඒ අනුව මිනිසා සංවර්ධනය කරලීම ජාතික සංවර්ධන කාර්යයෙහිලා ඉතාමත් වැදගත් කර්තව්‍යයකි. ලෝකයේ විවිධ පුද්ගල හා සමාජ කොටස් සඳහා අවශ්‍ය දැනුම ලබා දීමේ විධිමත් ක්‍රියාවලිය පාසල්, විශ්වවිද්‍යාල හා වෙනත් අධ්‍යාපනික ආයතනවලින් සිදු වුව ද ඒ හා සමාන කාර්යයක් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන තුළින් ද ඉටු කළ හැකි අයුරින් මෙම ක්ෂේත්‍රයන් බද්ධ ව පවතී. මෙහි දී තොරතුරු සම්පත් රැස්කොට ඇති ස්ථාන ලෝකයේ විවිධ රටවල කිනම් නමකින් හැඳින් වුව ද ශ්‍රී ලංකා සමාජයේ දී පොත්ගුල යන නාමය අතීතයේ සිට ම ලාංකිකයන්ගේ මුවට හුරු පුරුදු ය. වර්තමානයේ දී එය පුස්තකාලය, තොරතුරු, මධ්‍යස්ථානය, හා ප්‍රලේඛන මධ්‍යස්ථානය යනාදි නම්වලින් අර්ථ දැක්වේ. මෙහි දී අප රටේ පුස්තකාලය ගැන කථා කිරීමේ දී අද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය අමතක කොට කථා කළ නො හැකි ය.

ශ්‍රී ලංකාවේ ඇති පුස්තකාල යටතේ මහජන, පාසැල්, පිරිවෙන්, විශ්වවිද්‍යාල, දෙපාර්තමේන්තු, කාර්මික, විශේෂ, ළමා මෙන් ම වෙනත්

වශයෙන් පුස්තකාල 10,000 කට ආසන්න ප්‍රමාණයක් තිබේ. මෙයින් වඩාත් ප්‍රමුඛතාවක් ගෙන ඇත්තේ 1990 දී උත්පත්තිය ලද දැනට යොවුන් වියේ පසුවන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය යි. මෙය 1970 දී ආරම්භ කරන ලද දැනට 39 වසරක් සපුරා ඇති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නැමැති මැණියන් විසින් බිහිකරන ලද්දකි. තරමක් මෑත කාලයේ දී ජාතික පුස්තකාලය ආරම්භ වුව ද ඉහත සඳහන් පුස්තකාල සඳහා අවශ්‍ය උපදෙස් හා සහය ලබාදෙමින් කටයුතු කරන්නේ පරිණත වූ තොරතුරු මධ්‍යස්ථානයක් සේ මෙම ක්ෂේත්‍රයේ ඉදිරියෙන් ම සිට නායකත්වය ද දෙමිනි. ඒ අනුව රටපුරා ව්‍යාප්ත වූ හා මැනවින් සංවිධානය වූ පුස්තකාල හා තොරතුරු සේවාවන් මනාකොට පවත්වාගෙන යාමට මෙම ආයතනය ඉටු කරනුයේ සුළුපටු කාර්යයක් නො වේ. ඒ ආකාරයෙන් මෙය මානව සම්පත් සංවර්ධන කාර්යයේ දී ඉතා ම වැදගත් වේ. කෙසේ වෙතත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මෙමකර්තව්‍යයට උරදෙනුයේ යුගයට පහළ වූ යෝධයෙකු මෙන් සිටිමිනි.

## ජාතික පුස්තකාලයේ ඉතිහාසය

ලෝක පුස්තකාල ඉතිහාසය දෙස නෙත් යොමන විට මොහෙන්දෝජාරෝ හරප්පා හා බැබිලෝනියානු ශිෂ්ටාචාරවලින් පසුව හා මෑත කාලයේදී ද ඉරාකය, චීනය, ජපානය, ඉන්දියාව වැනි රටවල කරන ලද කැනීම්වලින් හා ගවේෂණවලින් හමු වී ඇති නෂ්ඨාවශේෂ හා තොරතුරුවලට අනුව එම රටවල ඉපැරණි පුස්තකාල තොරතුරු ගෙන අධ්‍යයනය කිරීමෙන් හා ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලය වැනි ඒවා තුළින් ගම්‍ය වන්නේ පුස්තකාල සඳහා විවිධ රටවල පැහැදිලි ඉතිහාසයක් තිබූ බවයි. ශ්‍රී ලංකාවේ ද අභයගිරිය, මහා විහාරය, පොත්ගුල් විහාරය හා පාදෙණිය වැනි පුරාණ පොත්ගුල්වලින් දිස්වනුයේ මේ සම්බන්ධ ව ගැඹුරු ඉතිහාසයක සාධක යි. කෙසේ වුවද යටත් විජිත යුගයේ දී විශේෂයෙන් ම 16 හා 17 වන සියවස්වල යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයන්, 18 වන සියවසේ දී පමණ සිදු වූ මුද්‍රණ ශිල්පයේ දියුණුවත් සමඟ මෑත යුගයේ දී පරිගණකයේ

ආගමනයෙන් පසු ශ්‍රී ලංකා සමාජයේ ද ඇති වූ සංක්‍රාන්තියෙන් අනතුරුව ආගමික සිද්ධස්ථාන මුල්කොට බිහි වූ පොත්ගුල් වෙනුවට නව තොරතුරු මූලාශ්‍ර හා තොරතුරු මධ්‍යස්ථාන වෙනුවෙන් දොරටු විවර විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ රජයේ ප්‍රාචීන පුස්තකාලය 1870 දී කොළඹ ආරම්භ කිරීම විශේෂ සිදු වීමකි. එසේ ම එවකට පූජනීය ස්ථාන ආශ්‍රිතව තිබූ පොත්පත් රාශියක් එක්රැස් කර ගැනීමට අවස්ථාව උදාවිය. අනතුරුව 1877 දී ප්‍රාචීන පුස්තකාලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට බද්ධ කිරීමෙන් කෞතුකාගාර පුස්තකාලය බිහි වී තිබේ. ඒ අනුව 1885 දී පනවන ලද මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතට අනුව නෛතික පිටපත් තැන්පත් කිරීමේ කාර්යය ද ශ්‍රී ලංකාවේ ජාතික ලේඛනාගාරය ආරම්භ කරන තුරු හා ජාතික පුස්තකාලයක් පිහිටුවන තෙක් සියවසකටත් අධික කාලයක් අඛණ්ඩ ව පැවති ඇත.

අනතුරුව විවිධ පනත් කොමිෂන් සභා, වාර්තා, සමුළු, සම්මන්ත්‍රණ හා උපදේශක කමිටුවල සහයෝගයෙන් 1970 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවනු ලැබීය. මෙහි මුඛ්‍ය ත ම කරුණ වූයේ ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක් ආරම්භ කිරීම ය. ඒ ආකාරයෙන් ජාතික පුස්තකාලය 1990 අප්‍රේල් 27 දින කොළඹ නගරයේ නිදහස් මාවතේ පිහිටුවන ලදී. 1998 අංක 51 දරණ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතට අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය බවට පත්විය. මෙය අනෙකුත් රටවල මෙන් පුස්තකාල හා තොරතුරු ආයතන, පද්ධතියේ කේන්ද්‍රස්ථානයක් වන අතර මේ රටේ ඇති ප්‍රධාන පර්යේෂණ පුස්තකාලය ලෙස ද කටයුතු කෙරේ.

## අරමුණු :

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය එක්ව ශ්‍රී ලංකාවේ සිදු කරන

කාර්ය කටයුතු සම්බන්ධයෙන් පුස්තකාල පද්ධතියට පමණක් නොව අනෙකුත් පර්යේෂණ ප්‍රකාශන, ලේඛන කටයුතු වෙනුවෙන් කරන ලද දායකත්වය මෙන් ම සෘජුව ම පාඨක ජනතාවට ද සේවා සැපයේ. ඒ අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ අරමුණු මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

* සියලු ම ජන කොටස්වල භාවිතය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත අයුරින් පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික වශයෙන් සංචිතයක් ලෙස කටයුතු කිරීම

* ශ්‍රී ලංකාව තුළ හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් ඇති කිරීම, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා සංස්කෘතික උරුමය රැකීම

* මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනත යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීම

* රට තුළ හෝ රැට අදාළ ව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනවල හෝ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවලට උචිත විදේශීය ප්‍රකාශනවල පිටපත් මිල දී ගැනීම හෝ අන්‍යාකාරයෙන් අත්පත් කර ගැනීම

* ජාතික ග්‍රන්ථ විද්‍යා සේවා සහ ජාතික හා ජාත්‍යන්තර පුස්තකාල ද්‍රව්‍ය සූචිය ද ඇතුළු ව ග්‍රන්ථ විද්‍යා සේවා සැපයීම

* රට තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ලේඛන හා ප්‍රකාශනවල ජාතික ග්‍රන්ථ විද්‍යා දත්ත සැකසුම් පිහිටුවීම

* ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම

* සියලු ජන කොටස්වලට තොරතුරු යොමු කිරීමේ සේවා, ප්‍රතිකෘති සහ ලේඛන ම ය පර්යේෂණ සේවා සැපයීම

* සියලු ම සාමාජිකයන්ට රට තුළ හෝ ඉන් පිටත දී ලබාගත හැකි හෝ අනාගතයේ දී ලබාගතහැකි පුස්තකාල හා ප්‍රලේඛන සම්පත්වලට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම

* ශ්‍රී ලාංකේය ප්‍රජාවේ සියලු කොටස්වලට සේවය කරන මහජන, පාසැල්, ශාස්ත්‍රීය, රජයේ හා වෙනත් පුස්තකාල සහ වෙනත් ප්‍රලේඛන තොරතුරු මධ්‍යස්ථාන ජාල ද ඇතුළු ව පුස්තකාල හා ප්‍රලේඛන ජාල පිහිටුවීම, වැඩිදියුණු කිරීම, පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය කිරීම. ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය දීම

* පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම, පුස්තකාල අතර බැහැර දීම හා ලේඛන පිටපත් කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා හුවමාරු කර ගැනීම ද ඇතුළු ව ජාතික හා ජාත්‍යන්තර පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන අතර සහයෝගිතාව හා සම්පත් බෙදාහදා ගැනීම මෙන් ම වර්ධනය කිරීම

*        ශ්‍රී ලංකාවේ පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානවලට නවතම තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම, කාර්යක්ෂම ලෙස භාවිත කිරීම, එය ප්‍රවර්ධනය කිරීම මෙන් ම වෙනත් ආයතනවලට උපදෙස් හා පුහුණුව ලබා දීම.

යනාදී අයුරින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ඉලක්කගත පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා නිරතුරුව කටයුතු කරමින් පසු වේ.

## *        ජාතික පුස්තකාලයේ සම්පත්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සඳහා තොරතුරු අත්කර ගැනීමේ දී දැනට අනිවාර්ය නීති ම ය තැන්පතු ක්‍රමය යටතේ හා පරිත්‍යාග, ජාත්‍යන්තර පොත් හුවමාරු, ප්‍රමිති අංක සහ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ ලබා ගනියි. මිල දී ගැනීම යටතේ ලංකාවේ පළවන ප්‍රකාශන, විදේශ රටවල ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රකාශන, ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර, පුස්තකාල හා විඥාපන විද්‍යාවට අදාළ ප්‍රකාශන හා ආයතනයේ අරමුණුවලට උචිත වෙනත් පුස්තකාල ද්‍රව්‍ය ලබා ගනු ලැබේ.

ඒ යටතේ 1976 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කරන ලද සම්පූර්ණ පුවත්පත් එකතුවක් මෙහි තිබේ. එසේ ම කාලීන මාතෘකා 150 කට ආසන්න ප්‍රමාණයක පුවත්පත් ලිපි කැපුම් ගොනු එකතුවක් ද පවතී. දේශීය හා විදේශීය වශයෙන් සහරා එකතුවක් සැලකිය යුතු මට්ටමකින් පවතින අතර සහරා, ලිපි අනුක්‍රමණිකාවක් ඇති නිසා අදාළ සහරා සොයා ගැනීමට පහසු වේ. තව ද ශබ්දකෝෂ, විශ්වකෝෂ. පර්යාය කෝෂ ප්‍රාථමික ග්‍රන්ථ, අත්පොත් හා නාමාවලි යන නවතම මූලාශ්‍ර ඇතුළත් [illegible] සම්පූර්ණ විමර්ශන ග්‍රන්ථ එකතුවක් තිබෙන අතර ප්‍රධාන ශ්‍රී ලංකා

එකතුව යටතේ 1976 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පළ වූ ප්‍රකාශනවල සම්පූර්ණ එකතුවක් හා සියවස් ගණනාවකට පෙර ලියන ලද සාහිත්‍ය කෘති ගණනාවක් ඇතුළු ජාතික මට්ටමේ වැදගත්කමක් ඇති පුස්කොළ පොත් එකතුවක් ද සුරැකි ව තිබේ. එසේ ම මෙරට හා විදේශීය විශ්වවිද්‍යාලවලින් ලාංකික විද්වතුන්ට ප්‍රදානය කරනු ලබන ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශනසූරි යනාදි උපාධිවලට අදාළ නිබන්ධන එකතුවක් ද මනා ව පවත්වාගෙන යමින් පවතියි. පුස්තකාල හා විඥාපන විද්‍යාව යටතේ දේශීය වශයෙන් ඇති පුළුල් ම එකතුව මෙහි තිබෙන අතර (LISA) යන විද්‍යුත් මූලාශ්‍ර ද පාඨකයන් සඳහා වෙන් කර තිබේ. මෙහි ඇති අනෙකුත් විශේෂත්වය නම් සුවිශේෂ එකතු ගණනාවක් පැවතීමයි. ඒ අතර මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ග්‍රන්ථ එකතුව (ප්‍රදර්ශනාගාරය සහිත පුස්තකාලය) ඉතා වැදගත් ය. මීට අමතර ව මහාචාර්ය එම්.එච්. පීටර් සිල්වා එකතුව, මහාචාර්ය ටිකිරි අබේසිංහ එකතුව, වෛද්‍ය ඊ.එම්. විජේරාම එකතුව, ආචාර්ය පී.බී. සන්නස්ගල එකතුව, තේජා ගුණවර්ධන හා පණ්ඩිත් ගුණපාල සේනාධීර යන විද්වතුන්ගේ පෞද්ගලික පොත් එකතු ප්‍රධාන ය. මීට අමතර ව යුනෙස්කෝ එකතුව, වැනි ජාත්‍යන්තර සංවිධාන මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු මූලාශ්‍ර පවතී. විද්‍යා තාක්ෂණ විමර්ශන ග්‍රන්ථ එකතුව, නාට්‍ය අත්පිටපත් හා බ්‍රේල් ප්‍රකාශන එකතුව ද විශේෂ එකතු යටතේ ඇති අනෙකුත් එකතුය.

1939 පුවත්පත් ආඥා පනතට හා 1885 මුද්‍රණ කරුවන්ගේ සහ ප්‍රකාශකයින්ගේ ආඥා පනතට අනුකූල ව ශ්‍රී ලංකාවේ පළවන සැම ප්‍රකාශනයකින් ම පිටපතක් 1976 සිට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ නීති ම ය තැන්පතු එකතුව යටතේ පවතී. විවිධ මාදිලියේ සිතියම් එකතුවක් ද ඇති අතර 1888 සිට මේ දක්වා සම්පූර්ණ ගැසට් එකතුවක් ද තිබේ. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ව රජයේ හා අන්තර් ජාතික සංවිධානවලට අදාළ ව රජයේ හා අන්තර්ජාතික සංවිධානවල අනුග්‍රහයෙන් දේශීය හා විදේශීය විශේෂඥයින් විසින් සිදු කරන ලද විශේෂ අධ්‍යයන වාර්තා මෙන් ම ශ්‍රී ලංකාවේ වාණිජ කර්මාන්තයේ ප්‍රධාන

ආයතනවල හා රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථා මණ්ඩලවල පාලන වාර්තා එකතුවක් ද මෙහි තිබේ. තව ද අන්තර්ජාලය ඇතුළු විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාළ පරිගණක දත්ත පදනම් (Data Bases) ගණනාවක් ම මෙහි තිබේ. ඒ අතරින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටලුව, පිළිබඳ දත්ත පදනම අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක හා ප්‍රකාශක තොරතුරු විවිධ විෂය අනුක්‍රමණිකා, විශේෂ එකතුව, ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව හා පුස්තකාල හා විඥාපන විද්‍යා සඟරා ලිපිවල තොරතුරු අඩංගු දත්ත පදනම් සහ Encarta, CD - ROMs, යනාදි විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර මෙහි තිබේ. එසේ ම ජාතික පුස්තකාලයේ ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව යටතේ විවිධ ගීත, චිත්‍රපට, ටෙලිනාට්‍ය, වාර්තා වැඩසටහන් හා විවිධ මාතෘකා යටතේ දේශන ආදිය ගබඩා කොට තිබේ. සූක්ෂම සේයාපට එකතුවක් ද පුවත්පත් විස්තර අඩංගු තොරතුරු සම්පත් වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ රැස්කර ඇත්තේ සුවිශේෂ ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කරමිනි.

## සේවාවන්

දැයේ හදවත බඳු පාසැල් පද්ධතියට ජීවය සපයන පාසැල් පුස්තකාල සේවාවන් සංවිධානය කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී අවශ්‍ය උපදෙස් හා ආධාර උපකාර කිරීමත් එසේ ම අනෙකුත් අංශවල පුස්තකාල සංවර්ධනය කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය දක්වන උනන්දුව විශාලය. රට තුළ යහපත් පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පොත්පත් පළ කිරීමේ දී ලේඛකයන්ට පමණක් නොව ප්‍රකාශකයන්ට ද විවිධ අයුරින් අනුග්‍රහය දක්වති. එසේ ම ජාතික හා ප්‍රාදේශිය මට්ටමින් පුස්තකාල සේවාව නඟාසිටුවීම සඳහා සැලසුම් සැකසීම, ශ්‍රේණිගත කිරීම්, හා අදාළ අධිකාරී ආයතනවලට උපදෙස් හා ආධාර උපකාර කිරීමටත්, පුස්තකාල සේවාවන් නවීකරණය කරලීම සඳහා තොරතුරු ජාල සහ පරිගණකගත පුස්තකාල සේවාවන් වැනි තාක්ෂණය හඳුන්වාදීම පුස්තකාල හාවිතය නඟාසිටුවීම වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ පාඨක සේවාව යටතේ මහල් 3 ක ආසන 320 කින් යුත් ඉඩ පහසුකම් සපයා තිබේ. දැනට මෙහි සූචිය සඳහා Alice for Windows මෘදුකාංගය භාවිත කරන හෙයින් අවශ්‍ය පොත්පත් සොයාගැනීමට ද පහසු ය. එසේ ම වැඩිදුරටත් තොරතුරු ගවේෂණය සඳහා ග්‍රන්ථ නාමාවලී අනුක්‍රමණිකා වැනි ද්විතීයික මූලාශ්‍ර හා තෘතීයික මූලාශ්‍ර මඟින් තොරතුරු කරා පියමං කිරීමට හැකි ය. මේ ආකාරයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා ම වෙන් වී ඇති නිසා පාඨකයෙකු වීමට ස්වකීය අනන්‍යතාව පමණක් සෑහේ. මේ සඳහා ඕනෑම කෙනෙකුට අදාළ සාමාජික ගාස්තු ගෙවීමෙන් අනතුරුව සාමාජිකත්වය ලබාගත හැකි ය. මෙහි දී වාර්ෂික හා ත්‍රෛමාසිකව ද සාමාජිකත්වය ලබාගත හැකි අතර ආයතනික හා ජීවිත කාලයට ම ලබා ගතහැකි සාමාජිකත්වය ද තිබේ. කියවීම් මාසය (ඔක්තෝබර්) තුළ නොමිලේ සාමාජිකත්වය ලබාගත හැකි අතර දෛනික ව පුස්තකාලය පරිහරණය කිරීම සඳහා කෙටි කාලීන සාමාජිකත්වයක් ලබාගත හැකි ය. මෙම පුස්තකාලය අඟහරුවාදා සිට සෙනසුරාදා දක්වා පෙ.ව. 8.30 - ප.ව. 4.15 තෙක් විවෘත ව පවතින අතර අඟහරුවාද හා බ්‍රහස්පතින්දා යන දින දෙකේ ප.ව. 6.15 දක්වා පාඨකයන් සඳහා විවෘත ව තිබේ. මෙහි දී පාඨකයන්ට අවශ්‍ය උපදෙස් හා පුස්තකාල ද්‍රව්‍ය සපයා දෙමින් අන්තර්ජාලය, පරිගණක සූචිය, සූක්ෂම සේයාපට වැනි විශේෂ තාක්ෂණික ද්‍රව්‍ය පරිහරණයට සහය වීම සහ ඡායාපිටපත් ලබාදීම වැනි විවිධ අංශවලින් පාඨකයන්ට උදව් කිරීම සිදු වේ. මීට අමතර ව දුරබැහැර පාඨකයන් සඳහා අන්තර් පුස්තකාල පිරුළු සේවා යටතේ තොරතුරු ලබාදීම වැනි සේවා සෘජු ව ලබාගත හැකි සේවාවන් ය.

තව ද පාඨකයන්ගේ ඉල්ලීම පරිදි අදාළ තොරතුරු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ නො මැති නම් එම තොරතුරු ලබාගත හැකි වෙනත් පුස්තකාලයක් හෝ තොරතුරු ආයතනයක් වෙත පාඨකයන් යොමු කරවීමේ ජාතික නිර්දේශිත මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමේ සේවාව ද මෙහි දී සිදු වේ. දැනට පුස්තකාල හා

තොරතුරු මධ්‍යස්ථාන 80 ක පමණ සමාජ විද්‍යාත්මක තොරතුරු මූලාශ්‍ර අඩංගු කොට සකස්කර ඇති ජාතික එකාබද්ධ සූචිය (Union Catalogue),නිසා පාඨක ජනතාවට මෙම සේවාවෙන් තොරතුරු පහසුවෙන් ලබා ගැනීමට හැකිවන අතර මෙය ඉතා මහෝපකාරී සේවාවක් ලෙස හැඳින්විය හැකි ය.

සහන මිලට පොත් අලෙවි කිරීමේ ප්‍රදර්ශන පැවැත්වීම පුස්තකාල අධ්‍යයන චාරිකා සංවිධානය වැනි කටයුතුවලට අමතර ව ඉතිහාසය, සංස්කෘතිය, සාහිත්‍ය හා පුස්තකාල විද්‍යාව සම්බන්ධයෙන් පිළිගත් විද්වතුන් ලවා මාසික ව දේශන පැවැත්වීම යනාදි කරුණු මාර්ගයෙන් පාඨක ජනතාවගේ සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබේ. මෙම ආයතනයෙන් පළ කරනු ලබන ද්විතියික මූලාශ්‍ර යටතේ ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, වාර සඟරා ලිපි අනුක්‍රමණිකා වැනි ප්‍රකාශන සම්පාදනය කිරීම ප්‍රලේඛන සේවා යටතේ කරනුයේ පර්යේෂණ කාර්යයෙහි නියැලි පාඨක ජනතාව වෙනුවෙනි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ජාතික හා අන්තර්ජාතික වශයෙන් ඇති ජාල සමඟ නිරතුරුව ම සබඳතා පවත්වති. ඒ යටතේ ආසියා පැසිපික් කලාපීය සමාජ විද්‍යා විඥාපන ජාලයෙහි (APINESS) ශ්‍රී ලංකාවේ නාභික මධ්‍යස්ථානය ලෙස මෙම ආයතනය කටයුතු කරයි. මෙහි කලාපීය කාර්යාලය තායිලන්තයේ බැංකොක් නුවර පිහිටා තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා තොරතුරු සංවිධානය කරලීම එම විෂය පථය තුළ නියැලි විද්‍යාර්ථීන්ට සීඝ්‍රය වීමත් සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශනවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ජාලනය කිරීමත් සමඟ සමාජ විද්‍යා පුස්තකාල හා තොරතුරු ආයතන සම්බන්ධ කරගෙන දේශීය වශයෙන් ජාලයක් ක්‍රියාත්මක වේ. තව ද දකුණු ආසියාතික සංස්කෘතික තොරතුරු ජාලය (CINSA), ආසියා පැසිපික් කලාපීය බෙහෙත් පැළෑටි පිළිබඳ තොරතුරු ජාලය(APINMAP) හා වෘත්තීය ආරක්ෂණ හා ස්වස්ථතා තොරතුරු ජාලය (OSHINET) යනාදිය කලාපීය ජාල අතරින් ප්‍රධාන ය.

එසේම ජාතික විශයෙන් ද ශ්‍රී ලංකාවේ ඇති ජාලයන් කිහිපයක් සමඟ තොරතුරු හුවමාරු කර ගනියි. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යාත්මක තාක්ෂණික තොරතුරු ජාලය (SLSTINET) සෞඛ්‍ය විද්‍යා පුස්තකාල තොරතුරු ජාලය (HELLIS) කෘෂිකාර්මික තොරතුරු ජාලය (AGRINET) පාරිසරික පුස්තකාල තොරතුරු ජාලය (ENLINET) හා ජාතික අධ්‍යාපනික තොරතුරු ජාලය (NEINET) මේ අතරින් කිහිපයකි. එසේ ම ශ්‍රී ලංකාවේ ඇති පුස්තකාල හා තොරතුරු සම්පත් ඇති ආයතන සන්නිවේදන තාක්ෂණයට යොමු කරලීම සඳහා ජාතික තලයේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙමින් තිබේ. ඒ අතරින් මහජන පුස්තකාල සඳහා අන්තර්ජාල පහසුකම් පවත්වාගෙන යාමට සහයවීම, පුස්තකාල සේවා සඳහා පරිගණක භාවිතය හඳුන්වාදීම, පුස්තකාලවල සේවය කරන කාර්ය මණ්ඩල සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, වැනි කාර්යයන් ආරම්භ කර ඇති අතර ඒ මඟින් රට තුළ යහපත් පුස්තකාල පද්ධතියක් හා ගුණාත්මක අතින් වටිනා කාර්ය මණ්ඩලයක් ඇති වේ යැයි සිතිය හැකි ය. තව ද අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA), යුනෙස්කෝව, ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව (CDNLO) පොදු රාජ්‍ය මණ්ඩලයීය පුස්තකාල සංගමය, (COMLA) ආසියා හා සාගර කලාපීය ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ සමුළුව (CDNLAO), අන්තර්ජාතික ප්‍රලේඛන සංවිධානය (FID) ජාත්‍යන්තර ප්‍රමිති ග්‍රන්ථ ආයතනය හා ඇමරිකන් පුස්තකාල සංගමය (ALA) වැනි ඒවා සමඟ නිරතුරුව සබඳතා පැවැත්වීමෙන් තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයෙහි වෙනත් කිසිදු පුස්තකාලයකින් නො කෙරෙන මෙහෙවරක් ජාතික පුස්තකාලය තුළින් චක්‍රාකාරව සිදු වේ. මේ ආකාරයට රට තුළට පුස්තකාල හා ප්‍රලේඛන තොරතුරු ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත කරලීමේ විශේෂ වැඩසටහන් පෙළක් ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයෙන් සිදුවන බව පාඨක ජනතාව බොහෝමයක් නො දන්නා කරුණකි. පොත්පත් හා පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ඉතා වැදගත් හෙයින් රටපුරා විසිර පැතිර ඇති පුස්තකාල හා තොරතුරු ආයතනවලට අදාළ තාක්ෂණික දැනුම් ලබා දෙමින් ඔවුන් ව දැනුවත් කෙරේ. මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණු

පාඨමාලා ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් මෙහෙය වනු ලැබේ.

## සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු :

පොත්පත් හා පුස්තකාල ද්‍රව්‍ය ඉතා සුරැකිව ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම ඉතාමත් වැදගත් ය. මේ සම්බන්ධ ව රට පුරා විසිරී පැතිරී ඇති පුස්තකාල හා තොරතුරු ආයතන සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙමින් ඔවුන් ව දැනුවත් කිරීම සිදු කෙරේ. මේ සඳහා ප්‍රායෝගික පුහුණු පාඨමාලා ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබේ. මෙ පමණක් නො ව අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ IFLA පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ වැඩපිළිවෙල සමඟ හා ආසියානු අනු කලාපීය පුස්තකාලවල සංරක්ෂණ කටයුතු සම්බන්ධීකරණය සඳහා කලාපීය මධ්‍යස්ථානය වන ජපානයේ ජාතික පුස්තකාලය හා පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ කටයුතු පිළිබඳ විශේෂඥතාවක් දරණ ඉන්දියාවේ ඇති ආයතන හා සංවිධාන කිහිපයක් සමඟ මෙම ආයතනය නිරන්තරයෙන් ම සබඳතා පවත්වයි. තව ද රට තුළ ඇති පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘති යටතේ තම තමන්ගේ ආයතනවල මෙවැනි මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට හැකි ආයතන ප්‍රධානීන්ගෙන් අයදුම්පත් කැඳවා වර්ෂයක දී ආයතන කිහිපයක් තෝරා ගැනේ. මෙහි දී අදාළ ආයතනයෙන් නම් කරන ලද නිලධාරියා පුහුණු කිරීමටත් අවශ්‍ය මූලික සංරක්ෂණ උපකරණ කට්ටලයක් ලබාදීමටත් ජාතික පුස්තකාලය එකඟතාව පළකරයි. මේ ව්‍යාපෘතිය සඳහා දැනට මහජන පාසැල් පිරිවෙන් හා දෙපාර්තමේන්තු හා උසස් අධ්‍යාපන ආයතන පුස්තකාල රාශියක් දායක වී තිබේ. ඒ අනුව කැලණිය විද්‍යාලංකාර පිරිවෙනේ පුස්කොළ පොත් එකතු තැන්පත් කිරීම හා රාජකීය ආසියාතික සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සඳහා ද විශේෂයෙන් සංරක්ෂණය සඳහා ආධාර උපකාර කර ඇති ඒවායෙන් කිහිපය කි.

මීට අමතර ව වෙනත් කටයුතුවලින් මහජනතාවට සහය හා ආධාර කරන ව්‍යාපෘති කිහිපයක් ද මේ ආයතනයෙන් සිදු වන බව ශ්‍රී ලංකාවේ ඈත ප්‍රදේශවල වෙසෙන ජනතාව නො දන්නවා විය හැකි ය. ඒ අතරින් 1984 සිට ම ප්‍රකාශන ආධාර වැඩපිළිවෙලක් ආරම්භ කොට දැනට ශ්‍රී ලංකාවේ ඇති ප්‍රකාශන ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන ප්‍රධාන ම රාජ්‍ය ආයතනය ජාතික පුස්තකාලයයි. මෙයින් දිවයින පුරා එදාමෙදා තුර බිහි වූ ලේඛකයන් රාශියක් සිටිති. එසේ ම නව ප්‍රකාශන සඳහා ද කතුවරුන්ට සහය වීමෙන් ප්‍රකාශන ක්ෂේත්‍රය සඳහා ද දායකත්වයක් සැපයේ.

ශ්‍රී ලංකාවේ පුස්තකාල සඳහා එදා සිට ම කරගෙන ආ තවත් ව්‍යාපෘතියක් වන්නේ පොත් හා උපකරණ ආධාර වශයෙන් සැපයීමයි. මෙය ද කිසිම රාජ්‍ය ආයතනයකින් සිදු නො වන තවත් එක් ව්‍යාපෘතියකි. තව ද සහන මිලට පුස්තකාල ලිපි ද්‍රව්‍ය සහ විවිධ පොත්පත් විශේෂ වට්ටම් යටතේ ලබා දෙමින් ජාතික පුස්තකාල අලෙවිහලෙන් ද දිවයිනේ විවිධ පුස්තකාලවලට හා පාඨකයන්ට අනුපමේය සේවාවක් සිදු කරනු ලැබේ.

## කියවීමේ ප්‍රවර්ධනය :

ජනතාව කියවීමට උනන්දු කරලීම පුස්තකාලවල ප්‍රධාන වගකීමක් බැවින් එය සනිටුහන් කිරීම නො වැදගත් වුවත් වර්තමානයේ දී කියවීමේ ප්‍රවනතාව ජනතාව තුළින් ක්‍රමානුකූල ව ගිලිහෙමින් පවතින බව පෙනේ. මේ සඳහා විවිධ හේතු සාධක බලපෑම් වශයෙන් සිදුවන බව පෙනේ. මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය අවබෝධ කරගෙන ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ. ඒ අනුව 2004 වර්ෂයේ සිට සෑම වසරක ම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය.විසින් නම් කර තිබේ. වර්ෂයකට මාසයක් නම් කර කියවීමේ වටිනාකම ජනතාවට සිහිපත් කර දීමට විවිධ වැඩසටහන් පවත්වාගෙන යන්නේ ලංකා බැංකුවේ හා Room to Read ආයතනයේ ද සහයෝගය ඇතිව යි. මේ යටතේ මාධ්‍ය මඟින් ජනතාව

දැනුවත් කිරීමේ වැඩසටහන්, කියවීමේ කඳවුරු පැවැත්වීම, රචනා, පෝස්ටර්, ඡායාරූප, කථික හා කෙටිකතා යනාදි තරඟ පැවැත්වීමෙන් ජාතික මෙන් ම ප්‍රාදේශීය වශයෙන් ද කියවීමේ අගය මතක් කර දෙමින් ජනතාව තුළ සැබෑ සාක්ෂරතාව ඉහළ නැංවීම කෙරෙහි විශේෂ අවධියකින් මෙම ආයතනය සිටින බව කිවයුතුය.

## * ජාතික පුස්තකාල සතිය :

පොත්පත් ඇතුළු තොරතුරු මාධ්‍යයන්හි මෙන්ම පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන, ප්‍රලේඛන මධ්‍යස්ථාන ආදියෙහි වැදගත්කම පාඨක ප්‍රජාවට සිහිපත් කරලීමේ නවාංගයක් ලෙස ජාතික පුස්තකාලය විසින් ආරම්භ කර ඇති නව තම ව්‍යාපෘතිය " ජාතික පුස්තකාල සතිය " යන වැඩසටහන හඳුන්වාදිය හැකියි. මෙහි දී ද ප්‍රමුඛතාවක් දක්වන්නේ ජනතාව අතර පොත්පත් සුලබ කරවීම, කියවීමට උනන්දු කරලීම, තොරතුරු සම්පත් හඳුන්වාදීම, පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන භාවිතයේ වැදගත්කම සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමයි.

මේ ආකාරයේ තේමාවකින් යුත් මෙවර ජාතික පුස්තකාල සතිය 2009 මැයි මාසයේ දෙවන සතියේ දී ජාතික පුස්තකාල පරිශ්‍රය තුළ පැවැත්වීමට කටයුතු සම්පාදනය කොට තිබේ. මෙහි දී පොත් ප්‍රදර්ශන පැවැත්වීම, ජාතික පුස්තකාලයේ සේවා හා සම්පත් ප්‍රදර්ශනය කිරීම, දේශන පැවැත්වීම, පුස්තකාල සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම, ලේඛකයන් ඇගයීමේ වැඩසටහන් හා සංස්කෘතික අංගයන් ඉදිරිපත් කිරීම, ප්‍රකාශන එළි දැක්වීම වැනි කටයුතු පැවැත්වෙයි. මෙම කාර්යයන් ඉදිරියේ දී මීටත් වඩා පුළුල් ව හා දීප ව්‍යාප්ත මට්ටමින් පැවැත්වීමට ජාතික පුස්තකාලය අදහස් කරගෙන සිටියි.

කෙසේවුවද මේ සෑම කටයුත්තකින් ම අපේක්ෂා කරන්නේ ලෝකයේ ශීඝ්‍රයෙන් සිදුවෙන තොරතුරු පුස්තකාල හා ප්‍රලේඛන

මධ්‍යස්ථාන ඔස්සේ ඈත එපිට සිටින ප්‍රාදේශීය පාඨක ජනතාව වෙත ලබා කිරීම සඳහා කටයුතු කිරීමයි. මේ ආකාරයෙන් පාඨක ජනතාව සඳහා විශාල කාර්යභාරයක් කරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කොළඹ නගරයේ නිදහස් මාවතේ නිස්කලංක පරිසරයක පිහිටා තිබේ. මෙරට පුස්තකාල පද්ධතියට හා පොදු පාඨක ප්‍රජාව සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන නිහඬ ආයතනයක් වුව ද මෙහි ඇති තොරතුරු සම්පත් අතරින් පොත් පමණක් ලක්ෂ 06 ක් පමණ වේ.

මෙවැනි ඥාන නිධියක් ආරක්ෂා කරමින් වර්ධනය කොට මතු පරපුර වෙනුවෙන් සුරැකිව රැකබලා ගැනීම ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලය පමණක් නො ව පුස්තකාල ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සියලු දෙනාගේ ම අතිමහත් වූ වගකීමක් වේ. එසේ ම පාඨක ඔබට පැවරෙන භාරදූර වගකීම හා කාර්යභාරය නම් ඔබේත්, ඔබ දුවාදරුවන්ගේත් අධ්‍යාපනික අරමුණු මුදුන් පමුණුවාගෙන හෙට ලොවට යන අඳුරු මාවත් ආලෝකවත් කර ගැනීමට මෙයින් යම් දායකත්වයක් ගන්නවා ඇතැයි උදක් ම අපේක්ෂා කරමි.

Vආශ්‍රිත ග්‍රන්ථ :


1. අමරසිරි, එම්.එස්.යූ. (සංස්.), (1990) ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සමරු කලාපය, කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

2. අමරසිරි, එම්.එස්.යූ. (සංස්.), (2000) දසවස් සමරුව : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය.

3. රණසිංහ, පියදාස (අනු.), (1989) වෙනස්වන යුගයක ජාතික පුස්තකාල. පුස්තකාල ප්‍රවෘත්ති . 10(1/2), 1 - 6, 15 කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

4. හේමපාල, නුවරඑළියේ. (1996). ශ්‍රී ලංකාවේ නිධිය

තැන්පතු නීතිය : පුස්තකාල පුවෘත්ති, 17(01),16-17.
කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

5. Amarasiri, M.S.U. (1992). National Library of Sri Lanka complets two years. Library News. 13(04).22-23p.
Colombo. Sri Lanka National Library Services Board.

6. www.natlib.lk

# இலங்கை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையும் அதன் செயற்பாடுகளும்

**Mrs. T. Sritharan**
**Deputy Director,**
**National Library and Documentation Services Board**

ஒரு நாட்டின் தேசிய நூலகம் என்பது அந்நாட்டின் அனைத்து அறிவுப் பதிவேடுகளையும் ஒருங்குத் திரட்டி, அந்நாட்டு மக்களுக்கும் அவர்தம் சந்ததியினருக்கும் பயன்படும் வகையில் பாதுகாக்கும் ஒரு நிறுவனமாகும். இலங்கையில் தேசிய நூலகம் 1990ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டமை இலங்கையின் கல்வி, கலாசார அபிவிருத்தி வரலாற்றில் ஒரு முக்கிய நிகழ்வாகும். இலங்கை தேசிய நூலகம் என்ற பெயரில் 1990ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்டாலும், 1970 ஆம் ஆண்டில் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை ஆரம்பிக்கப்பட்டதுடன் அதன் முக்கிய செயற்திட்டமாக இலங்கைத் தேசிய நூலகத்தை அமைக்கும் திட்டமும் ஆரம்பிக்கப்பட்டது. அதன் பின் 1998ல் 51 ஆம் இலக்க தேசிய நூலக சபைகள் சட்டத்திற்கு, இலங்கைப் பாராளுமன்றத்தின் அனுமதியைப் பெற்றதுடன் இலங்கைத் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை எனவும் பெயர் மாற்றம் பெற்று கலாசார ரீதியில் இலங்கையை அபிவிருத்தி செய்து அறிவில் முதிர்ந்த தேசம் ஒன்றை உருவாக்கும் அளப்பரிய பணியை ஆற்றி வருகிறது.

# இலங்கை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் நோக்கங்களும் குறிக்கோள்களும்

- சமுதாயத்தின் சகல பிரிவினர்களினதும் பாவனைக்கென அவர்களின் தேவைகளுக்குப் பொருத்தமான நூலக மற்றும் ஆவணவாக்கல் வளங்களுடன் கூடிய தேசிய சேகரிப்பு ஒன்றை ஏற்படுத்துதல்

- இலங்கையில் அல்லது இலங்கை தொடர்பாக வெளியிடப்பட்டுள்ள நூலக மற்றும் ஆவணவாக்கல் சாதனங்களின் தேசிய திரட்டு ஒன்றினை தாபித்து அதை அபிவிருத்தி செய்து பேணுவதன் மூலம் இலங்கையின் தேசிய பண்பாட்டு மரபியல்புகளை பேணிக் காத்தல்.

- அச்சீட்டாளர் வெளியீட்டாளர் கட்டளைச் சட்டத்தின் கீழ் தேசிய சுவடிகள் கூடத் திணைக்களத்தில் வைப்பிலிடப்படும் இலங்கை வெளியீடுகளின் பிரதிகளைப் பெற்றுக் கொள்ளுதல்.

- இலங்கைத் தேசிய நூற்பட்டியலை வெளியிடல்

- இலங்கையின் சகல சமுதாயப் பிரிவினர்களுக்கும் தகவல் வழிகாட்டற் சேவை, பிரதியாக்கம் மற்றும் ஆவண ஆராய்ச்சி சேவைகளை வழங்குதல்.

- சமுதாயத்தின் எல்லா உறுப்பினர்களும் இலங்கையில் அல்லது இலங்கைக்கு வெளியில் கிடைக்கின்ற அல்லது எதிர்காலத்தில் கிடைக்கக்

கூடியதாக நூலக ஆவண வளங்களை அணுகுவதற்கு வசதி செய்தல்.

- ❖ பொது, பாடசாலை, கல்விசார், அரசாங்க மற்றும் ஏனைய நூலகங்கள், ஆவணவாக்கல் மத்திய நிலையங்களின் வலையமைப்புக்கள் உட்பட இலங்கையில் உள்ள சகல சமூகப் பிரிவினருக்கும் சேவையாற்றும் நூலக ஆவணவாக்கல் வலையமைப்புக்களை ஏற்படுத்தலும் அவற்றை அபிவிருத்தி செய்தலும் அதன் பொருட்டு ஆலோசனை வழங்கலும்.

- ❖ நூலக சாதனங்களை பரிமாற்றம் செய்தல், நூலகங்களுக்கு இடையேயான நூல் இரவல், ஆவணங்களை பிரதி செய்தல், அலுவலகர்களை பயிற்றுவித்தலும், பரிமாற்றம் செய்தலும் உட்பட தேசிய சர்வதேச மட்டங்களில் நூலக ஆவணவாக்கல் மத்திய நிலையங்களின் மத்தியில் ஒத்துழைப்பையும் வளங்களையும் பகிர்ந்து கொள்ளலை ஊக்குவித்தலும் அதற்கு வசதியளித்தலும்.

- ❖ இலங்கையில் உள்ள நூலகங்கள் ஆவணவாக்கல் நிலையங்களில் புதிய தகவல் தொழில்நுட்பங்களை அறிமுகப்படுத்தி வைப்பதும் அவற்றை வினைத்திறனுடன் உபயோகிப்பதும், மத்திய நிலையத்தின் செயற்பாடுகளின் போது அத்தொழில்நுட்பங்களை பிரயோகித்தலும் அவை தொடர்பாக பிற நிறுவனங்களுக்கு ஆலோசனைகளையும், உதவிகளையும் பயிற்சிகளையும் வழங்கல்.

# தேசிய நூலக சேகரிப்புக்களும் சேவைகளும

❖ தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தில் அச்சிடப்பட்ட, கட்புல, செவிப்புல மற்றும் தகவல் தொழில்நுட்ப வளங்கள் உள்ளடங்கலாக போதியளவு தரம் வாய்ந்த நூலக வளங்கள் சேகரிக்கப்பட்டு உசாத்துணைக்காக வைப்பிலிடப்பட்டுள்ளன. இவ்வாறான சேகரிப்புக்களின் போது சில நூலீட்டல் கொள்கைகளும் முறைகளும் நடைமுறைப்படுத்தப்பட்டுள்ளன.

## நூலீட்டல் கொள்கைகள்

❖ இலங்கையில் வெளியிடப்படும் வெளியீடுகள்
❖ வெளி நாடுகளில் இலங்கைப் பற்றி வெளியிடப்படும் வெளியீடுகள்
❖ வெளி நாடுகளில் உள்ள இலங்கையர்களின் வெளியீடுகள்
❖ ஆராய்ச்சிக்கு தேவையானதும் பிறநூலகங்களினால் கொள்வனவு செய்ய கடினமான உசாத்துணை சாதனங்கள்.

## நூலீட்டல் முறைகள்

❖ கட்டாய வைப்புச் சட்டம்

- கொள்வனவு
- அன்பளிப்பு
- சர்வதேச நூற் பரிமாற்றம்
- நிறுவனத்தின் நியம இலக்கம் மற்றும் வெளியீட்டுத் திட்டம்

## தேசிய நூலக சேகரிப்புக்கள்

### ❖ அடிப்படை உசாத்துணை சேகரிப்பு :

கலைக்களஞ்சியங்கள், அகராதிகள், நூற் பட்டியல்கள் போன்ற பல உசாத்துணை நூல்களின் சேகரிப்பு இலங்கையில் உள்ள நல்லதொரு உசாத்துணை சேகரிப்பாக கருத்தப்படுகிறது. இச் சேகரிப்பில் அநேகமானவை சர்வதேச மட்டத்திலான உசாத்துணை நூல்களாக இருப்பதுடன் இலங்கை தொடர்பாகக் ஓரளவு பூரணமான அடிப்படை உசாத்துணை சேகரிப்பு ஒன்றும் உள்ளது. தற்போது வாசகர்கள் உசாத்துணைக்காக இணையத்தை பயன்படுத்துவதால் அதற்குரிய வசதிகளும் செய்து கொடுக்கப்பட்டுள்ளது.

### ❖ பிரதான இலங்கைச் சேகரிப்பு :

1976ஆம் ஆண்டின் பின்னர் இலங்கையில் வெளியிடப்பட்ட வெளியீடுகளின் பூரண சேகரிப்பு ஒன்று தேசிய நூலகத்தில் உள்ளது. இது தேசிய நூலகத்தின் பிரதான சேகரிப்புக்களில் ஒன்றாகும். இதற்கு முன்னைய கால வெளியீடுகள் பூரணமாக இல்லாவிட்டாலும் பாரிய அளவில் உள்ளது.

இலங்கையின் புராதன வெளியீடுகள் பல இடங்களில் பரவிக்கிடப்பதால் அவற்றை கடந்த கால நூல் பட்டியல் சேவைகள் மூலம் இச் சேகரிப்புக்களை நூற் பட்டியல் கட்டுப்பாட்டுக்குள் கொண்டு வர முயற்சி செய்கிறது.

### ❖ ஓலை சுவடிகளின் சேகரிப்புக்கள் :

பல நூற்றாண்டுகளுக்கு முன்னர் காணப்பட்ட ஓலைச் சுவடிகளின் கணிசமான சேகரிப்பு ஒன்று காணப்படுவதுடன் அது தொடர்ந்து வளர்ச்சியடைந்து வருகிறது.

### ❖ பருவ வெளியீடுகளின் சேகரிப்பு

நவீன இலங்கை பருவ வெளியீடுகளின் சிறந்த சேகரிப்பு ஒன்று தேசிய நூலகத்தில் காணப்படுகிறது. நூல் பட்டடியலாக்கப் பிரிவினால் தயாரிக்கப்படும் பருவ வெளியீட்டு கட்டுரைச் சுட்டி ஆராய்ச்சியாளர்கள் தமக்கு வேண்டிய கட்டுரைகளை இனங் காண்பபதற்கு பெரிதும் உதவுகின்றது. பல்வேறு நூலக விஞ்ஞான நிறுவனங்களில் மாணவர்களால் தொகுக்கப்பட்ட பருவ வெளியீட்டுச் சுட்டிகள் பலவும் வாசகர்களின் உபயோகத்திற்காக வைக்கப்பட்டுள்ளது.

### ❖ புதினத்தாள் சேகரிப்பு

1976 ஆம் ஆண்டு செப்டெம்பர் மாதத்திலிருந்து இன்று வரையான சகல தேசிய புதினத்தாள்களும் தேசிய நூலகத்தில் வைப்பிலிடப்பட்டுள்ளன. இப்புதினத்தாள்கள் இப்போது நுண்படச் சுருள்களாக தயாரிக்கப்பட்டு வருகின்றன. இதைவிட புதினத்தாள்களில் உள்ள விஷேட அறிக்கைகள், கட்டுரைகள் போன்றன வெட்டியெடுக்கப்பட்டு வாசகர்களின் உபயோகத்திற்காக சேகரிக்கப்பட்டுள்ளன.

## ❖ பட்டப்பின் ஆய்வறிக்கையின் சேகரிப்பு

இலங்கை மற்றும் வெளிநாட்டு பல்கலைக்கழகங்கள் இலங்கை கல்வி மான்களுக்கு வழங்கிய கலாநிதி மற்றும் தத்துவமாணி பட்டங்களுக்குரிய பட்ட ஆய்வறிக்கைகளின் சேகரிப்பு தேசிய நூலகத்தின் பிரதான சேகரிப்புக்களில் ஒன்றாகும். இலங்கை தொடர்பான விடயங்களுக்கு பிறநாடுகளில் வழங்கப்பட்ட கலாநிதி, தத்துவமானி பட்டங்கள் தொடர்பான ஆய்வறிக்கைகளையும் திரட்டுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது.

## ❖ நூலக தகவல் விஞ்ஞான சேகரிப்பு

தேசிய ரீதியில் உள்ள மிகப் பரந்தளவிலான நூலக தகவல் விஞ்ஞான சேகரிப்பு இதுவாகும். நூலக விஞ்ஞானத்துறை சார்ந்த நூல்கள் தவிர குறிப்பிட்ட விடயம் தொடர்பான சர்வதேச சஞ்சிகைகள் இறுவட்டுக்கள் என்பனவும் அவற்றுள் அடங்கும்.

## ❖ விசேட சேகரிப்புக்கள்

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தில் வாசகரின் உபயோகத்திற்காக பல விசேட சேகரிப்புக்கள் வைப்பிலிடப்பட்டுள்ளன. இலங்கை எழுத்தாளரில் முக்கியமானவரான மார்டின் விக்கிரமசிங்ஹவின் நூற் சேகரிப்பும் அவர் உபயோகித்த பொருட்களுடன் கூடிய விசேட காட்சிக் கூடம் ஒன்றும் ஒழுங்குபடுத்தப்பட்டுள்ளது. மேலும் பேராசிரியர் டீ.ஏ. ஹெட்டியாராச்சி, பேராசிரியர் எம். எச். பீற்றர் சில்வா, பேராசிரியர் டிக்கிரி அபேயசிங்ஹ, பண்டிதர் குணபால போன்ற கல்விமான்களின் தனிப்பட்ட சேகரிப்புக்களும் தேசிய நூலகத்தில் உள்ளன. இவ்வாறே யுனெஸ்கோ, ஆசிய அபிவிருத்தி வங்கி, ஐரோப்பிய பொருளாதார ஒன்றியம் போன்ற சர்வதேச அமைப்புக்களின் வெளியீடுகளும் தேசிய நூலகத்தில் உள்ளன.

## ❖ சட்ட வைப்புச் சேகரிப்பு

1839 ஆம் ஆண்டின் புதினத்தாள் கட்டளைச் சட்டம், 1885 ஆம் ஆண்டின் அச்சீட்டாளர், வெளியீட்டாளர் கட்டளைச் சட்டத்தில் 1976 ஆம் ஆண்டு செய்யப்பட்ட திருத்தம் மற்றும் 1998 ஆம் ஆண்டின் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபைச் சட்டத்திற்கு ஏற்ப இலங்கையில் வெளியிடப்படும் சகல வெளியீடுகளினதும் பிரதியொன்று தேசிய நூலக ஆவணவாக்கல் நிலையத்தில் வைப்பிலிடப்படவேண்டும். இச்சட்ட ரீதியான மானியத்தின் கீழ் கிடைக்கும் வெளியீடுகள்

விசேட சேகரிப்பாக தேசிய நூலகத்தில் வைக்கப்பட்டுள்ளன.

### ❖ தேசப்படச் சேகரிப்பு

இலங்கைத் தேசப் படங்கள் பல்வேறு மாதிரிகளில் வாசகர்களின் உபயோகத்திற்கு வசதியாக பட்டியலாக்கம் செய்யப்பட்டு விசேட பாதுகாப்புடன் கூடிய தட்டுக்களில் வைக்கப்பட்டுள்ளன.

### ❖ வர்த்தமானி சேகரிப்பு

1888ஆம் ஆண்டிலிருந்து இன்றுவரை இலங்கையில் வெளியிடப்பட்டுள்ள சகல வர்த்தமானிகளின் சேகரிப்பு ஒன்று தேசிய நூலகத்தில் உள்ளது. தேசிய நூலகத்தில் உள்ள இலங்கை வெளியீடுகளின் பூரணமான ஒரு சேகரிப்பு வர்த்தமானி சேகரிப்பாகும்.

### ❖ அறிக்கைகள் மற்றும் நாட்டார் இலக்கியச் சேகரிப்பு

இலங்கையின் பல்வேறு அபிவிருத்திச் செயற்திட்டங்கள் தொடர்பான அரசினதும் சர்வதேச அமைப்புக்களினதும் உதவியுடன் வெளிநாட்டு உள்நாட்டு வித்பன்னர்களால் தொகுக்கப்பட்ட விசேட ஆய்வு அறிக்கைகளின் சேகரிப்பானது விசேடமாக கல்விமான்களின் கவனத்தை ஈர்த்துள்ளது. இதைவிட இலங்கையில் முக்கிய வாணிபத்துறை நிறுவனங்களினதும்

கூட்டுத்தாபனங்களினதும் நிர்வாக அறிக்கைகளின் சேகரிப்பும் உள்ளது. மற்றும் நாட்டார் இலக்கியம் தொடர்பாக நிபுணத்துவம் பெற்றவரான காலஞ் சென்ற பீற்றர் விஜேசிங்ஹவினால் வழங்கப்பட்ட கையெழுத்துப்பிரதிகளின் சேகரிப்பு உட்பட பல்வேறு மார்க்கங்களில் கிடைக்கப் பெற்ற கையெழுத்துப் பிரதிகளையும் அச்சிட்டப் பிரதிகளையும் இச்சேகரிப்பு கொண்டுள்ளது. மற்றும் சபையின் வெளியீட்டு உதவித திட்டத்தின் கீழ் வெளியிடப்பட்ட அதிகளவிலான நாட்டார் இலக்கிய நூல்களையும் இது கொண்டுள்ளது.

## சேவைகள்

❖ இலங்கையின் பிரதான உசாத்துணை நூலகமாக விளங்கும் இலங்கை தேசிய நூலகம் நாட்டு மக்கள் அனைவருக்கும் அளப்பரிய சிறந்த சேவைகளை ஆற்றி வருகின்றது. இவற்றில் மிகப்பிரதானமாக குறிப்பிடப்பட வேண்டியது வாசகர் சேவைப் பிரிவாகும். இவ்வாசகர் சேவைப் பிரிவில் வாசகர் கல்விச் சேவை மற்றும் விசாரணை சேவை என்பன நாடி வரும் வாசகரை தகவல் பெறுவதில் ஒரு விழிப்புணர்வை ஏற்படுத்துகின்றன. மற்றும் உசாத்துணை சேவையும் சாதாரண தகவல் சேவையில் நடைமுறைப் விழிப்பு சேவையும் தேர்ந்த தகவல் பரப்புச் சேவையும் முக்கியமானவை. மற்றும் பிரதியாக்கச் சேவைகள் வாசகரை தகவல் உள்ள வேறு இடங்களுக்கு நெறிப்படுத்தும் சேவைகள், உள்ளக நூலகக் கடன்

என்பன வாசகர் சேவைப் பிரிவினால் மிகத் திறம்பட செய்யப்படுகின்றன.

## ❖ நூல் விபரப் பட்டியல் சேவை

ஒரு குறிப்பிட்ட நாட்டில் வெளியிடப்படும் வெளியீடுகளை அவற்றின் பொருளடக்கத்திற்கு ஏற்ப பகுப்பாக்கம் செய்து தொகுக்கப்படும் பட்டியலே தேசிய நூற் பட்டியலாகும். தேசிய நூற் பட்டியலை தொகுத்தல் தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் செயற்றிட்டங்களில் ஒன்றாகும். மாதாந்தம் வெளிவரும் தேசிய நூற் பட்டியல்கள் மூலம் இந்நாட்டில் அதற்கு முன்னைய மாதங்களில் வெளிவந்த வெளியீடுகள் தொடர்பாக தகவல்கள் தரப்படுகின்றன. இதில் சிங்களம், தமிழ், ஆங்கிலம் ஆகிய மும்மொழிகளிலும் வெளியிடப்படும் வெளியீடுகள் உள்ளடக்கப்படுகின்றன. பொருள் வகுப்பு மற்றும் ஆசிரியர் விடயத் தலைப்புக்களை கொண்ட அட்டவணை பிரிவு என இருபிரிவுகளைக் கொண்டுள்ளது. நூலகங்களுக்கு நூல் தெரிவு செய்யும் போது அவற்றை ஒழுங்கு படுத்தும் போதும் வாகசர் சேவையை வழங்கும் போதும் தேசிய நூற் பட்டியலில் கிடைக்கும் சேவை அளப்பரியதாகும்.

இதைவிட இலங்கையில் அச்சுக்கலை அறிமுகப்படுத்தி வைக்கப்பட்ட 1737 ஆம் ஆண்டிலிருந்து தேசிய நூற் பட்டியல் ஆரம்பிக்கப்பட்ட 1963 ஆம் ஆண்ட வரையான 226 வருடங்களுள் வெளியிடப்பட்ட வெளியீடுகள்

தொடர்பான கடந்தகால நூல்டிவிபரப் பட்டியலும் மூன்று மொழிகளிலும் தயாரிக்கப்பட்டு வெளியிடப்படுகிறது. மேலும் சில விசேட நூல் விபரப் பட்டியல்களும் தயாரிக்கபட்டு வெளியிடப்படுகின்றன.

அடுத்து இலங்கைப் பற்றி வெளியிடப்படும் பருவ வெளியீடுகளில் உள்ள கட்டுரைகள் தொடர்பான பட்டியலாக்கத் தரவுகளை உள்ளடக்கும் இலங்கை பருவ வெளியீட்டு கட்டுரைச் சுட்டி மூன்று மாதங்களுக்கு ஒரு தடவை நூல் விபரப் பிரிவினால் வெளியிடப்படுகிறது. இது ஆராய்ச்சியாளர்களுக்கு மிகவும் பிரயோசனமானதாகும். மற்றும் கொள்வனவு, அன்பளிப்பு, பரிமாற்றம் போன்ற பல்வேறு வழிகளில் நூலீட்டல் செய்யப்படும் நூல்கள், பருவ இதழ்கள், புதினத்தாள்கள் ஒளி, ஒலி நாடாக்கள் நுண்படச் சுருள்கள் தேசப் படங்கள், இசைத் தட்டுக்கள், ஓலைச் சுவடிகள், கையெழுத்துப் பிரதிகள் போன்றவற்றை பட்டியல் படுத்தும் செயற்பாடும் இப்பிரிவில் செய்யப்படுகின்றது.

## ❖ ஆவணவாக்கற் சேவை

தேசிய நூலகம் ஒன்றின் முக்கிய செயற்பாடுகளில் ஒன்றாக ஆவணவாக்கல் சேவை கருதப்படுகிறது. நாடு முழுவதிலும் பரவிக் காணப்படும் பலவேறு தகவல்களையும் வாசகர்களுக்குப் பயன்படக்கூடிய விதத்தில் ஆவணப்படுத்தி வழங்குகிறது. இலங்கை புதினத்தாள் கட்டுரைச்சுட்டி, இலங்கை அரசாங்க வெளியீடுகளின் நூற்பட்டியல், இலங்கையின்

இனப்பிரச்சினை தொடர்பான வெளியீடுகளின் தரவுத்தளம். இலங்கை கருத்தங்குச் சுட்டி. சமூக விஞ்ஞானிகளின் பட்டியல். சார்க் நாடுகள் பற்றிய நூல் விபரப்பட்டியல். இலங்கையிலுள்ள நூலக விபரங்கள் கதிர்காமம் பற்றிய நூல் விபரப்பட்டியல், பேரதெனிய பல்கலைக்கழக இலங்கைச் சேகரிப்புக்கள் என்பன ஆவணவாக்கற் பிரிவின் வெளியீடுகள் ஆகும். இவற்றை விட இலங்கையிலுள்ள பல்வேறு நூலகங்களையும் ஒன்றிணைத்து செயற்படுத்தும் தேசிய ஒருங்கிணைந்த பட்டியலைத் தயாரித்து வருவதோடு, நற்நெற லங்கா எனும் செய்திச்சரத்தையும் வெளியிட்டு வருகிறது.

## ❖ வெளியீட்டுப் பிரிவின் சேவை

அடுத்து தேசிய நூலகத்தின் வெளியீட்டுப் பிரிவின் சேவைகளில் சர்வதேச நியம நூல் இலக்கத் திட்டம் (ISBN) சர்வதேச பருவ இதழ் இலக்கத் திட்டம் (ISSN) சர்வதேச நியம சங்கீத இலக்க திட்டம் (ISMN) பார்கோட் இலக்கம் பெறுதல், இலங்கை ISBN வெளியீட்டாளர் பட்டியலின் கணனி மயப்படுத்தப்பட்ட தரவுத்தளம், தேசிய நூலக வலையமைப்புக்களுடனான தொடர்புகள் என்பவை முக்கியமானவை.

## ❖ தகவல் தொழில்நுட்பச் சேவை

தகவல் தொழில்நுட்பச் சேவையில் மிகவும் சிறந்த திறமையான நூலக தகவல் சேவையை

பெறுவதற்கு தகவல் தொடர்பு தொழில்நுட்பத்தினை மிகவும் கூடியளவில் பாவிக்க வேண்டியதன் தேவையையும் முக்கியத்துவத்தையும் தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையமானது வலியுறுத்தியுள்ளது. தேசிய நூலக தரவுத்தளத்தை அமைப்பதுடன் தேசிய நூலக நூல்களின் சேர்க்கை (LCAT), தேசிய ஒருங்கிணைந்த பட்டியல் (UCAT), பருவ இதழ்களின் சேர்க்கை (SCAT), நூலக விஞ்ஞான சேர்க்கை (LIS), நூலக விஞ்ஞான பருவ இதழ்களுக்கான சுட்டி (LSPAI), கட்புல செவிப்புல சாதனங்களின் சேர்க்கை (ABCAT), ISBN நூல்களின் சேர்க்கை போன்ற பிரதான கணனி மயப்படுத்தப்பட்ட பல தரவுத் தளங்கள் அமைக்கப்பட்டுள்ளன.

### ❖ பேணல் பாதுகாப்புச் சேவை

அடுத்து நூல் மற்றும் நூல் தவிர்ந்த சாதனங்களை பாதுகாத்துப் பேணல் எந்தவொரு நூலகத்தினதும் தொழில் சார் கடமைகளுள் முக்கிய இடத்தைப் பெறுகிறது. தேசிய நூலக நூற் சேர்க்கையில் அரிய மற்றும் புராதன நூல்கள் மிக முக்கிய இடத்தை வகிக்கும் அதே வேளை இவற்றின் பேணல், பாதுகாத்தல் பற்றி விசேட கவனம் செலுத்துவதோடு நாடு முழுவதும் பரவிக் கிடக்கும் பல நூல்களுக்கு இத்துறை சம்பந்தமாக தொழில்நுட்ப அறிவு இல்லாமையால் இவை பற்றி அந்நூலகங்களுக்கு அறிவூட்டியும் வருகின்றது. தேசிய நூலக சேகரிப்பை பேணுவதற்கு விசேட பாதுகாப்பு நடைமுறைகள் பல ஏற்படுத்தப்பட்டுள்ளன.

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையம் நூலக பேணல் பாதுகாப்பு தொடர்பாக நூலகர்களுக்கும் நூலகப் பொறுப்பாளர்களுக்கும் அறிவைப் புகட்டுவதோடு பல செயற்றிட்டங்களையும் ஆரம்பித்துள்ளது. உலகின் சகல நூலகங்களிலும் உள்ள நூலகச் சொத்துக்களை பாதுகாத்தலின் பொருட்டு யுனெஸ்கோ நிறுவனத்தினால் நடாத்தப்படும் 'உலகின் ஞாபகம்' (Memory of the World) எனும் செயற்றிட்டத்தினதும் சர்வதேச நூலக சங்கங்களினதும் நிறுவனங்களினதும் கூட்டமைப்பினால் (IFLA) நடாத்தப்படும் நூலக சாதனங்களை பேணல் தொடர்பான செயற்றிட்டத்துடனும் தேசிய நூலகம் மிகவும் நெருங்கிய தொடர்புகளை பேணி வருகிறது.

## ❖ தேசிய நூலகத்தின் வெளியீடுகள்

இலங்கை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது அதன் பகுதிகளினூடாக பல்வேறு வெளியீடுகளை செய்து வருகின்றது. அவற்றில் நூல் விபரப் பட்டியல் பிரிவு மற்றும் ஆவணவாக்கற் பிரிவு ஆகியவற்றின் வெளியீடுகள் ஆய்வாளர்களுக்கும் நூலகங்களுக்கும் மிகவும் பயனுள்ளவையாக அமைகின்றன. அவையாவன

- ❖ அரசாங்க வெளியீடுகளின் விபரக் கொத்து
- ❖ இலங்கையிலுள்ள நூலகங்களின் விபரக் கொத்து

- ❖ இலங்கையிலுள்ள சமூக விஞ்ஞான நிறுவனங்கள். தகவல் நிலையங்கள் மற்றும் அவற்றின் தரவுத் தளங்கள் தொடர்பான விபரக் கொத்து
- ❖ நூலகச் செய்திகள்
- ❖ நற்நெற் லங்கா செய்திச்சரம்
- ❖ இலங்கை கருத்தரங்குகளின் சுட்டி
- ❖ இலங்கை சர்வதேச நியம நூல் எண் விபரக் கொத்து
- ❖ இலங்கை தேசிய நூல் விபரப் பட்டியல்
- ❖ இலங்கை தேசிய நூல் விபரப் பட்டியல் (பூர்வகால)
- ❖ இலங்கை பத்திரிகை கட்டுரைச் சுட்டி
- ❖ இலங்கை பருவ இதழ் கட்டுரைச் சுட்டி

## ❖ ஏனைய தேசிய நூலகங்களுடனான தொடர்புகள்

இலங்கை தேசிய நூலகம் அவுஸ்திரேலியா, இங்கிலாந்து. கனடா, சீனா, பிரான்ஸ், இந்தியா, இந்தோனேசியா ஜப்பான், கொரியா, மலேசியா, பிலிப்பையின், சிங்கபூர், தாய்லாந்து. அமெரிக்கா ஐக்கிய நாடுகள் ஆகிய நாடுகளின் தேசிய நூலகங்களுடன் தொடர்புகளை கொண்டுள்ளது. இத்தொடர்புகள் மூலம் நூலக உபகரணங்களை பரிமாறுதல், சர்வதேச நூலகங்களுக்கிடையேயான நூல் இரவல் சேவை. நிபுணர்களின் உதவியைப் பெறல், பயிற்சிப் பாட நெறிகளைப் பெறுதல் போன்ற பல்வேறு விடயங்களில் அவற்றின் ஒத்துழைப்பை பெற்று வருகிறது.

# ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය හා ජාතික එකතුවක් ගොඩ නැගීම

**සේනානි දීපිකා බණ්ඩාර**
පුස්තකාලයාධිපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

නීතිමය තැන්පතු ක්‍රමය යනු යම් කිසි රටක් තුළ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන නීතියෙන් බලය පවරන ලද ආයතනයක තැන්පත් කළ යුතු බවට ඇති නීතිමය ක්‍රමය ලෙස සංක්ෂිප්තව අර්ථ දැක්විය හැකිය. මේ යටතේ ඇතැම් අවස්ථාවල දී ප්‍රකාශනයේ කර්තෘත්වය භාෂාව හෝ විෂය කරුණු මත රටක භූගෝලීය සීමාවන්ගෙන් පරිබාහිරව ද මෙම නීතිය ක්‍රියාත්මක වීම සිදු වේ. නීතිමය තැන්පතු නීතිය යටතේ මූලිකව පරිපූර්ණ ජාතික එකතුවක් ගොඩනැගීම අරමුණුවන අතර එමඟින් රටක බුද්ධිමය උරුමයන් පිළිබඳ වර්තමාන සහ අනාගත සුරක්ෂිතභාවය ඇති කරයි. මීට අමතරව මෙම නීතිය මඟින් බලාපොරොත්තු වන තවත් ප්‍රධාන පරමාර්ථයක් ලෙස යම් රටක ප්‍රකාශනවල ග්‍රන්ථ විඥානාත්මක පාලනයක් ඇති කිරීම දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය සැලකීමේ දී කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ මහාපරිමාණ වෙනස්කම් සිදු වෙද්දී ඊට සාපේක්ෂව අදාළ නීතිමය තත්වයන් දැනට වසර සියයකට අධික කාලයක සිට මූලිකව සංශෝධනයකට ලක්ව නො තිබීමයි. මේ හේතුවෙන් මෙම නීතිය ක්‍රියාත්මකවීමේ දී වර්තමානයේ දුර්වලතා රැසක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය ප්‍රධාන ව්‍යවස්ථා 03ක් මත පදනම් ව ඇත.

1. 1839 අංක 5 දරණ ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනත
2. 1885 ප්‍රකාශකයින්ගේ සහ මුද්‍රණකරුවන්ගේ ආඥා පනත

## 3. 1902 අංක 16 දරණ මුද්‍රණාල පනත

ඉහත තත්වයන් අනුව ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනත අවුරුදු 170 කින් ප්‍රකාශකයන්ගේ සහ මුද්‍රණකරුවන්ගේ ආඥා පනත අවුරුදු 124 කින් මුද්‍රණාල පනත අවුරුදු 107 කින් සංශෝධනයන්ට ලක්ව නො තිබීමෙන් අදාළ නීතිමය තත්වයන් යල් පැන ගොස් ඇති බව මැනවින් පැහැදිලි වේ. මෙම ව්‍යවස්ථාවලට අදාළව මෙතරම් දීර්ඝ කාල පරාසයක් තුළ සිදු වී ඇත්තේ ආඥා පනත් වල නාමය වෙනස් කිරීම හා තැන්පතු පුස්තකාල අලුතින් එක් කිරීම වැනි සුළු වෙනස්කම් කිහිපයක් පමණි. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක නීතිමය තැන්පතු නීති තත්වයන් අධිරාජ්‍යවාදී යුගයේ අවශ්‍යතාවන් අනුව සකස් කළ තත්වයක තවමත් පැවතීම , අද මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව ගැටළු පැන නැගීමට හේතු වී ඇත.

ලෝකයේ රටවල් ගත් විට මෙම නීතිමය තැන්පතු නීතිය නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් මෑත භාගයේ දී සංශෝධනයන්ට ලක් කර ඇත. නිදසුන් වශයෙන් ජර්මනිය, ඉන්දුනීසියාව හා නෝර්වේ යන රටවල් 1990, ප්‍රංශය 1992, ස්වීඩනය 1994, කැනඩාව 1995, දකුණු අප්‍රිකාව 1997, ඩෙන්මාර්කය 1998, ජපානය හා පින්ලන්තය 2000 යන වර්ෂයන්හි දී අදට ගැලපෙන අයුරින් සෑම අංශයක ම පාහේ කැපී පෙනෙන වෙනස්කම් සිදු කොට සංශෝධනයන්ට ලක් කර ඇත.

නීතිමය තැන්පතු නීතිය ක්‍රියාත්මක වන මූලික නෛතික රාමුව සැලකීමේ දී ලෝකයේ රටවල විවිධ නීතිමය ස්වරූපයන් යටතේ ක්‍රියාත්මක වීමක් දක්නට ලැබේ. නිදසුන් ලෙස ප්‍රංශය, ග්‍රීසිය, ඉන්දුනීසියාව, නෝර්වේ, දකුණුඅප්‍රිකාව, ස්වීඩනය, පේරු යන රටවල නීතිමය තැන්පතු ක්‍රමය වෙන ම නීතිමය තැන්පතු නීතියක් වශයෙන් ක්‍රියාත්මක වන අතර ඕස්ට්‍රේලියාව, මහා බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල මෙම නීතිය ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ ක්‍රියාත්මක වීම සිදු වේ. එසේ ම කැනඩාව, ජපානය, නයිජීරියාව,

වෙනිසියුලාව, යන රටවල නීතිමය තැන්පතු ක්‍රමය ජාතික පුස්තකාල පනත යටතේ ක්‍රියාත්මක වේ.

## තැන්පතු ස්ථාන

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය සම්බන්ධ බලය පැවරී ඇති ප්‍රධාන ආයතනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වේ. ලෝකයේ රටවල් සැලකීමේ දී මේ සම්බන්ධ වගකීම පැවරී ඇති ආයතනය වශයෙන් ජාතික ලේඛනාගාරය හෝ ජාතික පුස්තකාලය ක්‍රියාකරනු ලබයි.ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක ආරම්භය ප්‍රමාද වී සිදු වීම රාජ්‍ය ලේඛනාගාරය නීතිමය බලධරයා බවට පත්වීම සඳහා හේතු වන්නට ඇත. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීතිමය තත්වයන් අනුව තැන්පතු පුස්තකාල වශයෙන් ආයතන 05ක නීතිමය පිටපත් තැන්පත් කළ යුතුව ඇත.

1. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාර පුස්තකාලය (1885 සිට )
3. එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය (1885 සිට 1989 මුල් යුගය දක්වා)
4. පේරාදෙණිය විශ්වවිද්‍යාලය (1952 සිට)
5. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය (1976 සිට)

ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය එක් නීතිමය තැන්පතු පුස්තකාලයක් ලෙස සැලකිය හැකිය. රට තුළ ප්‍රකාශයට පත්වන සියලු ම තොරතුරු මූලාශ්‍ර එක් මධ්‍ය ආයතනයක තැන්පත් කර රටේ දියුණුවට හා සංවර්ධනයට පිටිවහලක් වන ආකාරයෙන් එම තොරතුරු විද්‍යානුකූලව හා පුළුල් ග්‍රන්ථ විඥාපන සේවාවක් මගින් සාමාන්‍ය ජනතාවට මෙන්ම පර්යේෂකයන්ටත්, සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදකයන්ටත් අවශ්‍ය සහය සැපයීම නූතන නීතිමය තැන්පතු

නීතියෙන් බලාපොරොත්තු වන ප්‍රධාන පරමාර්ථය වේ. මේ සඳහා පරිපූර්ණ ජාතික එකතුවක් ගොඩනැගී තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

ලෝකයේ රටවල් ගත් විට ප්‍රධාන ජාතික එකතුව එක් ස්ථානයක තැන්පත්ව ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික එකතුව කෞතුකාගාර පුස්තකාලය සතුව ඇත. එසේ ම ජාතික පුස්තකාලය සතුව 1976 සිට නීතිමය පිටපත එක් වීමෙන් ගොඩ නැගුණු ජාතික එකතුවක් හා ජාතික පුස්තකාලය ආරම්භයේදී මෙන් ම පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කරනු ලබන විවිධ ක්‍රම මගින් ගොඩ නගා ගන්නා ලද ශ්‍රී ලංකා එකතුවක් නැත්නම් ජාතික එකතුවක් පවතී. රටක ජාතික එකතුව එක් ආයතනයක් යටතට ගෙන ඒම ජාතික අවශ්‍යතාවක් වේ. එසේ ම එවැනි එකතුවක් රටේ සියලු ම ජනතාවට අවශ්‍ය අවස්ථාවලදී පරිහරණය සඳහා පහසුකම් සලසා තිබීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා ජාතික එකතුවක් එක් රැස් වන ආයතනය සමස්ත ජාතියට ම විවෘත පුළුල් පුස්තකාල සේවාවක් සැපයීමට පොහොසත් ආයතනයක් විය යුතුය. එසේ නොමැතිව නීතිමය පිටපත මගින් නිසි ප්‍රයෝජනයක් නොගෙන හුදෙක් ප්‍රකාශන ගබඩා කිරීමක් වැනි කාර්යයක් පමණක් සිදු වේ නම් ඒ පිළිබඳව විශේෂයෙන් සලකා බැලිය යුතුව ඇත. මේ සඳහා දැනට පවතින නීති සංශෝධනය කිරීම මගින් කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවක් වේ.

එසේ ම විද්‍යානුකූල හා පුළුල් ග්‍රන්ථ විඥාපන සේවාවක්' මගින් මෙම ප්‍රකාශන පිළිබඳ තොරතුරු පුළුල් වශයෙන් ප්‍රචාරය කිරීම, පර්යේෂකයන්ට හා සැලසුම් සකස් කරන්නන්ට හා නව තොරතුරු සොයන සෑම වර්ගයක ම පාඨකයන්ට මේවා ඉක්මනින් හා පහසුවෙන් ලබා ගැනීමට මග සැලසීම නීතිමය තැන්පතු නීතියක් මගින් ආවරණය විය යුතු ප්‍රධානතම ජාතික වගකීමක් වේ. ඒ අනුව විඥාපන කාර්යයන් සම්බන්ධව ප්‍රධාන වගකීම දැරූ ඇති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 1974 වසරේ සිට ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමේ ඇතුළු නවීන ග්‍රන්ථ විඥාපන සේවා කටයුතු රාශියක් ඉටු කරනු ලැබේ. මෙම කාර්යයන් වඩා විධිමත් හා විද්‍යානුකූල වීම

සඳහා පරිපූර්ණ ජාතික එකතුවක් ගොඩ නැගීම අවශ්‍ය වුවකි. ඒ සඳහා නීතිමය තැන්පතු නීතිය මඟින් ලැබිය යුතු පිටිවහල අතිමහත්ය. නමුත් පවතින නීතිමය පසුබිම යටතේ මුද්‍රණකරුවන් නීතිමය පිටපත් ලබා දීමේ ප්‍රතිශතය අඩුමට්ටමක පැවතීමක් දක්නට ඇත. ඒ සඳහා ශක්තිමත් නීති පද්ධතියක් ඇති කිරීම කඩිනමින් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු එකතුවේ බලධරයා වන ජාතික ලේඛනාගාරය මේ සම්බන්ධයෙන් ඉටු කරනු ලබන කාර්ය භාරය ප්‍රධාන වශයෙන් නීතිමය තැන්පතු පිටපත්වල ආරක්ෂකයෙකු හා සංරක්ෂකයෙකු වශයෙන් ක්‍රියා කිරීම, ත්‍රෛමාසිකව ගැසට් පත්‍රයක් මගින් ලැබී ඇති ප්‍රකාශන පිළිබඳව තොරතුරු එළි දැක්වීම, අධිකරණය හා නීතිය හමුවේ ප්‍රකාශන සම්බන්ධ ගැටළු සඳහා ඉදිරිපත්වීම, නීතිමය තැන්පතු යටතේ ලැබෙන අතිරේක පිටපත් අදාළ පුස්තකාල වෙත බෙදා හැරීමට කටයුතු කිරීම යන කටයුතු මූලිකව දැක්විය හැකිය. දැනට සම්පූර්ණ එකතුවක් පවතින ස්ථානය ජාතික ලේඛනාගාරය වන බැවින් නීතිමය බලධරයා වශයෙන් කටයුතු කිරීමේ වගකීම ඉදිරියටත් රාජ්‍ය ලේඛනාගාරය සතු විය යුතුය. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය යටතේ ස්ථාන 05ක පිටපත් තැන්පත් කළ යුතු බවට පවත්නා තත්වයන් ප්‍රායෝගිකව මෙම නීතිය ක්‍රියාත්මක වීමේ දී සංකීර්ණතා ඇති කරයි. එනම් විශේෂයෙන් මිල අධික ප්‍රකාශනයකින් පිටපත් 05ක් දියයුතුව තිබීමෙන් ඔවුන් නීතිය මඟ හැර සිටීමට එය හේතුවක් වී ඇත. මෙසේ පිටපත් 05ක් ලෙස නීතියේ විග්‍රහ වී ඇතත් මෙම පිටපත් සියල්ලෙන් ම තැන්පතු පිටපතක පරමාර්ථය ඉටු වේද යන ගැටළුව අනෙක් අතින් පවතී.

නිදසුනක් වශයෙන් බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයට පිටපත් යැවීම 1989 වසරේ සිට නවතා ඇතත් නීතියට එය ඇතුළත්ව තිබීම ගැටළුවක් බැවින් එය සංශෝධනයට ලක් කළ යුතුය. යටත් විජිත අවශ්‍යතා නියෝජනය වන පරිදි සකසන ලද එම තත්වයන් වෙනස් කළ යුතුව ඇත. එසේ ම පිටපත් 05 ක් තව දුරටත් ලබා ගන්නේ නම් එක් නීතිමය තැන්පතු පිටපතක් උතුරු හෝ නැගෙනහිර ප්‍රදේශයේ

පුස්තකාලයක තැන්පත් කිරීමට කටයුතු කිරීම විධාන් කාලෝචිත වේ.

## ප්‍රකාශන ආවරණය

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක තැන්පතු නීතින් යටතේ ඇතුළත් විය යුතු ප්‍රකාශන මාධ්‍යයන් පිළිබඳව අදට ගැලපෙන නිර්වචනයක් නොතිබීමෙන් ආවරණය විය යුතු ප්‍රකාශන විශාල ප්‍රමාණයක් තැන්පත් නොවේ. කඩදාසි මාධ්‍ය පමණක් ප්‍රකාශන මාධ්‍ය ලෙස පැවැති යුගයක පනවන ලද නීති රාමුවක් යටතේ මෙම නීතිය තව දුරටත් පැවතීම මෙම තත්වයට හේතු වී ඇත.

නීතිමය තැන්පතුව පිළිබඳ නූතන අර්ථකථනයට අනුව මහජනයා වෙනුවෙන් නිකුත් වී ඇති ඕනෑම මාධ්‍යයක ප්‍රකාශන මූලාශ්‍රයන් මෙම නීතිය යටතට යටත්විය යුතු වේ. ඒ අනුව සියලු ම මුද්‍රිත මාධ්‍ය වන පොත්, පුවත්පත්, වාර සඟරා , පත්‍රිකා අත්පත්‍රිකා සිතියම් රජයේ ප්‍රකාශන ආදියත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යටතට ගැනෙන ශ්‍රව්‍ය තැටි වීඩියෝ චිත්‍රපට කැසට් සංයුක්ත තැටි ආදියත්, සූක්ෂම රූපන මාධ්‍යයන්, ඉලෙක්ට්‍රෝනික මාධ්‍ය ප්‍රකාශන වන සංයුක්ත තැටි ඩිස්කට් ආදියත් මෙම නීතිය යටතේ ආවරණය විය යුතුව ඇත.

මෑත කාලයේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ ඇති වූ මහා පරිමාණ වෙනස්කම් සමඟ තැන්පතු නීතිය සම්බන්ධයෙන් ගැටළු මතු විය. ලෝකයේ සෑම රටක ම පාහේ 90 දශකයෙන් පසු නීතිමය තැන්පතු නීති සංශෝධන සඳහා බලපෑ ප්‍රධාන තත්වයන් වූයේ මෙම පරිවර්තනයන් ය. ඒ අනුව නීතිමය තැන්පතු නීති සංශෝධනයෙ 'දී එය අනාගතයේ එක්වන පුස්තකාල මූලාශ්‍ර ඇතුළත් කළ හැකි පරිදි නම්‍යශීලී ලෙස සැලසුම් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය යටතේ ප්‍රකාශන ආවරණය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී දැනට ඇති තත්වය

වන්නේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, සූක්ෂ්ම රූපන, ඉලෙක්ට්‍රෝනික යන මාධ්‍ය කිසිවක් ඇතුළත්ව නොමැති වීමයි. එසේම මුද්‍රිත ප්‍රකාශනවල කඩදාසි මාධ්‍ය පිළිබඳව විමසා බැලීමේ දී සංශෝධනයට ලක් කළ යුතු අංශ ඇත. තව ද රටපුරා නොයෙකුත් ව්‍යාපෘති හා ඒවා ක්‍රියාත්මක කිරීමේ සංවිධාන ශීඝ්‍ර ලෙසින් බිහිවන පරිසරයක පවත්වනු ලබන වැඩමුළු සම්මන්ත්‍රණ හා සම්මේලන වලින් නිකුත් කරනු ලබන විවිධ ආකාරයේ පුනරුපිත ලේඛන හා පොත්පත් සියල්ල ඒකරාශී කිරීමත් නීතිමය තැන්පතුව යටතේ දැනට සිදු නොවන බැවින් අලුතින් ඇති කරනු ලබන සංශෝධන තුළින් මේවා අන්තර්ගත කර ගැනීමට කටයුතු කිරීමත් අතිශයින් ම වැදගත් වේ.

එසේ ම මුද්‍රණ තාක්ෂණයේ ඇති වී ඇති වෙනස්කම් සමඟ ශ්‍රී ලාංකිකයන් රටින් බැහැරව පොත්පත් මුද්‍රණය කිරීමට පෙළඹී ඇත. දැනට පවතින නීතිය යටතේ මෙසේ රටින් පිටත මුද්‍රණය කොට මෙරට ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුව ඇත.

එසේ ම තවත් ඇති අඩුපාඩුවක් ලෙස දැනට පවතින නීතිය යටතේ වාර්ක සඟරා ලියාපදිංචි කිරීම ද සිදුවනුයේ පොත්පත් යන ශීර්ෂය යටතේය. නමුත් වාර්ක සඟරා ලියාපදිංචිය වෙන ම සිදු කිරීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය වේ.

එසේ ම රහස්‍ය වාර්තා දිනපොත්, අත්පිටපත්, අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පැහැදිලි නිර්වචනයක් දීමට කටයුතු කළ යුතුය. එසේ ම ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රෝනික මාධ්‍ය නීතිමය තැන්පතුව යටතට නතුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. එහි දී ඒවා සම්බන්ධ සීමාවන් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ලෝකයේ ඇතැම් රටවල මේ සම්බන්ධයෙන් විශේෂ ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබයි. විශේෂයෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශනවල වෙනම ම කැසට් වීඩියෝ සම්බන්ධයෙන් විශේෂ ආයතන වෙත වගකීම් පවරා ඇත. එම මාධ්‍ය සඳහා විශේෂ ආරක්ෂණ හා සංරක්ෂණ කටයුතු කළ යුතු වීම රට

හේතුවයි. නිදසුනක් වශයෙන ප්‍රංශයේ හා ස්වීඩනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ( චිත්‍රපට, ශ්‍රව්‍ය පැටි ආදිය ) වෙන ම ජාතික ආයතනයක තැන්පත් කිරීමට කටයුතු යොදා ඇත. ප්‍රංශයේ චිත්‍රපට සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ලේඛනාගාරයක් ඇති අතර නීතිමය පිටපත ඒ වෙත යොමු කරයි.

### තැන්පත්කරුවන්

නීතිමය තැන්පතු නීතිය යටතේ ශ්‍රී ලංකාවේ තැන්පත්කරු වශයෙන් මුද්‍රණකරු වෙත මුළුමනින් ම වගකීම පවරා ඇත. ඇතැම් රටවල නීතිමය පිටපත් ලබා දීමේ වගකීම මුද්‍රණකරු හා ප්‍රකාශක යන දෙදෙනා වෙත ම පැවරී ඇත. නිදසුනක් ලෙස ප්‍රංශය දැක්විය හැකිය. එසේ ම ඇතැම් රටවල තැන්පතු නීතියට අනුව කර්තෘ, මුද්‍රණකරු, ප්‍රකාශක හා පොත් ආනයනකරුවන් යන සියලු පාර්ශවයන් වෙත මේ සම්බන්ධ වගකීම පවරා ඇත.

එසේ ම දැනට ක්‍රියාත්මක 1902 අංක 16 දරන මුද්‍රණාල ආඥා පනතට අනුව '' මුද්‍රණාල '' යන වචනය සඳහා ඉදිරිපත් කර ඇති විග්‍රහය අදට නොගැලපෙන්නකි. 20 වෙනි සියවසේ මුල් භාගයේ මුද්‍රණාලයක් යනු අකුරු ඇමිණීමේ පටන් ප්ලේට් සෑදීම, මුද්‍රණය කිරීම, කඩදාසි නැවීම හා පොත බැඳීම යන සියලු කටයුතු සිදු කරන ස්ථානයකි. එහෙත් අද තත්වය ඊට හාත්පසින් ම වෙනස් වන්නකි. අන්තර් සංයෝජන කටයුතු එක් තැනක සිදුවන අතර ප්ලේට් සෑදීම, මුද්‍රණය, පිටකවර මුද්‍රණය, පොත බැඳීම යන කාර්යයන් ද වෙන් වෙන් ස්ථානවල සිදු වන අවස්ථාව ඇත. එහෙයින් මෙම තත්වයට ගැළපෙන ආකාරයට අදාළ පනතෙහි පැහැදිලි අර්ථ කථනයක් සංශෝධන මගින් ඇති කළ යුතුව ඇත.

දැනට ඇතැම් මුද්‍රණකරුවන් සමාගම් පනත යටතේ ලියාපදිංචි වීම නීතිමය තැන්පතු නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වීමට බාධාවක් වී ඇත. එබැවින් නව සංශෝධනයක දී මුද්‍රණකරුවන්

අනිවාර්යයෙන ම මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනත යටතේ ලියාපදිංචි විය යුතු බවට විධි විධාන සැලසිය යුතුය.

## පිටපත් ගණන

සාමාන්‍යයෙන් නීතිමය තැන්පතුවක් සඳහා ලබා දිය යුතු අවම පිටපත් ප්‍රමාණය පිටපත් දෙකක් ලෙස සැලකේ. නමුත් එක් එක් රටවල පවත්නා නීතිමය තැන්පතු නීතියට අනුව තැන්පත් කළ යුතු පිටපත් ගණන රටින් රටට වෙනස් වෙයි. බ්‍රිතාන්‍ය නීතියට අනුව පිටපත් 06 ක් ලබා දිය යුතු වේ. නෝර්වේ හා ස්වීඩනය යන රටවල පිටපත් 07 ක් නීතිමය තැන්පතුවට භාර දිය යුතු වේ. චීනයේ පිටපත් 05 ක් ලබා දිය යුතු වේ. ප්‍රංශයේ ප්‍රකාශක විසින් 04 ක් ජාතික පුස්තකාලයටත් එක් පිටපතක් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයටත් යොමු කළ යුතුව ඇත. එසේ ම ප්‍රංශයේ මුද්‍රණකරු විසින් පළාත් 22 කට අයත් බලයලත් පුස්තකාල 30 කට පිටපත් 02 බැගින් ලබා දිය යුතුව ඇත. නීතිමය පිටපත් වැඩි ප්‍රමාණයක් සැපයිය යුතුව ඇති තවත් රටක් ලෙස ලැට්වියාව දැක්විය හැකිය. එහි පිටපත් 20 ක් ලබා දිය යුතු වේ.

මෙසේ නීතිමය පිටපත් වැඩි ප්‍රමාණයක් ලබා දිය යුතුව ඇති රටවල ඇතැම් ප්‍රකාශන සම්බන්ධයෙන් සීමා කිරීම් සිදු කර ඇත. උදාහරණ වශයෙන් වැඩි වටිනාකමක් ඇති ප්‍රකාශන විශේෂයෙන් ඝන කඩදාසියේ මුද්‍රිත සිතුවම් පොත් , චලන චිත්‍ර සහිත පොත් ආදියෙහි එක් පිටපතක් පමණක් ලබා දීම ප්‍රමාණවත් බව නීතියේ දක්වා ඇත. කැනඩාවේ පිටපත් 03 ට වැඩි පිටපත් 101 කට අඩුවෙන් මුද්‍රණය කරන ලද ප්‍රකාශනවල ද එක් පිටපතක් ලබා දීම ප්‍රමාණවත් වේ. ප්‍රකාශක හෝ මුද්‍රණකරු වෙත ඇති වන ආර්ථික පාඩුව අඩු කිරීමට මෙමගින් උත්සාහ දරයි.

ශ්‍රී ලංකාවේ දැනට පවතින නීතිමය තත්වයන් ට අනුව නීතිමය පිටපත් 05 ක් ලබා දිය යුතුව ඇත. මෙසේ වැඩි පිටපත් ප්‍රමාණයක් ලබා දිය යුතු වීමෙන් ඇතැම් මුද්‍රණකරුවන් විශේෂයෙන් මිල අධික

ප්‍රකාශන ලබා දීමේ දී නීතිය මහහැර යිටීමට උත්සාහ දරයි. මේ නිසා නීතිමය තැන්පතු නීතියෙහි ඇති කරනු ලබන සංශෝධනයක දී මිල අධික ප්‍රකාශන සම්බන්ධයෙන් යම් මිල සීමාවක් ඉක්මවන ප්‍රකාශන සඳහා මුදල් ගෙවා පිටපත් ලබා ගැනීමේ ක්‍රමයක් යෝජනා කිරීමෙන් නීතිමය තැන්පතුවක් හා බැදී පවත්නා අංග සම්පූර්ණ ජාතික එකතුවක් ගොඩ නැගීමත් එමගින් මනා ග්‍රන්ථ විඥානාත්මක පාලනයක් ඇති කිරීමේ කටයුතු සම්බන්ධයෙන් දැනට ඇති ගැටලු මහහැරවීමටත් හැකිවනු ඇත.

## තැන්පත් කළ යුතු කාල සීමාව හා දඩ මුදල්

නීතිමය තැන්පතු පිටපත් අදාළ අධිකාර් බලය ඇති ආයතනය වෙත භාර දීම සම්බන්ධයෙන් ප්‍රකාශක, මුද්‍රණකරු හෝ ඒ සඳහා වග කිව යුතු පාර්ශවයන් වෙත නිසි කාල සීමාවක් පනවා තිබීමෙන් මෙම කාර්යය විධිමත්ව ක්‍රියාත්මක වීම සිදු වේ. ශ්‍රී ලංකාවේ මෙය සෑම මසකම 05 වෙනිදාට පෙර එනම් මසක් ඇතුළත පිටපත් භාර දිය යුතු බවට නීතියේ සඳහන්ව ඇත. ලෝකයේ රටවල මේ සඳහා කාල සීමාවන් පනවා ඇත. නිදසුන් වශයෙන් දකුණු අප්‍රිකාවේ මහජනයාට නිකුත් කිරීමෙන් දින 14 ක් ඇතුළත තැන්පත් කළ යුතු අතර කැනඩාවේ දින 07 ක් ෆින්ලන්තයේ මාස 02 ක් හා ඉන්දුනීසියාවේ මාස 03 ක් ඇතුළතදීත් නීතිමය පිටපත් භාර දිය යුතු වේ. මෙසේ පිටපත් භාර නොදීම සම්බන්ධයෙන් දඩ මුදල් ගෙවීමට නීතියෙන් කටයුතු යොදා ඇත. නිදසුනක් වශයෙන් ජපානයේ ලබ                    ා නොදෙන ප්‍රකාශන සඳහා ප්‍රකාශනයේ වටිනාකම දඩ මුදල වශයෙන් ගෙවිය යුතු වේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින ක්‍රමය යටතේ ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන් ඇතැම් ප්‍රකාශන ලබා නොදී දඩ මුදල ගෙවා නිදහස් වීමට කටයුතු කරන බැවින් ඇති කරනු ලබන සංශෝධනවල දී දඩ මුදල් පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත් වේ.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ ලංකාවේ නීතිමය තැන්පතු නීති සංශෝධනය කිරීම ඉතා වැදගත් වන බවයි. එහෙයින් නීතිමය තැන්පතු නීතියේ ඌනතා හඳුනාගෙන ප්‍රකාශන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවයන්ට හා රටේ ඇති වී ඇති සමාජ, ආර්ථික, දේශපාලනික සංස්කෘතික වෙනස්වීම්වලට අනුරූප වන පරිදි මෙම නීතිය සංශෝධනය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. එය පරිපූර්ණ ජාතික එකතුවක් ගොඩ නැගීම සඳහා මහඟු පිටුබලයක් සපයයි.

### ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


Ceylon Ordinance, <u>Printers and Publishers Ordinance</u> 1885

Ceylon Ordinance, <u>Printers Ordinance</u> 1902

Ceylon Ordinance, <u>Newspaper Ordinance</u> 1839

Davinson, Donald. <u>Academic and legal deposit libraries. London</u>, Clive Bingley, 1965

Jasion, Jan T. <u>The international guide to legal deposit</u>. England, Ashagate Publishing, 1991

Lariviere, Jules. <u>Guidelines for legal deposit legislation</u>. Paris, UNESCO, 2000


### ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර


Dupont. Henrik. "Legal deposit in Denmark: the new law and electronic products". online: Liber <u>http://www.kb.nl/infolev/liber/articles/dupont11.htm</u> (date accessed: 10 March 2000)

Elliot. James D. "Digital map data: archiving and legal deposit implications for U.K. copyright map libraries", online: Liber http://www.kb.nl/infolev/liber/articles/ell-digi.htm (date accessed: 10 March 2000)

Legal Deposit: preserving Canada's published heritage : http://www.collectionscanada.gc.ca/6/25/s25-200-e.html

# දේශීය දැනුම (Indigenous Knowledge) සුරැකීමෙහිලා ජාතික පුස්තකාලයීය ජනශ්‍රැති එකතුවෙහි දායකත්වය

**චන්දිමා වාදසිංහ**
සහකාර පුස්තකාලයාධිපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

නූතන ලෝකය සංවර්ධනයෙහිලා ඉවහල් වූ තීරණාත්මක බලවේගය වන්නේ මිනිසා ලබා ඇති විද්‍යාත්මක හා තාක්ෂණික ඥානයයි. වර්තමානය වන විට බටහිර විද්‍යාවේ දියුණුව හා වර්ධනය හේතු කොටගෙන මිනිසා තාක්ෂණික හා ශිල්පීය දැනුමෙන් පොහොසත්ව ඇති නමුත්, නවීන තාක්ෂණයේ බිහිවීමට පෙර රෝම, චීන, ඉන්දීය, ග්‍රීක, ඊජිප්තු, ශ්‍රී ලාංකික ආදී ශිෂ්ටාචාර සතුව ඉතා දියුණු තාක්ෂණික ක්‍රම පැවති බව අදටත් ශේෂව පවතින ජීවමාන සාක්ෂි මගින් ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. අපගේ අතීත මුතුන්මිත්තන් එදා ඔවුන් සතුව තිබූ ශිල්පීය ඥානය ප්‍රයෝජනයට ගෙන කළ විස්කම් තුළින් බිහිවූ නිර්මාණයන් අදටත් විශ්මයජනකය. නවීන විද්‍යාව හා තාක්ෂණය අභිබවා යන මෙම නිර්මාණයන්ගේ පදනම වන්නේ පාරම්පරික දැනුමයි.

## දේශීය දැනුම (Indigenous Knowledge)

පාරම්පරික දැනුම නැතහොත් දේශීය දැනුම වනාහි සෑම මිනිස් සමාජයකට ම ආවේණික වූ ඒ ඒ ජාතියට අයත් සංස්කෘතික උරුමයකි. ජීවමාන සම්ප්‍රදායට නොව හමාර වුණු සම්ප්‍රදායට අයත්වන මෙම දැනුම්, ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මානවයාගේ බුද්ධිමය හා චින්තන හැකියාව පෙන්වන උද කැඩපතක් ලෙස සැලකිය හැකිය. ජන

ව්‍යවහාරයෙන් ම ලැබූ අත්දැකීම්, ඇසීමෙන් එක්රැස් කරගත් දැනුම හා මුඛ පරම්පරාගතව ඒගෙන ආ දැනුම මෙම බුද්ධිමය දායාදයට අයත් වේ. මේ අනුව සුපුරුදු හෝ නුරුපුරුදු අභියෝග හමුවේ තීරණයන්ට එළඹීමෙහිලා කිසියම් වාර්ගික කණ්ඩායමක් විසින් පාදක කොට ගන්නා ඔවුන් සතු සමස්ත අත්දැකීම් හා දැනුම් සම්භාරය දේශීය දැනුම ලෙස හැඳින්විය හැකිය (Warren, 1989). දේශීය දැනුම් සම්භාරය අපේ මුතුන්මිත්තන් අනාදිමත් කාලයක සිට පාරිසරික හා සමාජමය අභියෝග ජය ගැනීම සඳහා දරන ලද අපිරිමිත උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුවකි. ජාති, ආගම්, කුල, ගෝත්‍ර භේදයකින් තොරව කිසියම් නිශ්චිත භූමි ප්‍රදේශයකට ආවේණික වූ දැනුම, එක් පරම්පරාවකින් ඊළඟ පරම්පරාවට ගෙන යාම මෙහි ලක්ෂණයයි. කෘෂිකර්මය, වාරිකර්මාන්තය, ඖෂධ හා ප්‍රතිකාර, කලාව, ආහාර සංරක්ෂණ ක්‍රම, ජනශ්‍රැතිය ආදී ක්ෂේත්‍රයන් තුළ අන්තර්ගත වූ දේශීය දැනුම, අදාළ ප්‍රදේශයන්ගේ සංවර්ධනය හා ජනතාවගේ පැවැත්ම පිණිස අවුරුදු සිය දහස් ගණනක් මුලුල්ලේ භාවිත කරන ලදී. මේ අනුව මිනිසුන්ගේ පැවැත්මට බලපෑම් කරනු ලබන පොදුවේ භුක්තිවිඳින, පෞරාණික හා ආධ්‍යාත්මික දැනුමක් ලෙස දේශීය දැනුම හැඳින්විය හැකිය (Brascoupe, 2001:3).

ලෝකයේ තිබෙන ඕනෑම දැනුමක්, ප්‍රාථමික අවධියේ දී නැතිනම් මුල් අවධියේ දී දේශීය වශයෙන් බිහිවීම නැතිනම් කිසියම් භූගෝලීය ස්ථානයකට සීමාවී, ස්ථාපිත වීම සිදු වේ. ඒ අනුව දේශීය දැනුම භාවිත කරනු ලබන්නේ එය නිපදවූවන් විසින් ම, එය බිහි වූ ස්ථානයේ දී ම ය.

ik.pages වෙබ් අඩවියට අනුව දේශීය දැනුම් පද්ධතියක ලක්ෂණ කිහිපයකි. එනම්,

* දේශීය දැනුම ජනතාව අතරින් ගොඩනැගේ
* දේශීය දැනුම සංස්කෘතික අංගයකි

* දේශීය දැනුම මගින් මූලික තීරණ ගත හැක
* දේශීය දැනුම ලිඛිත නොවේ
* දේශීය දැනුම ගතිකය

මේ අනුව දේශීය දැනුම ප්‍රායෝගික දැනුම් සම්ප්‍රදායක් වීම, සමාජයට හානිකර නොවීම, මානුෂික ස්වභාවයක් ගැනීම, මිනිසුන්ගේ දිවි පැවැත්ම සඳහා තිබීම, ලාභය ඉපයීම පරමාර්ථය නොවීම ආදී ලක්ෂණවලින් සමන්විත වේ (රණසිංහ, 2004).

ස්වාභාවික පරිසරයේ තිබූ විවිධ සම්පත් මත යැපෙමින් ස්වකීය අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා මිනිසා විසින් සිය ජීවිතය ආරම්භක යුගයේ සිට කාර්මීකරණය නමැති අති දැවැන්ත සමාජ ආර්ථික පෙරළිය දක්වා නිර්මාණය කරගන්නා ලද තාක්ෂණික හා ශිල්පීය දැනුම් සම්භාරය මෙම දේශීය දැනුම තුළ අන්තර්ගත වේ. නවීන විද්‍යාත්මක මෙවලම් හා සාක්ෂරතාව නොමැති වකවානුවක, අදාළ භූගෝලීය ප්‍රදේශයට ආවේණික වූ තාක්ෂණික ඥානය සමග සහජීවනයෙන් සහ ස්වාභාවික සම්පත් මනා කළමනාකරණයෙන් යුතුව පරිභෝජනය කිරීම මගින් ගොඩනගා ගන්නා ලද මෙම දැනුම් සම්භාරය, පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කරනු ලැබුවේ අපගේ මුතුන්මිත්තන් හෙවත් ආදිවාසීන් (Indigenous People) විසිනි. මේ අනුව අතීත මිනිසුන් හා දේශීය දැනුම එකිනෙකට සම්බන්ධ වී ඇති සංකල්පයක් වන අතර ඔවුන් පිළිබඳ අධ්‍යයනය නොකර, දේශීය දැනුම විග්‍රහ කළ නොහැකිය.

විවිධ රටවල වෙසෙන ආදිතම ජන කණ්ඩායම් අදාළ රට තුළ හෝ භූගෝලීය ප්‍රදේශයන්හි දේශීය ජනතාවගෙන් පැවත එන ජන කොටසක් වන අතර ඔවුහු ආදිවාසීන් ලෙස හඳුන්වනු ලබති. ආදිවාසීන් පිළිබඳ විවිධ අර්ථකථනයන් සමාජය තුළ පැවතියත්, වර්තමානයේ ආදිවාසීන් ලෙස පිළිගනු ලබන්නේ විදේශයන්ගෙන් ආනයනය කරන ලද සමාජය, සංස්කෘතික හෝ ආර්ථික විපර්යාසයන්ට අනුගත

නොවී නැතහොත් අවම වශයෙන් අනුගතවී තම පාරම්පරික සම්ප්‍රදාය හැකිතරම් දුරට රැකගනිමින් ජීවත්වන වාර්ගික ජන කොටසක් ය (සෝමසුන්දර, 2007 : 25). යම්කිසි භූගෝලීය ප්‍රදේශයකට උරුම වූ පාරම්පරික දැනුම, පරම්පරාවෙන් පරම්පරාවට උරුම කර දෙනු ලැබුවේ අදාළ ප්‍රදේශය තුළ ජීවත් වූ මුල් පදිංචිකරුවන් විසිනි. මේ අනුව පරම්පරාවන්ගෙන් ලැබුණු උරුමයන්, දැනුම හා විශ්වාසය, සංස්කෘතිය මගින් සන්නිවේදනය, එකිනෙකා අතර සබඳතා ගොඩනැගීම හා පරිසරය සමඟ ජීවත්වීම දේශීය දැනුම් පද්ධතිය තුළ පවතින ලක්ෂණයන් වේ (Kumaran, 2007:2).

## දේශීය දැනුම සම්ප්‍රේෂණය

කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ පවතින දැනුම, අත්දැකීම්, ගැසිරීම් රටාවන් ආදිය තම ඊළඟ පරපුරට බෙදාහරිනු ලබන්නේ සංස්කෘතිය මගිනි. සංස්කෘතිය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබාගත්තා වූ පුරුදු , හැකියාවන් හා අඩංගු සංකීර්ණ සමස්ත සමුදායයි (Tylor ,1871). මේ අනුව පුද්ගලයා සමාජයට අනුගත කිරීමේ දිගුකාලීන සමාජ ක්‍රියාවලිය හෙවත් සමාජානුයෝජන (Socialization) ක්‍රියාවලිය මගින් පවතින සමාජයේ සංස්කෘතික ලක්ෂණ ඊළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය කරනු ලැබේ.

ගෝත්‍ර අවධීන් හා ඉන්පසු සමාජවල ජනතාව, දැනුම හා තොරතුරු ලබාගත් ප්‍රධානතම මාර්ගය වූයේ පාරම්පරිකව සිදු වූ දැනුම් විසරණයයි. පුද්ගලයා තමා අවට පරිසරයට අනුවර්තනය වන්නේ නිරීක්ෂණ ශක්තිය හා අත්දැකීම් මත වන අතරම, ඔහුට පෙර වූ අවස්ථාව ලබාගත් පිරිස මේ සඳහා මඟ පෙන්වන බව සමාජ විද්‍යාඥයෙකු වන බ්‍රොන්ස්ලි මැලිනොව්ස්කි සඳහන් කර ඇත (අත්තනායක, 2005 : 40). මෙම ක්‍රියාවලියේ දී දැනුම බෙදාහැරීම සඳහා ක්‍රියාකාරී වන පිරිස මෙන්ම දැනුම ග්‍රහණය කර ගැනීමට යොමුවන පිරිසක් ද සිටිති.

පෙර පරම්පරාව ⟶ දේශීය දැනුම ⟶ නව පරම්පරාව

අතීතයේ සිට මුඛ පරම්පරානුගතව පැවතුණු මෙම දැනුම ඊළඟ පරම්පරාවට ලබාදෙනු ලැබුවේ අභ්‍යන්තර සංවිධානයන් සහිතවය. එනම් මෙම දැනුම අයුතු ලෙස භාවිත කිරීමෙන් සිදුවන වැරදි භාවිතයන් වැළැක්වීමටත්, දැනුමෙහි අන්තර්ගත ගුප්ත බව හා වටිනාකම හේතුවෙනුත් දැනුම් විශේෂඥයින් විසින්, දැනුම ප්‍රදානය කරනු ලැබුවේ පවුලේ ළඟම ඥාතියෙකු වන තමාගේ පරම්පරාවේ උරුමක්කාරයෙකුට පමණි.

Ruddle සහ Chesterfield (1977) ට අනුව දේශීය දැනුම සම්ප්‍රේෂණය සඳහා කරුණු කීපයක් බලපානු ලබයි (Kumaran,2007: 13-14). එනම්,

* වයස
* ස්ත්‍රී පුරුෂ භාවය
* දේශීය දැනුම් සහිත ක්ෂේත්‍ර (උදා:- කෘෂිකර්මය, කලාව)
* ඉගැන්වීමේ කුසලතා හා අදාළ කාලසීමාව
* වරප්‍රසාද (තෑගි හා දඬුවම්)

මේ අනුව තමන් දුටු දේ, ඇසූ දේ වැඩිහිටියන්ගෙන් උගත් දේ අනාදිමත් කාලයක සිට ආරක්ෂා කොට පරම්පරානුගතව අඛණ්ඩව ඉදිරියට ගලාගෙන යාමට සලස්වනු ලැබුවේ වැඩිහිටි පරපුරෙන් දරු පරපුරට යන මූලධර්මයට අනුවය.

දේශීය දැනුම් කිසියම් සංස්කෘතියක් තුළ සංරක්ෂණය වන අතරම, එය බාහිර සංස්කෘතීන්ගෙන් උකහාගන්නා දැනුම් සම්භාරයන්ගෙන් ද, ජන සමාජය තුළ බිහිවන නව දැනුමෙන් ද

පෝෂණය වේ. එහෙයින් දේශීය දැනුම් බොහෝවිට වෙනස්වන එමෙන්ම සංවර්ධනය වන ක්‍රියාවලියකි (උල්ලුවිස්හේවා, 2006 : 25). එනම් දේශීය දැනුම ස්ථාපිත වූ ස්ථානයට වඩා වෙනස් වූ දැනුම් පද්ධතියක් සමඟ එක්වී එම දැනුම සංවර්ධනය වීම සිදුවේ (Ranasinghe, 2006 : 137). එවිට එම දැනුම සමාජය විසින් පිළිගත් දැනුමක් (Legitimized knowledge) බවට පත් වන අතර එසේ නොවන දැනුම් සම්භාරය අදාළ භූගෝලීය ප්‍රදේශය තුළ දේශීය දැනුම ලෙස ම රඳා පවතී.

## ශ්‍රී ලාංකීය සමාජය හා දේශීය දැනුම

ශ්‍රී ලාංකීය සමාජය තුළ දියුණු ශිෂ්ටාචාරයක් ගොඩ නැඟුණේ ඈත අතීතයේ සිට ය. අද බටහිර විද්‍යාව හා තාක්ෂණික දියුණුව මඟින් විශිෂ්ට සංවර්ධනයක සිටින අපරදිග ජනයා ම්ලේච්ඡව ජීවත් වූ යුගයක, ලක්වැසියා කෘෂිකර්මාන්තය හා වාරිකර්මාන්තය පදනම් කරගත් දියුණු ආර්ථිකයකින් පොහොසත්ව සිටියහ.

ඓතිහාසික යුගයට පූර්වයෙහි පැවතියා වූ යුගය පිළිබඳ කරන ලද ගවේෂණයන්ට අනුව බටහිර ජාතීන්ට බොහෝ සෙයින් පැරණි වූත්, දියුණු වූත්, ශිල්පීය හා තාක්ෂණික දැනුමක් ශ්‍රී ලාංකිකයා සතුව පැවති බව පුරා විද්‍යාත්මක සාධක අනුව පෙනී යයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ ලාංකීය ශිෂ්ටාචාරය තුළ ජීවත් වූ යක්ෂ, දේව, නාග ගෝත්‍රිකයින්ට යකඩ හා වානේ මෙවලම් නිෂ්පාදනය, වෛද්‍ය විද්‍යාව, සංගීතය, චිත්‍ර කලාව, ගෘහ නිර්මාණ ශිල්පය ආදිය පිළිබඳව විශිෂ්ට තාක්ෂණයක් පැවති බව පුරාවිද්‍යාත්මක සාධක අනුව තහවුරු කරගෙන ඇති අතර මෙය ලාංකීය පාරම්පරික දැනුමේ මූලාරම්භය වේ. එමෙන් ම රාවණාධිරාජ්‍ය තුළ වෛද්‍ය ශාස්ත්‍රය, මෙවලම් නිෂ්පාදනය හා කලාශිල්පාදීන්ගෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ හෙළදිව ඉමහත් දියුණු තත්වයක පැවති බව ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් ව ඇත. ප්‍රාග් ඓතිහාසික ශිෂ්ටාචාරයෙන් පසු බෞද්ධාගමේ ආභාසය සහිතව පෝෂණය වූ අනුරාධපුර රාජධානිය උසස් සංස්කෘතික නිර්මිමක්

බවට පත්විය. බෞද්ධාගමෙන් පෝෂණය වූ ලේඛන කලාවක් හා සාහිත්‍යයක් ගොඩනැගීම මෙම යුගයේදී ආරම්භ වූ අතර ගෘහනිර්මාණ ශිල්පය, මූර්ති කලාව, කැටයම් කලාව, චිත්‍ර කලාව ඉතා උසස් තත්ත්වයක පැවතුණි. ගඩොල් හා කළුගල් උපයෝගී කොටගෙන දුටුවන් මවිත කරන ස්තූප, දාගැබ් ආදිය නිර්මාණය තුළින් ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වයත්, සැලසුම් හා භූමි නිර්මාණය, වාරි තාක්ෂණය හා කෘෂිකාර්මික ශිල්ප ක්‍රම පිළිබඳවත් පැරණි ලාංකිකයින් දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රමවලින් හා විශිෂ්ට හැකියාවන්ගෙන් යුක්ත විය. මෙවැනි වූ දැනුම් සම්භාරයක් සහිත වූ ශ්‍රී ලාංකීය සමාජය, විදේශීය ආධිපත්‍යයට නතු වීමත් සමඟම, පරම්පරාවෙන් උරුම වූ තාක්ෂණික ඥානය ක්‍රම ක්‍රමයෙන් අභාවයට යාම සිදු විය.

බටහිර ආධිපත්‍යයෙන් පසු දේශීය දැනුම විද්‍යාත්මක නොවීම, ගුප්ත දෙයක් වීම, වටිනාකමක් නොමැති දැනුම් සම්ප්‍රදායක් වීම, ප්‍රබුද්ධයන් එය භාවිත නොකිරීම, සාක්ෂරතාව නොමැති දුප්පත් ගැමියන්ට පමණක් හිමි දෙයක් වීම සහ වර්ධනය නොවන නමුත් අභාවයට යන සම්ප්‍රදායක් වීම (Ranasinghe, 2008) ආදී සාධක සමාජය තුළ ස්ථාපිත වීම හේතුවෙන් මෙම දැනුම සමාජයෙන් තුරන් වී යාමට පටන් ගැනුණි. විද්‍යාවේ දියුණුවත් සමඟ බටහිර තාක්ෂණය හා ශිල්ප ක්‍රම දේශීය දැනුම් සම්ප්‍රදාය අභිබවා ගිය අතර දේශීය දැනුම හා එහි භාවිතය පිළිබඳව සමාජය තුළ පැවතියා වූ වටිනාකම යටපත්ව ගියේ ය. අනාදිමත් කාලයක සිට කාර්යක්ෂම බවින් ඉහළ මට්ටමක පැවති දේශීය තාක්ෂණික ක්‍රම, වත්මන් නවීන ශිල්ප ක්‍රමවලට සාපේක්ෂව කාර්යක්ෂම බවින් අඩු වීමත්, විද්‍යාවේ මිනුම්දඬු මඟින් අවබෝධ කිරීමට උත්සාහ ගැනීමත් යන සාධක හේතුවෙන් වර්තමානයේ දී මෙම දැනුම් පද්ධතිය අපට අහිමි වී ඇත. සියවස ගණනාවක් පුරා ආදිවාසීහු තම ඊළඟ පරම්පරාවට ලබාදීම සඳහාත්, වැරදි භාවිතයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහාත්, ප්‍රවේණි බූදලයක් ලෙස දේශීය දැනුම් සංරක්ෂණය කළහ. දැනුම් සංරක්ෂණය කිරීමට පහසුකම් හෝ තාක්ෂණික ක්‍රම නොතිබූ යුගයෙහි ජීවත් වූ මෙම දැනුම් ආරක්ෂා කරනු ලැබුවේ කට වචනයෙනි. වර්තමානය වන විට මෙම දැනුමෙන්

යම්කිසි ප්‍රමාණයක ලේඛනගත වී පැවතියත්, බොහෝ කොටසක් තවමත් වාචික සම්ප්‍රදායෙන් ම පවතී.

වසර දහස් ගණනක් විහූතිමත් ශිෂ්ටාචාරයක් බිහිකිරීමට සමත් වූ මෙම විශිෂ්ට දැනුම් සම්භාරය, වර්තමානය වන විට ශාන්තිකර්ම, කෙම් ක්‍රම, ජනශ්‍රැතිය, දේශීය වෙදකම, ආහාර තාක්ෂණය, කෘෂිකර්මය, වාරි තාක්ෂණය ආදී ක්ෂේත්‍රවල යම් ප්‍රමාණයකින් දැකිය හැකි වුවත්, මෙම දැනුමෙන් බොහෝ කොටසක් ලාංකීය සමාජයෙන් තුරන් වී තිබේ. එහෙයින් සංස්කෘතික හා සමාජීය විපර්යාසයන් හේතුවෙන් දිනෙන් දින අභාවයට යමින් පවතින මෙම දැනුම, වර්තමාන හා අනාගත පරම්පරාව වෙනුවෙනුත්, අනාගත පර්යේෂණයන්ට අවශ්‍ය මූලාශ්‍ර සපයා ගැනීම සඳහාත් එක්රැස් කර සංරක්ෂණය කළ යුතුව ඇත.

## දේශීය දැනුම එක් රැස් කිරීමෙහිලා ජාතික පුස්තකාලයේ දායකත්වය

ජාතියේ මහා දැනුම් සම්පත් මධ්‍යස්ථානය වන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යභාරය දැනුම එක් රැස් කිරීම වේ. දැනුම එක් රැස් කිරීමේ දී ලිඛිත දැනුම පමණක් නොව වාචික දැනුම ද එක්රැස් කළ යුතුය. එහෙත් ජාතික පුස්තකාලය වැඩි අවධානයක් යොමු කර තිබෙණුයේ ලිඛිත දැනුම එක් රැස් කිරීමටය. ඒ අනුව ප්‍රධාන එකතුව, නීත්‍යානුකූල තැන්පතුව, පුස්තකාල විද්‍යා, නිබන්ධන, ජනශ්‍රැති, පුවත්පත්, සඟරා. ශ්‍රව්‍ය දෘශ්‍ය, රජයේ ප්‍රකාශන, සිතියම්, පුස්කොළ පොත් ආදී එකතූන්ගෙන් සමන්විත විශාල එකතුවක් ජාතික පුස්තකාලය සතුව පවතී.

මෙම එකතූන් අතරින් ජාතික පුස්තකාල ප්‍රධාන එකතුව තුළ දේශීය දැනුමේ විවිධ විෂය ක්ෂේත්‍ර අන්තර්ගත කරමින් ප්‍රකාශයට පත් කරන ලද මුද්‍රිත ග්‍රන්ථ විශාල සංඛ්‍යාවක් තැන්පත් කර ඇති නමුත්, දේශීය දැනුම් සුරැකීම සඳහා වෙන්වූ එකතුවක් ලෙස පවත්වාගෙන යනු ලබන එකම එකතුව වන්නේ ජනශ්‍රැති එකතුවයි.

ආනන්ද කේ. කුමාරස්වාමිට අනුව ජනශ්‍රැතිය යනු ඓතිහාසික පර්යේෂණයන්ට ලක් වූ වකවානුවට පෙර සිටම පොතපතින් නොව මුඛ පරම්පරාවෙන් සහ මනුෂ්‍ය චර්යාවෙන් එනම් වෙදකම, ගොවිතැන ආදිය හා සමාජ සංස්කෘතිය මඟින් පැවතෙන පරිපූර්ණ අඛණ්ඩ සංස්කෘතිකාංග සම්භාරයයි (රත්නපාල, 1991 : 9). මේ අනුව ජන කතා, ජන කවි, ජන ගී, ජන නාට්‍ය, ජන ක්‍රීඩා, ජන සංගීතය, ජන ඇදහිලි, ජන විශ්වාස ආදිය සඳහා ලිඛිත මාධ්‍යයක් උපයෝගී නොවීමත්, මුඛ පරම්පරානුගතව පැවතීමත් ජනශ්‍රැතියේ ප්‍රධාන ලක්ෂණ දෙකකි (රත්නපාල, 1968 : 1).

ඕනෑම සමාජයක දේශීය දැනුමට අදාළ ව වාචික සම්ප්‍රදායක් හා ලිඛිත සම්ප්‍රදායක් ඇත. පැරණි සෙල්ලිපිවල පටන් වර්තමානයේ පොතපත දක්වා ලිඛිත සම්ප්‍රදායට අයත් වේ. ලිඛිත සම්ප්‍රදායක් බිහි වීමට පෙර සෑම සමාජයක ම පැවතියේ වාචික සම්ප්‍රදායකි. ලේඛන නොමැති අවධියේ එක් පරම්පරාවකින් ඊළඟ පරම්පරාවට දැනුම සම්ප්‍රේෂණය වූයේ වාචිකවය. මේ තුළ විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් බුද්ධිමය දැනුම, තාක්ෂණික දැනුම මෙන් ම කලාත්මක කුසලතාවන් ද අන්තර්ගතව ඇත.

## ජාතික පුස්තකාලයේ ජන සංස්කෘතික මධ්‍යස්ථානයේ ආරම්භය හා පසුබිම

1982 වර්ෂයේ අවසාන භාගයේ දී මහාභාරකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබූ ජාතික අධ්‍යයන සහ පර්යේෂණ ආයතන භාරය කාලීන අවශ්‍යතා කිපයක් සපුරා ගැනීම සඳහා ආරම්භ කරනු ලැබූවකි. පොදුවේ ජාතික අධ්‍යාපන කටයුතු දියුණු කරනු පිණිස පර්යේෂණ මධ්‍යස්ථානයක්, සම්මන්ත්‍රණ ශාලාවක් සහ පුස්තකාලයක් පිහිටුවීම මෙහි මූලික අරමුණ විය. සංස්කෘතික මධ්‍යස්ථානය ආරම්භ කිරීම අනුකාරක සභාවකට පැවරුණි. එම

අනුකාරක සභාවේ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් සංස්කෘතික මධ්‍යස්ථානය සහ කාර්යාලය සඳහා අවශ්‍ය ඉඩකඩ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් ලබාගත හැකි විය. ආසියානු ජනකලා හා සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු කිරීමට තීරණය කරන ලද සංස්කෘතික මධ්‍යස්ථානයේ පරමාර්ථ කිහිපයක් විය (Folklore News, [198?] : 1-2). එනම්,

- ජන කලා අංශයෙන් සංස්කෘතික වැදගත්කමක් ඇති භාණ්ඩයන් ශ්‍රී ලංකාවේ නොයෙකුත් පෙදෙස්වලින් ආධාර වශයෙන් හෝ මිල දී ගෙන ආරක්ෂා කිරීම සඳහා එකතු කිරීම.

- අදාළ භාණ්ඩ සපයාගත නොහැකි අවස්ථාවල දී මධ්‍යස්ථානය මගින් ඒවායේ ප්‍රතිරූප හෝ ඡායාරූප පිළියෙල කොට තබා ගැනීම.

- ඉහත කරුණුවලට අනුව සංස්කෘතික වටිනාකමක් ඇති භාණ්ඩ නීතිය මගින් ඉඩකඩ ඇති පරිදි වෙනත් රටවලින් ලබාගැනීම.

- ජන සංගීතය, ජන කවි, ජන කතා, උපමා වැනි ජන කලාවන් පටිගත කර කැසට් පටවල ආරක්ෂා කිරීම

- ජන නැටුම්, ජන සිරිත් ආදිය විදහා දැක්වෙන වීඩියෝ චිත්‍රපට එකතු කිරීම හා නිෂ්පාදනය මෙන් ම කෙටි චිත්‍රපට නිෂ්පාදනය කිරීම.

- ජන සාහිත්‍ය හා ජන සංස්කෘතිය පිළිබඳ විචාරකයන් හා මානව විද්‍යාඥයින් විසින් රචනා කරන ලද ග්‍රන්ථ ඇතුළත් පුස්තකාලයක් ආරම්භ කිරීම.

- වෙස් මුහුණු, ජන ඇඳුම්, ජන සිතුවම් හා ජන සංස්කෘතික භාණ්ඩ එක්රැස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම.

- ජන සංගීතය, ජන කවි, ජන සාහිත්‍ය පිළිබඳ දැනුම මහජනයාට ලබාදීම.

- දේශීය දැනුම් පිළිබඳව ප්‍රචාරක වැඩපිළිවෙළ ඇති කිරීම සඳහා පර්යේෂණ කිරීම, එයින් සොයා ගන්නා ලද කරුණු අන්තර්ගත කොට සඟරාවක් හෝ පොත් ප්‍රකාශය ට පත් කිරීම, දේශීය සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.

යුනෙස්කෝ ආධාර ඇතිව ජාතික පුස්තකාලය තුළ ජන සංස්කෘතික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ දී, ආසියානු රටවල් කිහිපයක ඡායාරූප, ශ්‍රව්‍ය මාධ්‍යයන්, මුද්‍රිත ග්‍රන්ථ, ගීත ආදිය එක්රැස් කිරීමට පියවර ගනු ලැබුවත් පසුකාලීනව ශ්‍රී ලාංකීය ජන සාහිත්‍ය දැනුම එක්රැස් කිරීමට මූලිකත්වය දී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවට අදාළව රචිත අත්ලිපි, ශ්‍රව්‍ය මාධ්‍යයන් හා පුස්කොළ පොත් ආදීන්ගෙන් මෙම එකතුව සමන්විතව ඇත. අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහාත්,ජාතියේ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහාත් ජනශ්‍රැති එකතුව ගොඩනැංවීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටුකර තිබෙන්නේ එවකට ජාතික පුස්තකාලයේ අධ්‍යක්ෂකව සිටි එන්. අමරසිංහ මහතාය.

## අත් ලිපි එකතුව

මෙම එකතුව ගොඩනැංවීම සඳහා ජනශ්‍රැති විශේෂඥයකු වූ පීටර් විජේසිංහ මහතා විශාල කාර්යභාරයක් ඉටුකර ඇත. එතුමා විසින් රචිත පිටු 7000කින් පමණ සමන්විත වූ ජනශ්‍රැති සාහිත්‍යයට අදාළ අත්ලිපි එකතුව ජාතික පුස්තකාලයේ ජනශ්‍රැති එකතුව සඳ වැදගත්ම හා වටිනාකමකින් යුක්ත එකතුවක් වේ.

1908 ජුනි මස 13 දින උපන් ලද පීටර් විජේසිංහ මහතා සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද්දේ 1929 දිනමිණ පුවත්පතෙහි සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙනි. 1948 සිට 1964 දක්වා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා සඟරාවේ සංස්කාරක ලෙස ද, 1964 සිට 1997 දක්වා බුදුසරණ පුවත්පතෙහි සංස්කාරක ලෙස ද සේවය කරන ලදී. 1982 සිට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ජන සංස්කෘතික අංශයට වාර්තාගත නොවූ ජන සාහිත්‍ය පිළිබඳ අත්ලිපි රචනා සැපයීමෙන් අගනා සේවයක් කළ එතුමා 1986 පෙබරවාරි මස13 වන දින අභාවයට පත් විය .

යම් ජාතියක් සතුව පවතින තතු වටහා ගැනීමට උපකාරී වන එක් ප්‍රධාන මාර්ගයක් වන්නේ ජන කවියයි. පීටර් විජේසිංහයන්ගේ මෙම අත්ලිපි එකතුව සතුව, විවිධ ක්ෂේත්‍ර අළලා පැහැදිලි විස්තර කිරීම් සහිතව රචනා කරන ලද ජන කවි විශාල සංඛ්‍යාවක් අන්තර්ගතව ඇත. උපදේශ කවි, සිව්පද, අලහු සිව්පද, දළදා සින්දු, ගැමි සින්දු, ගම්බද ගී, තේරවිලි සිව්පද, කොහොඹ කවි, පුරාණ ජෝඩු සිව්පද, තේරවිලි කවි, තරහ සිව්පද, ගැමි සිව්පද, විරහ කවි, ආදර කවි, දොළොස්මහේ සිව්පද, තිස්පැයේ ස්ව්පද, කුරහන් කවි, ඔළිඳ කෙළිය, දරු නැළවිලි, වස් කවි, කුරහන් කවි, සෙත් කවි, පැල් සී පද, තලමල් කවි, අනුරාග කවි, ඔන්චිලිවාරම්, ලී කෙළි කවි, අං කෙළි, කරත්ත කවි, නෙළුම් කවි, නෙළුම් තහංචි, ගොයම් කවි, ඌවේ පැල් කවි, උඩරට පැල් කවි, ඌවේ ජන කවි, පන්ටියමන් කවි, පැදුරු රටා, කමත් කවි ආදී විවිධ ක්ෂේත්‍රවලට අදාළව විශාල කවි එකතුවක් ඇත. එමෙන් ම තහන්දි, කිලි, ඇදහිලි, අත් බෙහෙත්, වැව් ශිල්පය, හස්ති ශිල්පය, ගව සම්පත, මී මැසි පාලනය, දේශීය ඉවුම් පිහුම්, ගැමි වහර, පැරණි ගෘහ නිර්මාණ ශිල්පය හා ජනප්‍රවාද පිළිබඳවත්, අභාවයට යමින් පවතින කුරහන්ගල, පිට්ටු බම්බුව, වංගෙඩිය, හිරමනය වැනි මුළුතැන්ගෙයි උපකරණ හා කෘෂි උපකරණ පිළිබඳවත්, වී ගොවිතැන් කටයුතු (යල මහ ගොවිතැන, පැළ සිටුවීම, අස්වැන්න නෙළීම,කමත් සිරිත්, කමත් භාෂා ආදී) පිළිබඳවත් තොරතුරු හා ජන කවි මෙම එකතුවෙහි අන්තර්ගතව ඇත.

# ශ්‍රව්‍ය මාධ්‍යයන්

පරපුරෙන් පරපුරට මෙම දැනුමේ අන්තර්ගත කොටස් අභාවයට යමින් පවතින අතර නව වසර කිහිපයකින් ඉතිරි වී තිබෙන කොටස් ද සම්පූර්ණයෙන් ම වියැකී යා හැකිය. ඒ අනුව මෙම දැනුම වියැකීමට ඉඩ නොදී අනාගත පර්යේෂණ සඳහා ඒ ආකාරයෙන් ම එක්රැස් කිරීමට තබන ලද ඉදිරි පියවරකි ජනශ්‍රැති එකතුවෙහි ශ්‍රව්‍ය පට එකතුව.

ජන ගී, සවුදම්, චූර්ණිකා, නාඩගම්, සිංහල සංගීතය, බෙරවාදන, ජනප්‍රවාද, කොහොඹා කංකාරිය සහ කෝලම් සම්ප්‍රදාය ආදිය අන්තර්ගතකොට පටිගත කරන ලද කැසට් පට අනූවක් මෙම එකතුව සතුව පවතී. ජාතික පුස්තකාලයේ ජනශ්‍රැති මධ්‍යස්ථානය මගින් පටිගත කළ කැසට් පටවලට අමතරව සංස්කෘතික අමාත්‍යාංශය මෙහෙයවන ලද ජන ගී මිහිර වැඩසටහන සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මෙහෙයවන ලද ජන සංගීත පර්යේෂණ වැඩසටහන මගින් පටිගත කළ කැසට් පටවලින් මෙම එකතුව සමන්විත වේ.

1987 දී සංස්කෘතික කටයුතු අමාත්‍ය ඊ. එල් බී. හුරුල්ලේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජන ගී පටිගත කිරීමේ දීපව්‍යාප්ත තරඟ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය මාතලේ දිස්ත්‍රික්කයේ දී පවත්වන ලදී. උප දිසාපතිවරු මාර්ගයෙන් සැබෑ කුසලතාවන් ඇති ශිල්පීන් හඳුනාගැනීමත්, අප්‍රකට ජන ගීවල ශෛලීන් හා තාල ඒ ආකාරයෙන් ම පටිගත කිරීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත. මෙලෙස පටිගත කරන ලද කැසට් පට ආරක්ෂා කිරීම සඳහා ජාතික පුස්තකාලයේන්, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේත්, සංස්කෘතික දෙපාර්තමේන්තුවේත් තැන්පත් කළ යුතු බව ද සමාරම්භක උත්සවයේ දී තීරණය කර තිබේ (FC 484).

ජන සංස්කෘතිය එක්රැස් කිරීමේ සුවිශේෂී සංවිධානයක් වශයෙන් සංස්කෘතික අමාත්‍යාංශය නිෂ්පාදනය කරන ලද "ජන ගී වරුණ" නම් කැසට් පටයයි. මෙම නිෂ්පාදන කටයුතු සඳහා ජාතික

පුස්තකාලය ද දායක වී ඇත. ශ්‍රී ලංකාවේ ජන ගී සම්පත හඳුන්වාදීමත්, ජන ගී එකතු කරන්නන් සඳහා උපදෙස් හා උදාහරණ අන්තර්ගතකොට මෙම කැසට් පටය නිෂ්පාදනය කර තිබේ. මෙහි උපදේශකයින් ලෙස ආචාර්ය එච්.ඒ.පී. අබේවර්ධන, සී. ද එස්. කුලතිලක, හර්බට් පතිරණ, එඩ්වින් කෝට්ටේගොඩ, ජයන්ත අරවින්ද හා රාජා ධර්මපාල යන විද්වත් මඩුල්ලක් කටයුතු කර ඇත. මෙම කැසට් පටයේ පළමු ජන ගීය;

ඉර වර වර ඉර වර වර වරල්ලා
සඳ වර වර සඳ වර වර වරල්ලා
පැදි දියට බොරදිය රත් වරල්ලා
සීපද කියන්නට කවුරුත් වරෙල්ලා (FC 483)

කිසියම් රටක එම රටට උරුම වූ විවිධ දායාදයන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වන්නේ එම රටෙහි සංස්කෘතික තත්වය වටහා ගැනීමෙනි. ජන කවි සංස්කෘතික අංගයකි. එබැවින් ඒ ඒ පළාතට ආවේණික ජන කවි එක්රැස් කිරීම ජාතියේ සංස්කෘතික ආරක්ෂණයට සමාන වේ. අනාදිමත් කාලයක සිට සමාජයේ සංස්කෘතික පරිසරය සුරැකීම සඳහා නොයෙකුත් සමාජ අගයන් හා ධර්මතාවන් ගොඩනගාගෙන ඇති බව මෙම ජන කවි විශ්ලේෂනයේ දී පෙනී යයි. බිළිඳුවියේ දරු නැළවිල්ලේ සිට මරණයේ ශෝක වැළපිල්ල දක්වා සතුටට, දුකට, හුදකලාවට, ආදරයට අප ගැමියා සිය අදහස්, නිදහසේ කිසියම් ලතාවකට කියා පැමෙන් බිහි වූ ජන කවිය, ජන ජීවිතය පිළිබිඹු වන කැඩපතක් වැනිය.

බොහොමයක් ජන කවි රචනා වී තිබෙන්නේ සිව්පද නැතිනම් සතර පාද ක්‍රමයට ය. මෙවැනි කවි ගායනා කරනු ලබන කවි තාලය හා ගායනා ස්වරූපය විශේෂ වන අතර එය නොයෙකුත් තාලයන්ට හා ස්වරූපවලට අනුව ගායනා කිරීම සිදුවේ. කෘෂිකර්මය, වී ගොවිතැන, පැල් රැකීම, කැළෑ කැපීම, අස්වැන්න නෙළීම වැනි ආර්ථික ක්‍රියාකාරකම්වල දී ජන ගී බොහොමයක් නිර්මාණය වී ඇත.

පතල් වැඩ, යකඩ තැලීම ආදී ආර්ථික ක්‍රියාකාරකම්වලදී තම වෘත්තීය, එහි දුක්ගැහැට හා ජීවන අරගලය පිළිබඳව ගායනා කරන ලද අප්‍රකට හා අභාවිත කවි මෙම එකතුව සතුව පවතී.

යකඩ තැලීම පිළිබඳ අප්‍රකට ජන කවියක් ;

මිටිය ගෙනෝ අතට දියෝ ළහට වරෝ ළහට වරෝ
මිටිය ගෙනෝ ළහට දියෝ අඬුව ගෙනෝ ළහට වරෝ
වද මලක පෙති හැඩය කැති තලය පැංවෝ
පළමු මමයි දෙවනු උඹයි ඊළගට මමයි දෙවනු උඹයි
තරු තැට වගෙ විසිරෙනවා ගිනි පුපුරු
මැදට තලෝ අගට තලෝ මෙහෙම තලෝ අගට තලෝ
මෙහෙම තලෝ ඔහොම තලෝ
රඹ කැනක පෙති හැඩය කැති තලය පැංවෝ
මෙහෙම තලෝ එහෙම තලෝ මැදට තලෝ අගට තලෝ
හොඳට බලා ඉගෙන ගනින් මෙහෙම බලා ඉගෙන ගනින්
පවුලේ බරයි ඔය ගින්නට වැඩි නපුරු
ගිනි නිවුනා ගිනි නිවුනා ලිපට දමා විගස ගෙනෝ
නැත ගොවිපලක් හේනක් කුඹුරක් වැපුරු
බැ බැ අලස වුනොත් වැඩ වරදී
හිතට අරන් තල පැටියෝ
වතුර වගේ ගලන ඇගේ දහඩිය මේ වෙහෙස කියයි
ඇයි මහ බඹා අපටම මේ හැටි නපුරු (FC 664)

දළදා සිංදු, ප්‍රශස්ති ගී, වාදන භාණ්ඩ සමඟ ගායනා කරනු ලබන සවුදම් හා ගීත ද මෙම එකතුවෙහි අන්තර්ගතව ඇත. එමෙන්ම ගැමියන්ගේ සිතුම් පැතුම්, සාධාර්ම, බුදුගුණ, වස් කවි, තේරවිලි කවි, ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික කවි, දරු නැළවිලි කවි, තනංවි කවි ආදී විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබන විශාල කවි සංඛ්‍යාවක් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සජීවී ආකාරයෙන් ම පටිගත කර තිබේ.

අභාවිත කෙතහු කවියක් ;

ඉහළ ගෙදර මම යනකොට නෙරිය ගොතනවා කෙතහු
පහළ ගෙදර මම යනකොට හිස පීරනවා කෙතහු
තාදිගු අඩියේ දිගු තර රාජ කෙතන් තන්
තාදිගු අඩියේ ඒලුම තර රාජ කෙතන් තන්
ඇහැල කඳන් රහිත තැනට මැණිකෙ දුවනවා කෙතහු
රන් පුටුවේ අත තියාන කුමරු අඬනවා කෙතහු (FC 663)

ශ්‍රී ලංකාව තුළ ප්‍රකට වන්නම් 18ක් තිබුණ ද ඊට අමතරව අනුරාධපුරය, සබරගමුව හා රුහුණු ප්‍රදේශයට ආවේණික වන්නම් රාශියක් තිබී ඇත. වර්තමානය වනවිට මෙම වන්නම්වලින් බොහොමයක් අප්‍රකටව හෝ අභාවිතව පවතී.

අප්‍රකට වන්නමක් වන චන්ද්‍රලේඛා වන්නම ;

කිරණ නැගෙන එළිය කරන දිනෙන් දිනට මෝරා එන
අවර දිගට බැසගෙන යන කිවිදිගක් වෙතේ
බලන අයට සිත පිනවන අහන අයට මනා සිතන
අහස් ඉහළ ගමන් කරන කිවිදිගක් වෙතේ
තිබුණාට පායා එන සතර වරම් දෙවි සසොබන
නමස්කාර කර නිතියෙන කිරණ ගුණ වෙතේ
ගුණයෙන් කිර්යෙන් සසොබන නමස්කාර කර නිතියෙන
චන්ද්‍රලේඛා නමින් දිලෙන වන්නමක් වෙතේ (FC 498)

ජන කවිවලට අමතරව කොහොඹා කංකාරිය නම් ශාන්තිකර්මය පිළිබඳවත්, එහි දී යොදාගනු ලබන විවිධ අවස්ථාවන් හා සිද්ධීන්, ගායනා ශෛලීන්, බෙරවාදන ආදිය අන්තර්ගත කැසට් පට කිහිපයක් මෙම එකතුව සතු වේ. අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා සිංහල කලාව පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමක් ද ජන සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සිදුකර ඇත. මෙයට අදාළව අභිනිෂ්ක්‍රමණයේ කොළම් සම්ප්‍රදාය, වෙස් මුහුණු කැපීම, ගායනා

ශෛලීන් හා බෙරවාදන ආදිය ඇතුළත් කැසට් පට ද මෙම එකතුවෙහි එක්රැස් කර තිබේ.

අභාවිත හා අප්‍රකටව පවතින ජන කවි, ශාන්තිකර්ම, කෝලම් සම්ප්‍රදාය, බෙරවාදන, ගායනා ශෛලීන් මෙන් ම අභාවයට යමින් පවතින මුළුතැන්ගෙයි උපකරණ ආදිය පිළිබඳවත් සාකච්ඡා මගින් සජීවී ආකාරයෙන් පටිගත කර තිබීම විශේෂ ලක්ෂණයකි. මෙහිදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව ප්‍රවීනයන් සම්බන්ධ කර ගැනීම, ගායනා ස්වරූප හා ශෛලීන්, තාලයන් ඒ ආකාරයෙන් ම ශ්‍රවණය කිරීමට හැකිවීම, දැනුම එක්රැස් කිරීම සඳහා යොදාගෙන ඇති සාර්ථක ක්‍රමයකි.

අත්ලිපි හා ශ්‍රව්‍ය මාධ්‍යයන්ට අමතරව වෙද පොත්, මන්ත්‍ර පොත්, බෙහෙත් වට්ටෝරු ආදීන්ගෙන් සමන්විත කුඩා ප්‍රමාණයේ පුස්කොළ පොත් එකතුවක් ද ජාතික පුස්තකාලයේ ජනශ්‍රැති එකතුව සතුව පවතී.

දේශීය දැනුම බොහෝ සෙයින් දැනට ජීවත්වන වයසක ගැමි පරපුරේ මනසෙහි පමණක් රැඳී ඇති හෙයින් එම පරපුරේ අවසානයත් සමඟම, පරම්පරා ගණනාවක් එකතු වී පැවතුනු දැනුම් සම්භාරය සදහට ම අපට අහිමි වී යාමේ තර්ජනයකට අපි අද මුහුණ පා සිටින්නෙමු. එහෙයින් මෙම දැනුම ඔවුන්ගේ මතකයෙන් ලබාගෙන වර්තමාන හා අනාගත පරම්පරාව වෙනුවෙන් එක්රැස් කර සංරක්ෂණය කිරීම සඳහා ජාතික පුස්තකාලය විශාල සමාජ මෙහෙයක් ඉටුකර තිබේ.

## සමාලෝචනය

ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තීන්ට අදාළව දේශීය දැනුම් රාශිගත කිරීම ප්‍රධාන පරමාර්ථයක් නොවුණත් ඒ සඳහා යම්කිසි උත්සාහයක් ගෙන තිබීම පැසසුම්ට ලක් කළ යුතුය. ජාතික පුස්තකාලයට තනි ආයතනයක් ලෙස විශාල දැනුම් සම්භාරයක් එක්රැස් කිරීම අසීරු කාර්යයක් වූ හෙයින් මෙම ව්‍යාපෘතියේ

ක්‍රියාකාරීත්වය වසර කිහිපයක සිට ඇණහිට තිබේ. එහෙත් ප්‍රාදේශීයව විසිර පවත්නා දැනුම් සම්භාරයන් මහජන පුස්තකාලවල සහාය මගින් එක්රැස් කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කිරීමට ජාතික පුස්තකාලයට හැකියාව පවතී.

බටහිර ආක්‍රමණිකයින් ශ්‍රී ලාංකීය ශිෂ්ටාචාරය යටපත් කර ගැනීමට පෙර ඉතා විශිෂ්ට වූ දැනුම් පද්ධතියක් පැවති බවට පුරාවිද්‍යාත්මක වූ ද, ඓතිහාසික වූ ද, සාක්ෂි මගින් ප්‍රත්‍යක්ෂ කරගත හැකිය. මෙවැනි වූ දැනුම් සම්භාරයක් අනාගත පරම්පරාව වෙනුවෙන් එක්රැස් කර සංරක්ෂණය කිරීම රටක් සතු ප්‍රධාන වගකීමක් වුවත්, පරපුරෙන් පරපුරට විසැකෙමින් පවතිනා මෙම දැනුම රාශිගත කිරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් ශ්‍රී ලාංකීය සමාජය තුළ තවමත් ස්ථාපිත වී නොමැත. තාක්ෂණික මෙවලම් දියුණු වීමත්, ලෝකයම විශ්ව ගම්මානයක් වීමත් තුළ දේශීය දැනුම අපහරණයට ලක්වීම වැළැක්වීම සඳහා ලේඛනගත කිරීම ඉතා වැදගත් වේ. එමගින් පාරම්පරික දැනුම සඳහා වන වෙළඳ අයිතිවාසිකම් වළක්වා, පාරම්පරික දැනුමේ තම අයිතිය තහවුරු කර ගැනීමට අදාළ භූමි ප්‍රදේශයේ ජීවත් වන පාරම්පරික දැනුම් හිමිකරුවන්ට හැකියාව ලැබේ. ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම, සාම්ප්‍රදායිකත්වය හා සංස්කෘතිකත්වය ආරක්ෂා කිරීම, මෙමගින් අත්විත වාසි ප්‍රජාවට හඳුන්වාදීම, දැනුම ආරක්ෂා කිරීම සඳහා සංවිධානයක් ස්ථාපිත කිරීම හා සංරක්ෂණය කිරීම, දේශීය දැනුම් හිමිකරුවන්ට නීත්‍යානුකූල අයිතිය ලබාදීම ආදිය මගින් ප්‍රජාව තුළ හෝ අදාළ භූමි ප්‍රදේශය තුළ ම දේශීය දැනුම සුරැකීමට හැකියාව ලැබේ.

සමාජය වටිනාකමක් සහිත මෙම දැනුම් විනාශයට පත් නොකර සංවර්ධනය කළ යුතුය. එසේ කළ හැකි වන්නේ මෙම දැනුම භාවිතයට ගැනීමෙන් පමණි. ඒ අනුව දිනෙන් දින අභාවයට යමින් පවතින දේශීය දැනුම වර්තමාන හා අනාගත පරම්පරාව වෙනුවෙන් කඩිනමින් එක්රැස් කර සංරක්ෂණය කිරීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අත්තනායක, භාග්‍යා (2005), **කාන්තාව සහ සන්නිවේදනය (ගැමි කාන්තාවන්ගේ ව්‍යවහාරික ඥානය සහ ඵලදායිතාව)**. කොළඹ : ඇස්. ගොඩගේ.

2. උල්ලුවිස්හේවා, රෝහණ (2006), "*දේශීය දැනුම විද්‍යාව සහ තාක්ෂණය*" **මුරගල**, වෙ. 3,ක. 2. මාර්තු, නුගේගොඩ, දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය.

3. රණසිංහ, පියදාස (2004), ***දේශීය දැනුම : එහි ස්වභාවය, සංරක්ෂණය හා සංවර්ධනය*** : ජාතික පුස්තකාල දේශන මාලා, අංක 164

4. රත්නපාල, ඊ. ඇම්. (1991) **ජන ජීවිතය, ජනශ්‍රැතිය හා රැයිගම**. කොළඹ : ඇස්.ගොඩගේ

5. රත්නපාල, නන්දසේන (සංස්.) (1968), **ජන සාහිත්‍යය**. කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

6. සෝමසුන්දර, දයානන්ද (සංස්.) (2007), "*ලෝකයේ ආදිවාසීන් පිළිබඳ හැඳින්වීමක්*", **හෙළදිව්වාසීන් සහ ආදිවාසීන් = Sri Lanka islanders and indigenous people**. සංස්කාරක, කොළඹ : ඇස්. ගොඩගේ.

7. Brascoupe, Simon and Howard Mann (2001). **A community guide to protecting indigenous knowledge.** Canada : Public Works and Government Service [online]. Available : http: / www.ainc.gc.ca.

8. **Folklore News : a supplement to Library News.** "ජන සංස්කෘතික මධ්‍යස්ථානයක්" [198?], Vol. 15, Issue 3-4. Colombo : Sri Lanka National Library Services Board.

9. IK - Pages (**Indigenous Knowledge pages**) http://www.ikpages.net/about.ik.html.

10. Kumaran, T. Vasantha, Dissanayaka, Lakshman and Norber, S. Anthony (2007). **Indigenous knowledge system and sustainability : an appraisal towards resource development.** Colombo : Kumaran Book House.

11. Ranasinghe. Piyadasa (2006). "*Indigenous Knowledge in Sri Lanka*". **Vidyarthi : Annual of the Alumni Association of the department of Library and Information Science.** Kelaniya : University of Kelaniya.

12. Ranasinghe, Piyadasa (2008), "*Preservation and provision of access to indigenous knowledge in Sri Lanka*" : World Library and Information Congress, **74th IFLA General Conference and Council.** Canada, 10-14, August 2008 [online]. Available : http:www.ifla.org/IV/ifla74/papers/106-Ranasinghe - en.pdf

13. Tylor. E.B (1871), **Primitive Culture**.London : John Murray.

14. Warren, M. D. (1989). **Introduction an indigenous knowledge system for agriculture and rural development**, ed.P. Richards. L. Slikaver and A. O. Phillips. Lowa : USA

ජාතික පුස්තකාලයේ ජනශ්‍රැති එකතුවෙහි ශ්‍රව්‍ය මාධ්‍යයන් ;

| | | |
|---|---|---|
| FC 483 | - | ජන ගී වරුණ |
| FC 484 | - | ජන ගී පටිගත කිරීමේ සමාරම්භක උත්සවය |
| FC 498 | - | ජන ගී |
| FC 663 | - | ජන ගී මිහිර |
| FC 664 | - | ජන ගී මිහිර |

# ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය කිරීමට ගතයුතු නව ක්‍රියාමාර්ග


## උදය ප්‍රසාද් කබ්රාල්

**ලේඛන සංරක්ෂක**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**


1970 අංක 17 දරණ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1976 දී පමණ තැන්පත් පුස්තකාලයක් ලෙස ආරම්භ විය. ජාතික පුස්තකාල පරිශ්‍රය ඉදිකිරීමට බොහෝ කලක් ගත වූ අතර ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1990.04.27 වන දින නිල වශයෙන් විවෘත කරන ලදී. ආරම්භයේ දී ලේඛන සුළු ප්‍රමාණයකින් ආරම්භ කළ ජාතික පුස්තකාලය අද වන විට පුස්තකාල ද්‍රව්‍ය අති විශාල ප්‍රමාණයක් සඳහා නිවහන බවට පත් ව ඇත. අද වන විට ජාතික පුස්තකාලය පරිහරණය කරන පාඨක පිරිස ද ඉහළ ගොස් ඇත. විශේෂයෙන් ම විශ්වවිද්‍යාල සිසුන්, නොයෙක් ක්ෂේත්‍රවල පර්යේෂකයින් හා රාජ්‍ය ලේඛන සම්බන්ධ ව උනන්දු වන පාඨකයින් අතර ජාතික පුස්තකාලය ජනප්‍රිය ව ඇත.

ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය ආරම්භ වන්නේ අනුරාධපුර යුගයෙනි. ආදි සිංහලයින් එකල භාවිත කරන ලද පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීමට නොයෙක් ක්‍රමවේද යොදා ගෙන තිබේ. එකල ලේඛන මාධ්‍ය ලෙස පාෂාණ,මැටි එලක , ලෝහ වර්ග, ශාක පත්‍ර වැනි දේ යොදා ගත්හ. නායනයට අධික කාලයක් ගතවන ඉතා ශක්තිමත් පාෂාණ මත ලේඛන කොටන ලද අතර ක්‍රි. පූ. 3 වන සියවසේ දී පමණ මේලෙස පාෂාණ මත සකස් කරන ලද ලේඛන තවමත් සුරක්ෂිත ව පවතී. ලේඛන සකස් කිරීමට පෙර පාෂාණ පදම් කරන ලද ක්‍රමයක් එකල පැවැත්තෝ දැන සිටියහ. තඹ, තඹ මිශ්‍ර ලෝහ (cu alloy) රන් වැනි ලෝහ පත්‍ර මත සකස් කරන ලද ලේඛන තවමත් සුරක්ෂිත ව පවතී. තල්, තල (Borassus Flabellifor Mis. L. Corypha umbraca)

ශාකවල ලපටි පත්‍රවලින් ලේඛන පිළියෙළ කිරීමේ දී ඒවා පරිසර තත්වයන්ගෙන් හා පළිබෝධකයින්ගෙන් ආරක්ෂා කිරීමට නොයෙක් වත් පිළිවෙත් අනුගමනය කළහ. ලන්දේසීන් ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමත් සමඟ ම ලංකාවේ ලේඛන කලාවේ අද්විතීය වෙනසක් සිදු විය. මොවුහු මුද්‍රණ යන්ත්‍රය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්හ. කඩදාසි මත අතින් ලියන ලද මුල් ලියවිල්ල 1668 දී සකස් කළ අතර පසුව මෙරට මුද්‍රණය කරන ලද මුල් ම සිංහල පොත ලෙස 'ලංසි යාඥා පොත' 1737 දී මුද්‍රණය කෙරුණි. මෙලෙස මුද්‍රණ කඩදාසි හඳුන්වා දීමත් සමඟ එකල පැරන්නන් ලේඛන මාධ්‍ය ලෙස භාවිත කරන ලද ද්‍රව්‍ය අභාවයට ගොස් මුද්‍රණද්වාරයෙන් පිටවන ලේඛන සඳහා පුස්තකාලවල වැඩි ඉඩක් ලැබුණි. පසු කාලීන ගුවන් විදුලිය හා රූපවාහිනිය හඳුන්වාදීමත් සමඟ ශ්‍රව්‍ය තැටි පට හා ශ්‍රව්‍ය දෘශ්‍ය පටල ප්‍රචලිත විය. වර්තමානය වන විට පරිගණක ඩිස්කට් හා සංගෘහිත තැටි බහුල ලෙස පුස්තකාලවල හඳුනාගත හැකි පුස්තකාල ද්‍රව්‍ය බවට පත්ව ඇත.

පුස්තකාල ද්‍රව්‍ය කාලයත් සමඟ හායනයට ලක්වීම පුස්තකාල ක්ෂේත්‍රයේ ඇති ප්‍රධාන අභියෝගයකි. ශ්‍රී ලංකාව මුහුදින් වට වූ දිවයිනක් වීමත් සමකයට ආසන්න ව පිහිටා තිබීමත් නිසා අවුරුද්ද මුළුල්ලේ ම අධික සාපේක්ෂ ආර්ද්‍රතාවක් හා ඉහළ උෂ්ණත්වයක් පවතී. එසේම දෛනිකව මෙම පරිසර තත්වවල අධික විචලනයක් ද සිදු වෙයි. උදාහරණයක් ලෙස අවයම කොළඹ ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය 24 $^{\circ}$C පමණ වන අතර සාපේක්ෂ ආර්ද්‍රතාව 90% පමණ වෙයි. නමුත් මධ්‍යහ්න වන විට සාමාන්‍ය උෂ්ණත්වය 32 $^{\circ}$C පමණ වන අතර සාපේක්ෂ ආර්ද්‍රතාව 70 % පමණ වෙයි. සූර්ය කිරණ ශ්‍රී ලංකාවට සෘජු ව පතනය වීම නිසා අල්ට්‍රාවයලට් කිරණ (Ur rays) අවකාශයට ඇතුළු වෙයි. ශ්‍රී ලංකාවට සෘජු ව ආලෝකය පතනය වීම නිසා එහි ආලෝක තීව්‍රතාව ඉහළය. පුස්තකාල ද්‍රව්‍යවලට සාමාන්‍යයෙන් සුදුසු වන්නේ 50 lux ආලෝකයක් බව පෙන්වා දී ඇත. ආලෝකයේ උෂ්ණත්වය ද දෛනිකව ශීඝ්‍ර ලෙස විචලනය වෙයි. උදාහරණයක් ලෙස කොළඹ ප්‍රදේශයේ උදෑසන ආලෝකයේ උෂ්ණත්වය 2800 k ද මධ්‍යහ්න 5500 k ද වන ලෙස විචලනය වෙයි. බාහිර වායු ගෝලයේ

පවතින $CO_2$, $NO_2$, $NO_3$, No, Co වැනි වායුන් ද ලේඛනවල හායනය වැඩි කිරීමට හේතුවක් වී ඇත. ඉහත පරිසර තත්වවල දී ලේඛන මත ශීඝ්‍ර ලෙස දිලීර පුස් වර්ධනය වීමේ ප්‍රවණතාවක් ඇත. එමෙන් ම ලේඛනවලට හානිකරන කෘමීන් ද මෙම තත්ව තුළ හිතකර ලෙස වර්ධනය වෙයි.

පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම හෙවත් එම ද්‍රව්‍යවල ආයුකාලය වැඩි කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් ජාතික පුස්තකාලය 1981 දී ආරම්භ කළේ ය. 1980 දිවයින ට පැමිණි ආචාර්ය පිලිප් පියර්ස් මහතා විසින් ලබා දෙන ලද වාර්තාවක් මීට මූලික විය. මුල් කාලයේ දී සංරක්ෂණ කටයුතු සඳහා ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රවීණ නිලධාරීන්ගේ සහාය ලබා ගත් නමුදු 1982 වන විට සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය ලෙස වෙනම ම අංශයක් පිහිටුවීමට ජාතික පුස්තකාලයට හැකි විය. මුල් යුගයේ පොත් බැඳීම හා පුස්තිකා පෙට්ටි සැදීම පමණක් සිදු කළ මෙම අංශය මේ වන විට සංරක්ෂණ කාර්ය ගණනාවක් සිදු කරන පොත් බැඳුම් හලකින් ද සංරක්ෂිත රසායනාගාරයකින් ද ධූමායන කුටීරයකින් ද යුක්ත වෙයි. පසුගිය දශක 2 ක තුළ ලෝකයේ තාක්ෂණික ක්ෂේත්‍රයේ අති විශාල දියුණුවක් ලබා ඇති බව විද්වත්හු පවසති. එම දියුණුව පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන ක්ෂේත්‍රයට ද බලපා ඇති බව පෙනේ. ලෝකයේ භාවිත කරන දියුණු සෑම සංරක්ෂණ ක්‍රමවේදයක් ම මෙරටට ගැළපේදැයි ප්‍රකාශ කළ නො හැක. නමුත් ශ්‍රී ලංකාවට ගැලපෙන සංරක්ෂණ ක්‍රමවේද දියුණු රටවලින් ලබා ගනිමින් දේශීයව ශ්‍රී ලංකාවට ගැලපෙන සංරක්ෂණ ක්‍රමවේද ගොඩනැඟීම ලේඛන සංරක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු කරන ආයතනවල වගකීමකි. මේ අනුව යමින් ජාතික පුස්තකාලය ද එම ජාතික වගකීමට උරදිය යුතු කාලය එළඹ ඇත.

ශ්‍රී ලංකාව වැනි ඝර්ම කලාපීය රටක ඉහත විස්තර කරන ලද පරිසර තත්ත්වයන්ගෙන් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කර ප්‍රශස්ත පරිසර තත්ත්ව පවත්වන පුස්තකාල ද්‍රව්‍ය සම්පත් [illegible] කරමින් දක්ෂව කටයුත්තකි.

මේ සඳහා පර්ශ්‍රය පූර්ණ ලෙස වායු සමීකරණය කිරීමට සිදුවෙයි. එහිදී පර්ශ්‍රය තුළ නියත පරිසර තත්ත්වයක් පවත්වා ගැනීමට අවශ්‍ය අවස්ථාවල දී පර්ශ්‍රය සිසිල් කිරීමට, උණුසුම් කිරීමට වායු ගෝලීය ජල වාෂ්ප ප්‍රමාණය වැඩි කිරීමට හා අඩු කිරීමට අවශ්‍ය උපකරණ වායු සමීකරණ පද්ධතිය සමඟ සම්බන්ධ කළ යුතුයි. (Heating, Cooling & humidifying/dehumidifying) පරිසර උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාව අතර නිරන්තර සබඳතාවක් ඇත. උෂ්ණත්වය පුස්තකාල ද්‍රව්‍යවලට හිතකර ලෙස අඩු කිරීමට යාමෙන් සාපේක්ෂ ආර්ද්‍රතාව ඉහළ ගොස් ලේඛනවලට අහිතකර තත්ත්වයක් උදා වෙයි. එහෙයින් උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාව සමගාමී ව වෙන වෙන ම පාලනය කළ යුතු වෙයි. ඇමරිකාවේ කොන්ග්‍රස් පුස්තකාලයෙහි ඩොනල්ඩ් සීබර් (Donald Seber) මහතා කරන ලද පරීක්ෂණයකින් පෙන්වා දෙන්නේ උෂ්ණත්වය 57 F° හා සාපේක්ෂ ආර්ද්‍රතාව 50% තත්ව යටතේ ලේඛන කිසිදු හායනයකින් තොරව වසර 100 ක් තබා ගත හැකි බවයි. ලේඛන සංරක්ෂණයේ දී පරිසර තත්වපාලනය කරන පද්ධතියක අවශ්‍යතාව ඉතා වැදගත් ය. පරිසර තත්ව පාලනය කිරීමත් දෛනික පරිසර තත්ව වාර්තාගත කිරීමත් ලේඛන සංරක්ෂණයේ දී ඉතා වැදගත් වෙයි. (Climate monitoring) විශේෂ අවස්ථාවල දේශගුණික තත්ව වාර්තාකරන උපකරණ (Snap shot monitoring devices) හා අඛණ්ඩව දේශගුණික තත්ව වාර්තාකරණ උපකරණ (continuous monitoring devices) ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණයේ දී ඉතා ම වැදගත් වෙයි. වායු සමීකරණ පද්ධති ක්‍රමානුකූල ව ක්‍රියාත්මක වන්නේ ද සොයා බැලීමටත් අවශ්‍ය ලෙස පරිසර තත්ව වෙනස් කිරීමත්, ලේඛන සංරක්ෂණය ගැන අධ්‍යයනයටත් මෙමඟින් ලබා ගන්නා දත්ත මහෝපකාරී වෙයි.

සංරක්ෂණයේ දී වාර්තාගතකරණය (documentation) ඉතා වැදගත් අංගයකි. සංරක්ෂණයට පෙර පුස්තකාල ද්‍රව්‍යවල හායනත්වය වාර්තාගත කළ යුතු ය. එහි දී එය භෞතික ව හා රසායනික ලෙස හායනයට ලක්ව ඇති ආකාරය දිලීර හා කෘමීන්ගේ බලපෑම් වාර්තාගත කළ යුතු අතර ලේඛනයක් නම් එහි ph අගය (ph- $\log_{10}$ [H ] වැනි

දත්ත ඉතා ම වැදගත්ය. සංරක්ෂණයට පෙර සංරක්ෂණය අනතුරු හා සංරක්ෂණයෙන් පසු ලිඛිත හා ඡායාරූපමය වාර්තාගතකරණය සිදු කළ යුතු අතර සංරක්ෂණයෙන් පසු යොදන ලද ප්‍රතිකර්ම භාවිත කරන ලද රසායනික ද්‍රව්‍ය සංරක්ෂණයේ දී මුහුණදුන් ගැටළු ආදිය ක්‍රමානුකූල ව වාර්තාගත කිරීම සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ පසු විපරම් කිරීමේ දී ඉතා වැදගත් වෙයි. නව අත්හදා බැලීම් සිදුකර නව සංරක්ෂණ ක්‍රමවේද සොයා ගැනීමටත් නුසුදුසු සංරක්ෂණ ක්‍රමවේද බැහැර කිරීමටත් සංරක්ෂකයාට මෙයින් හැකි වෙයි. මෙලෙස වාර්තාගත කරන දත්ත, දත්ත පදනමට එක් කිරීම ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණයේ දී ඉතා වැදගත් වෙයි.

ජාතික පුස්තකාලය එහි පනතින් සඳහන් වන පරිදි පර්යේෂණ පුස්තකාලයක් විය යුතු ය. පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ සියලු ම පර්යේෂණ මෙහි සිදු කළ යුතුයි. සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණයට අදාළ සියලු ම පර්යේෂණ සිදු කළ යුතුයි. එහි දී ලබා ගන්නා නව දැනුම ලෝකයේ අනෙකුත් පුස්තකාල හා ශ්‍රී ලංකාවේ පුස්තකාල සමඟ හුවමාරුකර ගත යුතුයි. මෙහි දී පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය පසුබිම ගොඩනැගිය යුතුයි. පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය මූලික උපකරණ සහිත පර්යේෂණ රසායනාගාරයක් ජාතික පුස්තකාලයට අත්‍යවශ්‍ය දෙයකි. පුස්තකාල ද්‍රව්‍ය හා සම්බන්ධ සංරක්ෂණ රසායන විද්‍යාව ඔස්සේ සිදු කරන පර්යේෂණවලට නොයෙක් රසායන ද්‍රව්‍ය, කිරුම් මිනුම් උපකරණ පරීක්ෂණ නල, පිපෙට්ටු, බියුරෙට්ටු, මිනුම් සරා වැනි උපකරණවල සිට නවීන ඉලෙක්ට්‍රෝනික උපකරණ දක්වා අවශ්‍ය උපකරණ ද ලේඛන සංරක්ෂණය සම්බන්ධ ජෛවීය විද්‍යාත්මක පර්යේෂණ සඳහා ඉහළ විභේදන බලයක් සහිත අන්වීක්ෂ ක්ෂුද්‍ර ජීවීන් වගාකිරීමට ඒ හා සම්බන්ධ පරීක්ෂණ කිරීමට අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍යය ද සංරක්ෂණ භෞතික විද්‍යාව ඔස්සේ කරන පරීක්ෂණවල දී පීඩනය ආර්ද්‍රතාව, ආලෝක තීව්‍රතාව, උෂ්ණත්වය ආදි භෞතික අගයන් ලබා ගැනීමට අවශ්‍ය උපකරණ අවම වශයෙන් සංරක්ෂණ රසායනාගාරයක් තුළ තිබිය යුතු ය. මෙලෙස පර්යේෂණ කටයුතුවල දී ලබා ගන්නා

දත්ත, විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම් සඳහා පරිගණක වැඩසටහන් සම්පාදනය කර ඇත. එවැනි පරිගණක වැඩසටහන් කිහිපයක් ද රසායනාගාරයකට අත්‍යවශ්‍ය වේ.

ජාතික එකතුව සංරක්ෂණය කිරීමේ දී පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ ප්‍රමිතියක් ගොඩනැඟීම ඉතා ම වැදගත් කාර්යභාරයකි. මේ සඳහා ජාතික පුස්තකාලයත් ලේඛන සංරක්ෂණ කටයුතුවල ප්‍රධාන වශයෙන් නියැලී සිටින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවත් එක්ව ක්‍රියාකළ යුතුවේයි. වෙළඳ පොළේ එක ම රසායන ද්‍රව්‍ය විවිධ ශ්‍රේණිවලින් ඇත. එසේ ම ගම් වර්ග රෙක්සින්, ලෙදර්මරට් වැනි අමුද්‍රව්‍ය ද විවිධ මිල ගණන් යටතේ වෙනස් ප්‍රමිතීන්ට සකස් කර ඇත. මේවා අතුරින් ලේඛන සංරක්ෂණයට වඩාත් සුදුසු ද්‍රව්‍ය හඳුනා ගැනීමත් එමඟින් සුදුසු ප්‍රමිති ගොඩනැඟීමත් මඟින් ගුණාත්මක තත්වයෙන් උසස් සංරක්ෂණ කාර්යයක් ඉටු කිරීමට හැකියාව ලැබෙයි.

ලේඛන සංඛ්‍යාංකගත කිරීම (digitization) වර්තමානයේ දී ලේඛන සංරක්ෂණ ක්‍රමවේදයක් ලෙස භාවිත කෙරේ. මෙලෙස සංඛ්‍යාංකගත කිරීමට භාවිත කරන ලද මුල්පිටපත සුරක්ෂිත ව ආරක්ෂාකර තැබිය හැකි අතර සංඛ්‍යාංකගත තොරතුරු වෙත පාඨකයාට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකියාව ඇත. එමඟින් ලේඛන හානිවීමේ ශීඝ්‍රතාව අවම වෙයි. මේ සඳහා සුදුසු ස්කෑනර් යන්ත්‍ර හා අංකිත කැමරා භාවිත කෙරෙන අතර සංඛ්‍යාංක ආකෘති ලෙස PDF,TIFF, GIF ආදිය තෝරා ගැනීමත් ඊට ගැලපෙන මෘදුකාංග තෝරා ගැනීමත් ලේඛන සංරක්ෂකයෙකුගේ වගකීම වෙයි. තාක්ෂණයේ දියුණුවත් සමඟ මෘදුකාංග කාලයෙන් කාලයට වෙනස් වීමත් භාවිත කරන ලද ආකෘතිවල පවතින සමහර ගැටළු ද මෙම ක්‍රමවේදයේ හඳුනාගත හැකි මූලික තාක්ෂණික ගැටලු වෙයි. ලේඛන සංඛ්‍යාංකගත කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ, දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමට ඉහළ වියදමක් දැරිය යුතු වුව ද ජාතික එකතුව සංරක්ෂණයේ දී ලේඛන සංඛ්‍යාංකගත කිරීම ප්‍රායෝගිකව ඉතා වැදගත් වේ.

දිනෙන් දින ම ජාතික පුස්තකාලයට ලේඛන විශාල ප්‍රමාණයක් එකතු වෙයි. සංරක්ෂණය සඳහා රසායනාගාරයට ලැබෙන ලේඛන ප්‍රමාණය ද දිනෙන් දින ඉහළ යයි. නමුත් සංරක්ෂණ ක්‍රියාවලියේ නිරත වන සේවක පිරිසෙහි ප්‍රමාණයෙහි වෙනසක් සිදු නො වෙයි. මෙවැනි පසුබිමක් තුළ සංරක්ෂණ කර්තව්‍යය යහ අයුරින් පවත්වාගෙන යාම සඳහා ලේඛන සංරක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ අගයකට ගෙනායුතු වෙයි. ඒ සඳහා නවීන උපකරණ භාවිතයට ගැනීම හිතකර වෙයි. ලේඛන සංරක්ෂකයෙකුට ලේඛනයක් මත වූ සිදුරු සාම්ප්‍රදායික ව පුරවා සංරක්ෂණය කිරීමට පැය ගණනක් දින ගණනක් ගත විය හැකි නමුත් එවැනි සංරක්ෂණ කාර්යයන් සඳහා භාවිත කරන නවීන උපකරණ භාවිත කිරීමෙන් බිඳෙනසුලු ලෙස හානියට පත් නොවූ ලේඛනයක මෙම කාර්ය මිනිත්තු ගණනාවකින් ගුණාත්මක බවට හානියක් නො වන ලෙස සිදුකළ හැක. උදා:- Leaf casting machine ලේඛන මත පැල්ලම් පහසුවෙන් ඉවත් කර ගැනීමට suction table වැනි උපකරණ ද ලේඛන භෞතික ලෙස පිරිසිදු කිරීමට HEPA වර්ගයේ පෙරණ යෙදෙන වැකුම් ක්ලීනර් වැනි උපකරණ ද සංරක්ෂණ කාර්ය අතරතුර දී ලේඛන පහසුවෙන් වියලා ගැනීමට විදුලි වියලන (electric dryers, dececators) වැනි නවීන උපකරණ ද භාවිත කිරීම මඟින් ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු ව ජාතික එකතුව සංරක්ෂණය කිරීමට අවකාශ සැලසෙයි.

ජාතික එකතුව සංරක්ෂණයේ දී හදිසි ආපදාවකින් ඊට සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව විමසා බැලිය යුතු ය. හදිසි ගිනි ගැනීම්, ජල ගැලීම් අකුණු සැර වැදීම් මඟින් ජාතික එකතුවට විශාල හානියක් සිදුවිය හැක. මෙවැනි ආපදාවන් සිදුවීම අවම කිරීම් සඳහා ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම. ආපදාවක් සිදු වූ විට එය සාර්ථක ලෙස පාලනය කිරීමට ක්‍රමවත් සැලසුමක් තිබීම ආපදාවකට ලක් වූ ලේඛන පිළිසකර කිරීමට සැලසුම් කරන ලද වැඩසටහනක් තිබීම වැනි අංශවලින් යුත් ක්‍රමවේද ය සකස් කරන ලද ආපදා කළමනාකරණ සැලැස්මක් ජාතික එකතුව සංරක්ෂණයේ දී අත්‍යවශ්‍ය ය. මෙවැනි සැලැස්මක් ජාතික පුස්තකාලය සතු ප්‍රධාන ද එහි කාර්යමණ්ඩලය ප්‍රමුඛ දැනුම

තත්වයට පත් කළ යුතුවෙයි.

ගිනි අනතුරු දැන්වීමේ පද්ධතියක් (Fire alarm system) ජාතික පුස්තකාලය සතු වෙයි. එය smoke/heat, detectors, Break glass unit, Audible signaling, main firealarm යන අංගවලින් යුක්ත වෙයි. ගිනි ආරක්ෂක පද්ධතිය (Fire protection system) කාබන්ඩයොක්සයිඩ් වායුව, පෙණ, වියලි කුඩු හා ජලයෙන් යුත් සිලින්ඩරවලින් යුක්ත වෙයි. (Portable fire extinguishers) මින් දැවි ගින්නක් පාලනය කළ නො හැක. කාබන්ඩයොක්සයිඩ්, ජලය ලේඛන හායන කාරක වෙයි. එම ද්‍රව්‍ය ගිනි නිවීමට යොදා ගැනීම හිතකර නො වෙයි. කාබන්ඩයොක්සයිඩ් වායුවට හා ජලයට ලක් වූ ලේඛන සංරක්ෂණ ක්‍රමවේද මහින් තහවුරු කර ගත හැක. නමුත් ගින්නෙන් ඔක්සිකරණය වූ ලේඛන නැවත සංරක්ෂණය කළ නො හැක. ගින්නට හසුවී ලේඛන සම්පූර්ණයෙන් ම විනාශ වනවාට වඩා ජලය ඉසීමෙන් එම ලේඛන ගිනි ගැනීම වළක්වා ජලය මහින් ඇති වූ හානියට සුදුසු සංරක්ෂණ ක්‍රමවේද සිදු කිරීම ඵලදායි වෙයි. හැලොන් පද්ධතිය (Halon system) පුස්තකාලවල ගිනි නිවීම සඳහා හිතකර පද්ධතියකි. නමුත් වායුගෝලයේ හරිතාගාර ආවරණය (green house effect) ඇතිවීම කෙරෙහි මෙම වායුවල බලපෑමක් ඇති බැවින් හැලජන කාණ්ඩයේ වායුන්ගෙන් සමන්විත මෙම ගිනි නිවන පද්ධති භාවිත කිරීම අවම වී ඇත. එසේම Fire house Reel systems, Automatic sprinklet Systems, Wet Chemical Systems වැනි පද්ධති ස්ථාපිත කිරීම ජාතික එකතුව හදිසි ගින්නකින් ආරක්ෂා කිරීමට හේතු වෙයි. මෙලෙස හදිසි ආපදාවට භාජනය වූ ලේඛන සංරක්ෂණය කිරීමට අවශ්‍ය උපකරණ විදුලි වියලන, ශීත කාමර, ධූමායන කුටීර, ශීතකර වියලන ක්‍රමවේද (Freeze dried method) ආදිය ඇති කිරීම ජාතික එකතුව සංරක්ෂණයේ දී ඉතාම වැදගත් වෙයි.

දැනුම් සයුරක් බඳු වූ ජාතික එකතුව සුරක්ෂිත ව අනාගත පරපුරට උරුමකර දීමට මෙලෙස සුදුසු සංරක්ෂණ ක්‍රමවේද ඇති කිරීම අපගේ පරම සුභ කාමනාවයි.

ආශ්‍රිත ග්‍රන්ථ :


1. අමරසිරි, ජී.ඩී., පුස්තකාල සංඛ්‍යාංකකරණය, කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය - 2008

2. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පාලන වාර්තා 1985 - 1992 තෙක්

3. විමලරත්න, කේ.ඩී.ජී., 1987 පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය : කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

4. වීරසිංහ ඩබ්.කේ.එම්. එම්.කේ., 2001, පුස්තකාල ඉතිහාසය, කොළඹ :කර්තෘ ප්‍රකාශනයකි.

5. Agrawall, O.P. 1997, Preservation of art objects & Library materials ; National book Trust, India

6. Butter worth, Heine mann, 2001, Building Services hand book,

7. Medlicott, Andrew, 1997, Digitization as a method of preservation , European Commission on preservation and access,

8. Preservation Technology ; 1989, The British Library London

9. Wettasinghe, Saroja, 1988, Conservation & preservation of paper records; The department of National Archives : Colombo -

10. http.www. Nedcc.org/resources

11. http.www.library. cornell.edu/preservation

# ප්‍රඥාවේ මහා මන්දිරය : ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

නුවරඑළියේ හේමපාල

මිනිසා සිතීමට පෙළඹුණු දා පටන් ඔහු සතු ඥාන සම්භාරය ලේඛන ගත වී සංරක්ෂණය කරනු ලැබුවේ පොත්ගුල හෙවත් පුස්තකාලය මගිනි.

එලෙස සංරක්ෂණය වූ පොතපත තුළින් ලැබෙන අනුභූතිය "පොතක මහිම මගින් මැක්සිම් ගෝර්කි හෙළිදරව් කළේ මෙසේය.

" මගේ අතට පොතක් පත්වූ විට ජීවමාන දෙයක් ආශ්චර්යමත් දෙයක් මගේ අතට මගේ ජීවිතයට ඇතුළුවූවාක් මෙන් දැනෙයි.

මේ ලෝකයේ ඇත්තා වූ හැම දෙයකටම වඩා සංකීර්ණ වූ, අද්භූත වූ, ආශ්චර්ය හා සුන්දරත්වය විසින් පොළඹවන ලදුව, හැම දෙයක්ම තම ශ්‍රමයෙන් හා කල්පනා ශක්තියෙන් නිර්මාණය කරන ලද මිනිසා විසින් ම මිනිසා වෙනුවෙන් මිනිසා ගැන ලියන ලද අලුත් තෙස්තමේන්තුවක් වැන්න "

මෙවැනි ශාස්ත්‍රමය හැඟීම්වලට තුඩු දෙමින් නව නවත් දැනුම ප්‍රඥප්ත කරවන, තමන් අප්ට ඇති ජීව අජීව ලෝකයෙහි යථාර්ථය හඳුන්වා දෙන, විශ්ව සම්භාව්‍ය ජන සමාජයක් හා සබැඳි මත මෙන්ම විෂයයන් හෙළිදරව් කරන පොතපත සදාතනිකව සමාජයේ බුද්ධිමය පෙරගමන් කරුවා වෙයි.

මෙවන් මෙවලමක අගය දිදුලමින් විදහාපාන අයුරින් ඒකරාශී කිරීම, සංරක්ෂණය කිරීම හා පරිශීලනයට පාත්‍ර කිරීම හා විවිධ පැතිකඩ වලින් ගවේෂණ සේවා සැපයුම මිනිසාගේ බුද්ධිය ව්‍යුත්පත්තිය සඳහා වෙයි. මෙම සුවිසල් වගකීම්භාරය හා කාර්යභාරය ක්‍රියාශීලී ලෙස සැපයෙන්නේ පුස්තකාලය මගිනි.

මේ අනුව දැනුම් මිනුම් පුළුල් වූ විශ්වයේ මුළු දැනුම් සම්භාරය රටේ බුද්ධිමය ප්‍රජාවගේ ප්‍රගමනය සඳහා එක්තැන් කොට සැපයෙන්නේ ප්‍රධාන වශයෙන් රටක ජාතික පුස්තකාලයෙනැයි අමුතුවෙන් කිවයුතු නොවේ.

හුදු තොරතුරු සැපයීමේ සිට අධ්‍යාපන හා පර්යේෂණ සඳහා බැඳුණු ගවේෂණ සේවා සඳහා අත්වැල් සැපයෙන්නේ ජාතික පුස්තකාලයෙනි. ඒ අනුව සැකවින් දක්වතොත් ප්‍රාථමික ද්විතියික හා තෘතියික වශයෙන් තොරතුරු මූලාශ්‍ර සූක්ෂම ලෙස එක්රැස් කෙරෙන්නේ පිළිගත් විද්වත් මූලධර්ම හා ප්‍රමිති අනුසාරයෙනි.

ඒ සඳහා විශේෂයෙන් සියරට හා ඒ හා සබැඳි විදෙස් පාඨ ග්‍රන්ථ, වාර සඟරා, පුවත්පත්, විශ්වකෝෂ හා විවිධ අත්පොත් පාදක කොටගත් විවිධ සූචි වර්ග හා නාමාවලීන් යනාදී ප්‍රලේඛන හා විඥාපන සේවා පාඨක අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් සැකසෙන්නේ සූක්ෂම අන්දමිනි. එසේ සැකසී ඇති පාඨක ගවේෂණ ක්‍රියාවලිය සඳහා විෂයය විවිධත්වය පිළිබිඹු කැරෙන මූලාශ්‍ර මෙසේ සුසැදී ඇත:-

1. ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ එකතුව
2. පුවත්පත් එකතුව
3. වාර සඟරා එකතුව
4. ප්‍රධාන ශ්‍රී ලංකා එකතුව
5. නීත්‍යානුකූල තැන්පත් එකතුව
6. විදේශීය ග්‍රන්ථ එකතුව
7. යුනෙස්කෝ ප්‍රකාශන එකතුව

8. පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව
9. දුර්ලභ විශේෂ එකතුන්
10. ජන සාහිත්‍ය එකතුන්

ඉහත සඳහන් වන දුර්ලභ හා විශේෂ එකතුන් පිළිබඳ ග්‍රන්ථ සමූහය අතරට මෙරට සිටි ප්‍රවීණ විද්වතුන්ගේ පහත සඳහන් පුද්ගලික පුස්තකාල ද පරිත්‍යාග වශයෙන් ආබද්ධ කර ගනු ලැබීම වාසනාවකි. ඒවා නම් :-

මාර්ටින් වික්‍රමසිංහ ග්‍රන්ථ එකතුව
මහාචාර්ය ටිකිරි අබේසිංහ ග්‍රන්ථ එකතුව
ආචාර්ය පුංචිබණ්ඩා සන්නස්ගල ග්‍රන්ථ එකතුව
මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි ග්‍රන්ථ එකතුව
ආචාර්ය එම්.එච්. පීටර් සිල්වා ග්‍රන්ථ එකතුව
වෛද්‍ය ඊ.එම්. විජේරාම ග්‍රන්ථ එකතුව
තේජා ගුණවර්ධන ග්‍රන්ථ එකතුව

මේ අතුරෙන් පොත් 5000 කට ආසන්න මාර්ටින් වික්‍රමසිංහ පුස්තකාලය කේන්ද්‍ර ගත කොට නිමැවුණු ජන ජීවිතය හා ලේඛන කලාගාරය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට පිවිසෙන විද්‍යාර්ථීන්ට මෙන්ම පාසැල් ළමුන්ට ද ලබා දෙන්නේ කදිම අත්දැකීමකි.

මේවා අතර නූතන ලෝකයේ ගවේෂණ හා විමර්ශන සේවා පුළුල් කෙරෙමින් පෙරට පැමිණි පරිගණක භාවිතය උපයෝගී කොටගත් තත් කාර්යයන් ද මධ්‍යගත කෙරෙන්නේ විෂයය පිළිබඳ පරිපූර්ණත්වයේ කාර්ය සාඵල්‍යතාවයන් පිරපුන් ගන්වමින් මුළු මහත් ජාතියම ප්‍රඥා සම්පන්න කිරීමේ ඒකායන අධිෂ්ඨානයෙනි.

# ලේඛක වතගොත

1. ඩබ්. කේ.එම්.එම්. කේ. වීරසිංහ
බී.ඒ. (ගෞරව) (කැලණිය) එම්.එල්.අයි. එස්. ( ) එම්. පීල්
(බෙල්ජියම) ගරු සාමාජික අධ්‍යක්ෂ ජනරාල් - ජාතික
පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

2. මහාචාර්ය ජයසිරි ලංකාගේ
බී.ඒ. (ගෞරව) , පී.එච්.ඩී. (කැලණිය) ගරු සාමාජික
(ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) හිටපු අංශ ප්‍රධාන
පුස්තකාල හා විද්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය හා
පුස්තකාලයාධිකාරි කැලණිය විශ්වවිද්‍යාලය.

3. එම්. ඒ. නාලිනි
බී.ඒ. (කැලණිය) එම්.එල්.එස්. (කොළඹ) ආ ශ්‍රේණිය
සාමාජික ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, අධ්‍යක්ෂ -
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

4. ආචාර්ය කේ.ඩී.ජ්. විමලරත්න
බී.ඒ. (ගෞරව) (ලංකා) අධිලේඛන සංරක්ෂණ සහ
කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (පැඩුවා)
ඉතාලිය) පී.එච්.ඩී. (විද්‍යා ඇකඩමිය - පිලඩෙල්ෆියා)
හිටපු අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

5. ඩබ්ලිව්. සුනිල්
බී.ඒ. (විශේෂ) (කොළඹ) එම්.ඒ. (බෞද්ධ හා පාලි) එම්.එල්.
අයි.එස්. (මැලේසියා) නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජාතික පුස්තකාල
හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

6. ඒ.ඩී. අමරසිරි
බී.ඒ. (විශේෂ) (පේරා). එම්.එල්.එස්. (කොළඹ) අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

7. විජය ප්‍රේමදර්ශන
බී.ඒ. (ජ.පුර.) එම්.ඒ. (බෞද්ධ හා පාළි) ඩිප්ලෝමා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, පුස්තකාල සංවර්ධන සහකාර - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

8. ටී. ශිධරන්
බී.ඒ. (යාපනය), එම්.එස්.සී (මද්‍රාසිය), ආ ශ්‍රේ ය
සාමාජික ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ.) - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

9. සේනානි දීපිකා බණ්ඩාර
බී.ඒ. (විශේෂ) (පේරාදෙණිය) එම්.එස්. එස්.සී. (කැලණිය)
පුස්තකාලයාධිපති - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

10. චන්දිමා වාදසිංහ
බී.ඒ. (විශේෂ) (කොළඹ), එම්.ඒ. (විශේෂ) (කොළඹ) එම්.එස්.එස්.සී. (කැලණිය) - සහකාර පුස්තකාලයාධිපති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

11. උදය ප්‍රසාද් කබ්රාල්
බී.ඒ. (ජ.පුර) ඩිප්ලෝමා - පුරාවිද්‍යාව (කැලණිය), ලේඛන සංරක්ෂණ පාඨමාලාව (මොරටුව) ලේඛන සංරක්ෂක ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

12. නුවරඑළියේ හේමපාල
නියෝජ්‍ය අධ්‍යක්ෂ - කොග්ගල ජන කෞතුකාගාරය
නිවුපු ප්‍රධාන නාමාවලි සංස්කාරක - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

# ජාතික පුස්තකාල සතිය - සමරු කලාපය
# සම්පාදක කමිටුව

ජේ.ඩී. අමරසිරි මහතා

විජය ප්‍රේමදර්ශන මහතා

කුසුම් ඒකනායක මහත්මිය

ඉන්දික නිශාන්ත මහතා

අශෝකා දමයන්ති මහත්මිය

## සම්පාදන සහාය

ඩබ්. සුනිල් මහතා

රුවිනි දිල්රුක්ෂි මෙනවිය

BN 978-955-8383-50-6

මිල රු. 200.00

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*